# සමගියයි ප්‍රගතියයි



BKT 0148
26/08/2023
-10-1998
ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



# සමගියයි
# ප්‍රගතියයි

ගරු අග්‍රාමාත්‍ය තුමාගේ
යාපනයේ නිල සංචාරයේදී කරන ලද
කතා කිහිපයක එකතුවකි.

(1981. 01. 29 සිට 1981. 02. 01)

සංස්කරණය: ක්‍රිස්ටි කුරේ

2 — ඊ 56627—2,000 (81/07)

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



-10-1998

# යාපනේ මහාලේකම් කාර්යාලයේදී පවත්වන ලද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී අග්‍රාමාත්‍ය ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමන් විසින් පවත්වන ලද කථාව

1981 ජනවාරි 29

පළමුකොටම මා ඔබහැමට ස්තුති කිරීමට සතුටුයි, මෙම ඉතා වැදගත් සාකච්ඡා සභාව පවත්වාගෙන යාමට මට ඔබගෙන් ලැබුණු සහයෝගය ගැන. යාපනය දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මෙම සාකච්ඡා සභාව ගැන මීට මාස කිපයකටම කලින් දන්වා මෙහි න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූවා. ඒ අනුව එම ගරු මන්ත්‍රීවරුන් කරුණු ඉදිරිපත් කළා. මගේ නිලධාරීන් ගරු දිස්ත්‍රික් අමාත්‍යතුමාගේත් අදාළ අනිකුත් අමාත්‍යවරුන්ගේත් උපදෙස් ලබා ගනිමින් මෙම කරුණු පරීක්ෂා කොට බලා තිබෙනවා. ඒවා අපගේ අත්දැකීම් පදනම් කරගෙන මෙසේ සාකච්ඡා කිරීමට හැකිවීම ගැන මා සන්තෝෂ වෙනවා. එසේම එම ගරු මන්ත්‍රීවරුන් විසින් මෙම යෝජනා යහපත් චේතනාවෙන් යුතුව ඉදිරිපත් කරනු ලැබුවාසේම ඒවා අවංකව ක්‍රියාත්මක කිරීමට විධායක නිලධාරීන්ට, පරිපාලන තන්ත්‍රයට මෙම සාකච්ඡා බොහෝ සෙයින් උපකාර වෙනවා.

මා අග්‍රාමාත්‍යවරයා ලෙසට පත්වීමෙන් පසු දිස්ත්‍රික්ක දහ හතරක පමණ දැනට සංචාරය කර තිබෙනවා. එම දිස්ත්‍රික්කවල රජය විසින් අරඹා තිබෙන යෝජනා ක්‍රමවල වැඩ කටයුතු සම්බන්ධීකරණය කිරීමට මෙන්ම නොයෙක් නොයෙක් අමාත්‍යාංශවලින් අරඹා තිබෙන ව්‍යාපෘති වල ප්‍රගතිය සියැසින්ම දැකබලා ගැනීමටයි අද මා මෙහි පැමිණ සිටින්නේ. ඇත්තෙන්ම මා පැමිණ සිටින්නේ කථා කිරීමට නොවෙයි. මා මෙහි පැමිණ සිටින්නේ වැඩිකොටම දැකබලා ගැනීමට සහ ඇහුම්කන් දීමටයි. අද මෙම වැඩ සටහනට සහභාගිවීමට මා සමග පැමිණ සිටින ගරු අමාත්‍යවරුන්ට, දිස්ත්‍රික් අමාත්‍යවරුන්ට, නියෝජ්‍ය අමාත්‍යවරුන්ට හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මා බොහොම ස්තුතිවන්ත වෙනවා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මෙම ප්‍රදේශයේ වැඩ කටයුතු ගැන දක්වන උනන්දුව කොතරම්ද යන්න මේ කරුණෙන් වුවද පැහැදිලි වන බව කියන්නට සතුටුයි. ඇත්ත-වශයෙන්ම අද උදෑසන මෙම ගමන පිටත්ව ඒමට කලින් ගරු ජනාධිපති උතුමාණන් මගෙන් ඉල්ලා සිටියා එතුමාගේ සුභ පැතුම් යාපනය

දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා මහජනතාවට පිරිනමන ලෙසටත්, එමෙන්ම මෙම දිස්ත්‍රික්කය තවදුරටත් සංවර්ධනය කොට එහි ජනතාවගේ ජීවන තත්ත්වය නැංවීමට එතුමාගේ රජය උපරිම වශයෙන්ම ක්‍රියාකරන බව ඔබ සැමට සහතික කොට ප්‍රකාශ කරන ලෙසටත්. එහෙයින් එතුමන්ගේ සුභ පැතුම් මෙ අවස්ථාවෙ ඔබ වෙත පිරිනමා සිටිනවා.

මා හැම විටෙකම කියන පරිදි ඔබට කියන්නට සතුටුයි එක්සත් ජාතික පක්ෂ රජය ක්‍රියා කරන්නේ රටෙ යම් යම් ප්‍රදේශ පමණක් සංවර්ධනය කිරීමට නොව මුළු රට සමස්තයක් වශයෙන් සංවර්ධනය කිරීමට බව. සංවර්ධනය ඇති කිරීමත්, නිෂ්පාදනය වැඩි කිරීමත් යන අපගේ ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීම සඳහා මහජන නියෝජිතයින්ගේ සහයෝගය අපට වුවමනා කරනවා. මෙරට දියුණු කිරීමට නම් අප අවධාරණය කළයුතු දෙඅංශයක් තිබෙනවා. එනම් සංවර්ධනය සහ නිෂ්පාදනයයි. මෙම අරමුණු ඉටුකර ගැනීමට අප අතර සමගිය තිබෙන්නට ඕන. අප අතර විනය තිබෙන්නට ඕන. වෙහෙස මහන්සියෙන් වැඩ කිරීමට අපගේ ලොකු උනන්දුවක් තිබෙන්නට ඕන. අනිකුත් සියළුම රටවල් මෙන්ම අපගේ රටත් දැන් දුෂ්කර අවධියක් පසුකරමින් ඉන්නේ. එනිසා අප මෙ අවශ්‍යතා තුන ගැන ඉතා සැළකිලිමත් වන්නට ඕන. නමුත් යම් යම් යථාර්ථයන්ට අපට මූන දෙන්නට සිදුවී තිබෙනවා. සමගිව හා විනයෙන් යුක්තව ක්‍රියා කිරීමෙනුත්, වෙහෙස මහන්සිවී වැඩ කිරීමෙනුත්, අපට මූන පාන්නට වී තිබෙන අභියෝගයට සාර්ථකව මුහුණදිය හැකිවනු මාහට නිසැකයි. නොයෙක් කථිකයින් විසින් මාහට කරන ලද ප්‍රශංසා නිසා මා තුළ ගැඹුරු හැඟීමක් ඇතිවුනා. ගරු විපක්ෂනායකතුමා මා ගැන කී දෑ ගැන මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා කථා කළේ යාපන දිස්ත්‍රික්කයේ සිය සහෝදර මන්ත්‍රීවරුනුත් වෙනුවෙන් බව මා දන්නවා. අග්‍රාමාත්‍යවරයා ලෙසටත්, මා යටතේ තිබෙන අමාත්‍යාංශ දෙක භාර අමාත්‍යවරයා ලෙසටත් ක්‍රියා කිරීමෙදී මට හැම අංශයකින්ම සම්පූර්ණ සහයෝගය ලැබී තිබෙනවා. මේ දින කීපය තුළ මෙම සංචාරයට සම්බන්ධ මගේ වැඩ සටහන සිරුවෙන් ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙසට මගේ නිලධාරීන් මෙන්ම අනිකුත් අමාත්‍යාංශවල නිලධාරීනුත් මනා ලෙසට අවශ්‍ය විධිවිධාන යොදා තිබෙනවා. මෙම සංචාරය සඳහා අවශ්‍ය හැම දෙයක්ම කිරීමට ඔවුන් ඉතා මහන්සියෙන් හා උනන්දුවෙන් ක්‍රියාකරන ලද බව මා දන්නවා.

අපගේ ජනාධිපතිතුමා හෝ අග්‍රාමාත්‍යවරයා හෝ අමාත්‍යවරයකු හෝ කිසියම් ප්‍රදේශයක සංචාරයක් සඳහා පැමිණෙන විට අපේ ගරු විපක්ෂ නායකතුමා කී පරිදි එහි හොඳ අතට හදිසි පරිවර්තනයක් සිදුවීම අපට බලාපොරොත්තු වන්නට පුළුවන්. මෙම සංචාරය සඳහා විශාල පූර්ව සූදානමක් කරන ලද බව මට දැන ගන්නට ලැබුනා. එම කටයුත්තම හොඳ

දෙයක්. දිගුකලක සිට වැඩ කටයුතු අතපසුවී තිබෙන බව ඔබ දන්නවා. මෙවැනි දේවල් අපගේ ගෙවල් දොරවල්වලත් සිදුවෙනවා. අප ගෙවල්වල හුණු ගාගන්නේ යම් උත්සව අවස්ථාවක් පැමිණෙන විට පමණයි. එය විවාහ මංගල්‍ය අවස්ථාවක් හෝ වෙනත් එබඳු දෙයක් වෙන්නට පුළුවන්. ඉතින් මෙබඳු දේවල් සිදුවීම ස්වභාවිකයි. ඔබ මට ආරාධනා කරනවා නම් සතියක් ඇර සතියක් මෙම දිස්ත්‍රික්කයට පැමිණෙන්නට කියා, එසේ කරන්නටත් මා සතුටුයි, එයින් ඔබට යහපතක් සිදුවෙනවා නම්.

ගරු විපක්ෂ නායකතුමා සඳහන් කළ පරිදි ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ වෙසෙන අප අතර නොයෙක් අදහස් උදහස් තිබෙනවා. අප විවිධ ප්‍රතිපත්ති වල පිහිටා සිටිනවා. එය එසේම විය යුතුයි. අප මහජනයාගේ පරමාධිපත්‍යයට ගරුකරනවා නම්, අප මහජනයාගේ ස්වාධීනත්වයට ගරු කරනවා නම්, ඔවුන්ට ඕනෑම ක්‍රමයක් තෝරා ගැනීමට හැකිවන ලෙසට සමාජයේ විවිධ අදහස් හා ප්‍රතිපත්ති පවතින්නට අප ඉඩ දෙන්නට ඕන. මහජනයාගේ මූලික අයිතිවාසිකම්වලට හානියක් නොවේ නම් අප සමාජයේ ප්‍රජාතාන්ත්‍රික ව්‍යුහයට හානියක් නොවෙනම්, ඕනෑම දේශපාලන දර්ශනයක් පැවතුනා, අපට කමක් නැහැ. මේ වටිනා මූලධර්ම ආරක්ෂා වේ නම් විවිධ අදහස්ට දර්ශන, ප්‍රතිපත්ති හා වැඩ සටහන් තිබීමේ වරදක් නැහැ. ඉන් කුමක් තෝරාගත යුතුද යන්න තීරණය කරන්නේ මහජනයායි. කිසියම් රජයක් මහජනයා විසින් සිය ඡන්දයෙන් තෝරා පත්කර ගනු ලැබූ විට, මහජනයා විසින් එහි ප්‍රතිපත්ති පිළිගනු ලැබූවිට, එම ප්‍රතිපත්ති වැඩ සටහන් ස්වරූපයෙන් ක්‍රියාත්මක කිරීමට එම රජයට සිදුවෙනවා. මෙම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට රජයට සහයෝගයදීම හැම කෙනෙකුගේම යුතුකමයි. හැම අංශයකින්ම මේ සඳහා අපට පසුගිය අවුරුදු තුන තුළදී සහයෝගය ලැබී තිබෙන බව මා සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා.

ඔබ සැවොම දන්නවා උදාසීනකම හා වෙනත් දුර්වලකම් ගැන රාජ්‍ය සේවකයින් නිතර විවේචනයට ලක්වන බව. එනමුත් පොදුවේ බලන විට පසුගිය තුන් අවුරුද්ද තුළ ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය ප්‍රශංසනීය බව කියන්න සතුටුයි. ඕනෑම කාර්ය ක්ෂේත්‍රයක අනිකුත් අය හා කරට කර වැඩ නොකරන වැඩ අතපසු කරන්නන් 10%ක් පමණ සුළු කොටසක් සිටිනවා. ඕනෑම තැනක තත්ත්වය එහෙමයි ; රජයේ දෙපාර්තමේන්තුවලත් එහෙමයි. නමුත් සියයට 90ක්ම සිටින්නේ හොඳ සේවකයින්. සියයට 90ක් දෙනාටම නොයෙක් කරදර විඳින්නට සිදුව තිබුනු 1977ට පෙර කාලයතුළ එසේ නුවූවා වෙන්නට පුළුවන්. දැන් එම තත්ත්වය වෙනස්වී තිබෙනවා මේ අනුව බලන විට සියයට දහයක පමණ අඩුපාඩු, දුර්වලකම්, උදාසීනත්වය හා අකාර්යක්ෂම භාවය තිබෙනවා වෙන්නට පුළුවන්. නමුත් අපට සියයට 90 ක පමණ සතුටුදායක බවක් තිබෙනවා. එම ක්‍රියාකාරිත්වය ගැන මා සැමදෙනාටම ප්‍රශංසාකරනවා.

මගේ සහෝදර මන්ත්‍රීවරයකු වන යාපනේ ගරු දිස්ත්‍රික් අමාත්‍යතුමා විසින් සඳහන් කරන ලද පරිදි අද අප අතර මෙතැන සිටිනවා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 34 දෙනෙක්. පාර්ලිමේන්තුවේ රැස්වීමක් පැවැත්වීමට ගණපූරණය සඳහා අපට අවශ්‍ය මන්ත්‍රීවරු 20 දෙනෙක් පමණයි. අද අපට මෙතැන පාර්ලිමේන්තු රැස්වීමක් පැවැත්වීමට නොහැකිද කියා මට සිතුනා.

මෙම අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අද මා සමග යාපනයට පැමිණ යාපනයේ මහජන මන්ත්‍රීවරුන් විසින් පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරනු ලබන ගැටළු සියැයින් දැකබලා ගැනීමට සැලකිලිමත් වීමෙන් කර තිබෙන්නේ සිය සුහදකම පළකරන ශ්‍රේෂ්ඨ ක්‍රියාවක් බව කියන්නට ඕනෑ. මෙම දින හතර පහ තුළදී මෙම අමාත්‍යවරුන්ට දිස්ත්‍රික්කයේ තම තමන්ගේ අමාත්‍යාංශවලට ආයතනවලට ගොස් තම නිලධාරීන් හමුවන්නටත්, ප්‍රදේශයේ මහජනයා හමුවන්නටත්, එමගින් සැහෙන අත්දැකීමක් ලබා ගන්නටත් හැකිවන බව මට නිසැකයි. තවද, තම අමාත්‍යාංශවලින් මෙම ප්‍රදේශයේ ඉටුකරන වැඩ කටයුතුවල ප්‍රගතිය දැකබලා ගැනීමටත් ඒවායේ ප්‍රගතිය ගැන තක්සේරුවක් කර ගැනීමටත් ඔවුනට හැකිවනු ඇති.



## යාපනේ මහාලේකම් කාර්යාලයේදී පවත්වන ලද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී කන්කසන්තුරේ පාර්ලිමේන්තු මන්ත්‍රී හා විරුද්ධ පක්ෂයේ නායක ඒ. අමිර්තලිංගම් මැතිතුමා විසින් පවත්වන ලද කථාව

1981 ජනවාරි 29

මා යාපනේ ගරු දිස්ත්‍රික් අමාත්‍ය යූ.බී. විජේකෝන් මහතාගේ කථාවට ඇහුම්කන්දුන්නේ ඉතාම ප්‍රීතියෙනි. සංවර්ධන කටයුතුවලට අදල යාපනේ දිස්ත්‍රික්කයේ ජනතාව මූහුනපා සිටින විශාල ගැටළු එතුමා ඉතා සූක්ෂම අන්දමට පෙන්නුම් කළා. විජේකෝන් මහතා එතුමා දරන දිස්ත්‍රික් අමාත්‍ය තනතුර දැරීමට ඉතාම සුදුසු පුද්ගලයකු බවයි මා කල්පනා කරන්නේ. එතුමා තුළ තිබෙන මිත්‍රශීලී ගුණාංග නිසාත්, එතුමා තමන්ට භාර වැඩ කටයුතු ගැන දක්වන තියුණු උනන්දුව නිසාත්, අපට එතුමා සමග හොඳින් වැඩ කරගෙන යාමට හැකිවී තිබෙන බව මා ගරු අග්‍රාමාත්‍යතුමාට කියා සිටින්නට කැමතියි.

ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබ යාපන දිස්ත්‍රික්කයෙහි කරන මෙම ප්‍රථම නිල සංචාරයට පැමිණ සිටින්නේ අමාත්‍ය මණ්ඩලයේ අඩක් පමණම පිරිවර කොට ගෙනයි. අමාත්‍ය මණ්ඩලයේ ඉතිරි අඩට අයත් අමාත්‍යවරුන් කැටුවගොස් ගරු ජනාධිපති උතුමාණන් සිංගප්පූරුවේ අග්‍රාමාත්‍යතුමා පිළිගැනීමෙහි යෙදී සිටින මෙම අවස්ථාවෙහි ඔබ අප හමුවීමට පැමිණීම සුදුසු යයි කල්පනා කොට තිබීම ඉතා වැදගත් සිද්ධියක්. ඔබගේ මෙම සුහද ක්‍රියාව අපට දක්වන ලද ලොකු ගෞරවයක් කොට අප සළකනවා.

ගරු දිස්ත්‍රික් අමාත්‍යතුමා කී පරිදිම ගරු අග්‍රාමාත්‍යතුමා යාපනයට අමුත්තෙක් නොවේ. වරින් වර ආණ්ඩුවේ සාමාජිකයකු ලෙසට මෙන්ම විපක්ෂයේ සාමාජිකයකු ලෙසටත් එතුමා මෙම අර්ධද්වීපයට බොහෝ වාරයක් පැමිණ තිබෙනවා. පසුගිය ආණ්ඩු කාලයේදී එතුමා විපක්ෂයේ සාමාජිකයකු ලෙසට මෙහි පැමිණි අවස්ථාවෙහි අප අතුරින් සමහර දෙනෙකු එතුමා පිළිගැනීමට ගුවන් තොටුපලටත් ගොස් සිටියා. එනමුත් අද එතුමා අග්‍රාමාත්‍යවරයා ලෙස පැමිණෙන විට අද අප පැමිණ සිටින්නේ මේ නිල උත්සවයට සහභාගි වීමට පමණයි. එහි තේරුම ගරු අග්‍රාමාත්‍යතුමා කෙරේ හෝ අනිකුත් කිසිදු අමාත්‍යවරයකු කෙරේ හෝ අපගේ කිසියම් ද්වේශයක් තිබෙන බවක් නොවෙයි. අපට යම් යම් දේශපාලන අරමුණු තිබෙන අතර ඒ අනුව අපගේ පක්ෂය විසින් යම් යම් තීරණවලට බැස තිබෙනවා. එම තීරණ ක්‍රියාත්මක

කිරීමට අප බැඳී සිටිනවා. කෙසේවුවද, ගරු අග්‍රාමාත්‍යතුමාත් අනිකුත් ගරු අමාත්‍යවරුනුත් යාපනය දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා මහජනතාව වෙනුවෙන් හෘදයාංගමව හා සාදරයෙන් පිළිගන්නා බව ප්‍රකාශ කිරීමට කැමතියි.

ගරු අග්‍රාමාත්‍යතුමාට මා එක් කරුණක් මතක් කිරීමට කැමතියි. එතුමා මෙම දිස්ත්‍රික්කයට පැමිණ ඉටු කිරීමට බලාපොරොත්තුවන කාර්ය භාරය දෙයාකාරයක් ගන්නවා. පළමුව, අග්‍රාමාත්‍යතුමා හැටියටත්, රටේ සංවර්ධන කටයුතුවල ඉතාම වැදගත් අංශය භාර අමාත්‍යවරයා හැටියටත්, ඔබගේ අමාත්‍යාංශය මෙන්ම අනිකුත් අමාත්‍යාංශය විසිනුත් අරඹා තිබෙන සංවර්ධන කටයුතු වල ප්‍රගතිය සියැසින්ම බලාකියා ගැනීමට සහ එම කටයුතු සම්බන්ධයෙන් අවශ්‍ය තීරණ අදාළ ස්ථානවලදී ක්ෂණිකවම ගැනීමටත් බලාපොරොත්තු වෙන් ඔබතුමා පැමිණ සිටිනවා. මා මෙන්ම මගේ පක්ෂයේ අනිකුත් සාමාජිකයිනුත් කොතෙකුත් කියා ඇතිවාසේම මෙම මුළු දිවයිනම සමස්තයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ඔබ ගන්නා ප්‍රයත්නයට අපගේ සම්පූර්ණ අනුකූලතාවය ලැබෙන බව ප්‍රකාශ කිරීමට කැමතියි.

රජය ආර්ථික සංවර්ධනය සඳහා අරඹා තිබෙන සැලැස්මට අපගේ සම්පූර්ණ සහයෝගය ලැබෙන්නට සැලැස්වීමට අප සූදානම. නමුත්, නිසැකවම දකුණින් කැරෙන මෙම ආක්‍රමණයේ තවත් පැත්තක් තිබෙනවා. එය දේශපාලනමය පැත්තක්. ගරු අග්‍රාමාත්‍යතුමන් හා අනිකුත් ගරු අමාත්‍යවරුන්ට ඒ සම්බන්ධයෙන් මා කෙලින්ම හා අවංකවම කියන්නට සතුටුයි. ඔබ විසින් අවශ්‍ය දේශපාලන ප්‍රචාරක කටයුතු කිරීම ගැන අපගේ කිසිම විරුද්ධත්වයක් නොමැති බව. එසේම එම පදනමිනුත් ඔබතුමන්ලාට මුහුණදීමට අප සූදානම බව. මේ කරුණු ටික පැහැදිලි කිරීමට අමතරව මගෙන් ඉටුවිය යුතුව තිබෙන යුතුකමක් නම් රටේ මෙම ප්‍රදේශයේ මහජනයා මුහුණපා සිටින යම් යම් ගැටළු අද මෙතැනට පැමිණ සිටින අපගේ හොඳ පෞද්ගලික මිතුරන් වන ගරු අග්‍රාමාත්‍යතුමා හා අනිකුත් ගරු අමාත්‍යවරුන් හමුවේ තැබීමයි.

ගරු අග්‍රාමාත්‍යතුමා හා අනිකුත් ගරු අමාත්‍යවරුන් දන්නා පරිදි අප ජනයාගෙන් ඉතා වැඩි කොටස කෘෂිකර්මයෙහි යෙදුනු අයයි. ඔවුන් නිරතරව සිටින්නේ රතුළූනු, මිරිස් වැනි අතිරේක බෝග වගා කිරීමෙයි. අවාසනාවකට මෙන් මේ අතිරේක බෝග වගාකරන ගොවින්, අද ඔවුන්ගේ පැවැත්ම පිළිබඳ අර්බුදයකට මූණපා සිටිනවා. රතුළූනු හොණ්ඩරයක් නිෂ්පාදනය කිරීමට අද ගොවීන්ට රු. 100 ක් හෝ ඇතැම් විට ඊටත් වැඩියෙන් වැය කිරීමට සිදුව ඇතත් ඔවුන්ට රතුළූණු විකිණීමට සිදුව තිබෙන්නේ හොණ්ඩරය රු. 50 කට වාගේ සුළු ගණනකටයි. මගේ හොඳ මිත්‍ර වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ ගරු නියෝජ්‍ය ඇමතිතුමා මෙතැන සිටිනවා. එතුමාත් මාත් ' ශ්‍රාවස්තියේ ' අල්ලපු කාමරවල අසල්වැසියන්

ලෙසින් සිට ඇති අතර එසේ සිටින ගමන් අප දෙදෙන බොහෝ දිනෙක රාත්‍රිය ගතකොට තිබෙනවා මේ රටේ ප්‍රශ්න ගැන සාකච්ඡා කරමින්. එම නිසා ඔහුට මෙම ප්‍රශ්නය ගැන අවබෝධයක් තිබෙනවා. මෙම රජය විසින් අනුගමනය කොට තිබෙන විශේෂ ප්‍රතිපත්තිය නිසා යාපනයේ ගොවියාට තදබල පහරක් වැදී තිබෙනව. රජයේ විශේෂ සැලකිල්ල යොමුවිය යුතු එක් කරුණක් තමා එය. බොම්බයි ළූණු ආනයනය කිරීම රතුළූණු මිලට බලපාන්නේ නැතැයි යමෙකු කියනවා වෙන්නට පුළුවන්. නමුත්, අඩු මිලකට බොම්බයි ළූණු තිබේ නම් රතුළූණු මිලදී ගැනීමට කිසිවකු ඉදිරිපත් වන්නේ නැති බවටත්, බොම්බයි ළූණු ආනයනය කිරීම රතුළූනු ගොවියාට අඩු මිලක් ලැබීමට ස්ථිරවම හේතුවී තිබෙන බවටත් කරුණු හරිහැටි දන්නා ඕනෑම කෙනෙකු එකඟවනු ඇතැයි මා සිතනවා. ගොවි ජනයාගේ මිතුරකුවන ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටින්නට කැමතියි, මේ සම්බන්ධව සම්පූර්ණ ප්‍රතිපත්තියම ප්‍රතිශෝධනයකට භාජනය කරන්නය කියා. පසුගිය අවුරුදු තුන හතර තුළ මගේ සහෝදර පාක්ෂික මන්ත්‍රීවරුන් හා මා විසින් දිගින් දිගටම මෙම ඉල්ලීම පාර්ලිමේන්තුවේදී කර තිබෙනවා. නමුත් අපගේ මෙම ආයාචනා එතරම් සාර්ථකවී නොමැති බව මා කණගාටු වෙන් සඳහන් කරනවා. අපගේ ගොවියන්ගේ දුක්ගැනවිල්ල වෙනුවෙන් කතා කරන්නට ඉදිරිපත්වුනු අප ඒ සඳහා අවශ්‍ය තරමින් හොඳ පුද්ගලයින් නුවා විය හැකියි. එමනිසා ගරු අග්‍රාමාත්‍යතුමනි, යාපනයේ ගොවියන් වෙනුවෙන් කථා කොට ඔවුන්ට යුක්තිය ඉටුකරවාදීමේ වගකීම අප ඔබ තුමාට භාර කළයුතු යයි මා සිතනවා.

ගරු දිස්ත්‍රික් අමාත්‍යතුමා පෙන්නාදුන් පරිදි සංවර්ධන කටයුතුවලට අදාළව අප මුහුණපා සිටින යම් යම් ගැටළු තිබෙනවා. එනම්, වතුර ප්‍රශ්නය හා තවත් නොයෙකුත් ප්‍රශ්න. ඔබගේ නියෝග පරිදි, ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබගේ අමාත්‍යාංශයේ නිලධාරිහු ගණනාවක්ම 25 වනදා සිට තෙදිනක් මගේ ඡන්ද කොට්ඨාශයෙහි නැවතී සිට කරුණු පරීක්ෂා කළා. එසේම ඔබගේ නියෝජ්‍ය අමාත්‍ය ඉඹුලාන මහතා සමඟ සංචාරය කොට කන්කසන්තුරේ නගර ප්‍රදේශ යෙහි සංවර්ධන කටයුතු පිළිබඳ සමහර ගැටළු පරීක්ෂාකොට බැලීමටත් වෙනත් කටයුතු පිළිබඳව සොයා බැලීමටත් අපට පුළුවන් වුනා

ඒ වාගේම, අපගේ මහාමාර්ග සම්බන්ධ යම් යම් ප්‍රශ්නත් තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමා මෙහි සංචාරය කරන විට, අපගේ මහාමාර්ගයන් අද මෙම අවස්ථාවේ තිබෙන ආකාරයෙන් හැම විටෙකම තිබෙන්නට ඇත කියා නොසිතනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා ගරු අග්‍රාමාත්‍යතුමාගේ වර්තමාන සංචාරය නිසා පසුගිය සතියක් පමණවන කාලය තුළදී අපගේ මහාමාර්ගවල තත්ත්වයෙහි පුදුමාකාර වැඩිදියුණුවක් ඇතිවෙලා තිබෙනවා. නමුත් මෙයින් අප අපගේ ඉංජිනේරුවන්ට හා අනිකුත් නිලධාරින්ට දෝෂා-රෝපණය කිරීමක් අදහස් කරන්නේ නෑ. ඔවුන්ට අවශ්‍ය වැඩ කටයුතු

සඳහා මුදල් ලැබී නැති බව සත්‍යයක්. එසේවුවත් ගරු අග්‍රාමාත්‍යතුමාගේ සංචාරය ආසන්න වුනාම කෙසේ නමුත් මුදල් ලැබෙනවා. කෙසේ වුවද අපගේ මහාමාර්ගවලට සම්බන්ධ මෙම ප්‍රශ්නවලට මෙන්ම අනිකුත් ප්‍රශ්න වලටත් අප්‍රමාද සැලකිල්ල යොමුවිය යුතුව තිබෙන බව කිව යුතුයි.

ගරු අග්‍රාමාත්‍යතුමාගේ මෙම සංචාරය හා මෙම පිළිගැනීම ගැන යම් යම් කොටස් විසින් කරන ලද උද්ඝෝෂණ ගැනත්, ගරු අග්‍රාමාත්‍යතුමාට දැන ගන්නට ලැබෙන්නට ඇතැයි මම සිතනවා. මා උනන්දුවක් දක්වන්නේ එක්තරා දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කරමින් උද්ඝෝෂණයෙහි යෙදුනු එක කොටසක් ගැන පමණයි. ඔවුන්ගේ දුක්ගැනවිල්ල අයවැය විවාදයේදී මෙන්ම කාරක සභා අවස්ථාවේදිත් රජයේ ගරු ඇමතිවරුන් සැම දෙනෙකු ඉදිරියේම මවිසින් නැවතත් තබමින් අවධානයට යොමුකරවන ලද්දකි.

මා මේ කියන්නේ යාපනයෙන් පසුගිය වැඩ වර්ජනයට සහභාගිවී රැකියා අහිමිවූ හත්සියයක් පමණ දෙනා ගැනයි. ඇතැම් ගරු අමාත්‍යවරුන් මේ සම්බන්ධයෙන් අතිශයින්ම මානුෂික අන්දමින් ක්‍රියාකොට තිබෙන බව කියන්නට සතුටුයි. ඇතැම් අමාත්‍යාංශවල සැම වැඩ වර්ජකයෙක්ම නැවත සේවයට පත්කොට සිටිනවා. මේ සම්බන්ධයෙන් ගරු තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා මවිසින් විශේෂයෙන් සඳහන් කළ යුතුයි. වැඩ වර්ජකයින් සම්බන්ධයෙන් ක්‍රියාකළ ආකාරය බලන විට එතුමා බුදුරජාණන් වහන්සේ දේශනා කළ ශ්‍රේෂ්ඨතම ප්‍රතිපත්තිවල ප්‍රතිමූර්තියක්ම වූ බව එහි සේවකයින් මා සමඟ කියා තිබෙනවා. වැඩ වර්ජකයින්ගේ පවුල් නිරාහාරයේ නොසිටින තැනට එතුමා ක්‍රියාකර තිබෙනවා වැඩ වර්ජනයට බට පවුල්වල ජීවිකා වෘත්තිය සපයන්නවුන් එතුමා නැවත සේවයේ පිහිටුවා තිබෙනවා. ගරු ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාද එසේම කර තිබේ යයි මා විශ්වාස කරනවා. මෙසේ කරන ලද තවත් අමාත්‍යාංශ තිබෙනවා. ඇත්තෙන්ම මගේ හොඳ මිත්‍ර ගරු පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යතුමා සැබෑ සාධාරණ කල්පනාව ඇත්තෙක්. ඒ නිසා එතුමාට මෙය ප්‍රශ්නයක් වී නැහැ. එනමුත් තවමත් සේවයේ පිහිටුවා නැති වැඩ වර්ජක සේවකයින් 300 ක් 400 ක් පමණ සිටිනවා. ඔවුන්ගේ පවුල් එදිනෙදා ජීවත්වන්නේ නිරාහාර තත්ත්වයෙන්. අප රජයේ කොටස්කරුවෝ නොවුවත් අප ඔවුන් පාර්ලිමෙන්තුවේ නියෝජනය කරන නියෝජිතයින් නිසා, මෙම වැඩ වර්ජකයින් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් අප හමුවන්නට පැමිණ ඔවුන් සම්බන්ධයෙන් සාධාරණය ඉටුකරවා දෙන ලෙස බැගෑපත්ව අයැද සිටිනවා. ඔවුන් ඉල්ලන සාධාරණය ඉටු කිරීමෙහිලා රජය තරමක් දුරගොස් තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා මෙහි සංචාරයට පැමිණ සිටින මෙම අවස්ථාවේ ඔබතුමාගේ සුහද බව පළ කිරීමේ ලකුණක් වශයෙන් එම පුද්ගලයින් සියළුදෙනා නැවත සේවයේ පිහිටුවන්නට සලයනු ඇත කියාත් සමාජයේ සියළුම කොටස් අතර සුහද හැඟීම් පැවැත්ම සහතික කිරීමට ක්‍රියාකරනු ඇත කියාත් මා විශ්වාස කරනවා.

මා මේ කරුණු සඳහන් කරන්නේ ඔබගේ සංචාරයට විරුද්ධත්වය පෑමට වැඩ වර්ජකයින් ඇවිස්සීමට ඇතැම් කණ්ඩායම් විසින් යම් යම් පත්‍රිකා විසුරුවා හැර තිබෙන නිසයි. එසේ කරනු ලැබ ඇතත් ඔබගේ මෙම සංචාරයෙන් හෝ තමන්ට සහනයක් ලැබේදෝ යන බලාපොරොත්තුවෙන් වැඩ වර්ජකයින් නිහඬව බලා සිටිනවා.

මෙම ප්‍රදේශයේ ජනතාවගේ සිතේ නොයන්සුන්තාවය ඇති කොට තිබෙන ඉතා වැදගත් ප්‍රශ්න අතුරින් දෙකකි මා සඳහන් කළේ. ඒවා ඔබගේ අවධානයට යොමු කිරීම උචිතයයි මා කල්පනා කළා.

මැතදී ගරු අග්‍රාමාත්‍යතුමාගේ මූලිකත්වයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට සම්මත කොට ගන්නා ලද පරිපාලනය විමධ්‍යගත කිරීමේ අණපනත් කරණකොට ගෙන රටේ පරිපාලනයේ මහත් පරිවර්තනයෙක එළිපත්තට අප පැමිණ සිටිනවා. ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා සංවර්ධන සභා ඡන්ද පැවැත්වීමට අවශ්‍ය නීතිරීති ඉදිරිපත් කරනු ඇත කියාත්, අප්‍රමාදවම සංවර්ධන සභා පිහිටුවීමට ක්‍රියාකරනු ඇත කියාත් මා කල්පනා කරනවා. සංවර්ධන සභා පිහිටුවීමේ ක්‍රියාවලිය පටන් ගන්නේ 1979 ජූලි මාසයේ බැවින් ඒවායේ වර්ධනයට දැන් මාස විස්සක් ගතවී තිබෙන බව අප සැළකිය යුතුයි.

එකල ගරු ජනාධිපතිතුමා කල්පනා කළේ, සංවර්ධන සභා පිහිටුවීම පිළිබඳ වාර්තාව මසකින් ඉදිරිපත් කරනු ලැබ එම සභා ජනවාරි මාසයේදී නැතිනම් අඩුතරමින් 1980 අප්‍රේල් මාසයේදී පිහිටුවිය යුතු බවයි. දැන් අවු ගණනේ 1981 අප්‍රේල් මාසය වන විට හෝ සංවර්ධන මණ්ඩල පිහිටුවා රටේ පරිපාලනයට කිට්ටුවෙන් සහභාගිවීමට මහජනයාට ඉඩකඩ සලසාදීමට අපි ක්‍රියාකරමුයි මා යෝජනා කිරීමට කැමතියි.

ගරු අග්‍රමාත්‍යතුමනි, මෙම සංවර්ධන මණ්ඩල පිහිටුවීමේ කාර්යයට දක්වනු ලබන විරුද්ධතාවයන් නිසාත්, ඒ සම්බන්ධයෙන් ගෙනයන අවැඩදයි ප්‍රචාරයන් නිසාත්, රජයට මුහුණපාන්නට වී තිබෙන ප්‍රශ්න ගැන අප දන්නවා. දකුණේ සිටින අන්තවාදී කොටස්වලට මුහුණදෙමින් සංවර්ධන සභා පිළිබඳ නීතිය පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගන්නා ලද ධෛර්යවන්ත ආකාරය ගැන අප ඔබතුමාටත්, රජයටත් ප්‍රශංසා කරනවා. මෙ සම්බන්ධයෙන් ඉක්මනින් ක්‍රියාකොට පරිපාලනය විමධ්‍යගත කිරීමේ මෙම ක්‍රියා මාර්ගය යථාර්ථයක් බවට පමුණුවනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.

ගරු අග්‍රාමාත්‍යතුමනි, නොයෙක් කාරණා සම්බන්ධයෙන් ඔබතුමන් විසින් ප්‍රදර්ශනය කොට ඇති උතුම ගුණාංග පිළිබඳ අපගේ ගැඹුරු ප්‍රසාදය එළිපිටම පළකොට වාර්තාගත වන්නට සලසා ඇත්තෙමු. කොළඹ පළ කැරෙන එක්තරා පුවත්පතක් අප ගරු අග්‍රාමාත්‍යතුමා ගැන කියා ඇති හොඳ කියමන් සියල්ල හැන්සාඩ් වාර්තාවලින් උපුටා සිය මුල් පිටුවේ අද පළකර තිබෙනවා. එමනිසා ඒවා මා නැවත නැවතත් කියන්නට වුවමනා නැහැ. ඔබතුමා

කෙරේ පෞද්ගලිකව අප තුළ තිබෙන උණුසුම් හැඟීම් කෙසේද යන්න පෙන්නීමට මාහට තිබෙන්නේ "තිතකරන්" පුවත්පතෙන් පිටපතක් ඔබට ප්‍රදානය කිරීමයි කියා මා සිතනවා.

මෙම වචන ස්වල්පය කථා කිරීමට මට මෙම අවස්ථාව දීම ගැන මා ඉතා ස්තුතිවන්ත වෙනවා. මෙම මහා සභාවේ කාලයෙන් හුඟක් ගන්නට මා බලාපොරොත්තු වන්නේ නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා සමඟ ගරු අමාත්‍යවරුන් නම දෙනෙකු පැමිණෙනවා යයි කියන දැන්වීමක් තිබුණා. මා හිතන්නේ එම ගරු ඇමතිවරුන් නවදෙනාම මෙහි පැමිණ නැහැ. අමාත්‍යවරුන් නම දෙනෙක් ඔබතුමා සමඟ පැමිණෙතියි යන දැන්වීම දැක්ක අවස්ථාවෙහි මා කල්පනා කළා "නව ග්‍රහයින්ම" ඔබතුමා සමඟ මෙතැනට පැමිණෙන්නට යනවාද කියා. කෙසේ වුවත් "සෙනසුරා" පැමිණ නැති බව මට පේන්නට තිබෙනවා.

ගරු අග්‍රාමාත්‍යතුමනි, ගරු අමාත්‍යවරුනි, මා ඔබ සාදරයෙන් පිළිගන්නවා. ඒ එක්කම මා බලාපොරොත්තු වෙනවා ඔබතුමන්ලාගේ පැමිණීමේ ප්‍රතිඵලය ලෙසට යාපනේ සංවර්ධන වැඩ කටයුතුවලට නව පණක් ලැබී වේගයෙන් ඉදිරියට යනු ඇතැයි කියා. ඔබ හැමටම ස්තුතියි.



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# යාපනේ මහාලේකම් කාර්යාලයේදී පවත්වන ලද දිසත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී ප්‍රවාහන අමාත්‍ය ගරු එම්. එච්. මොහමඩ් මැතිතුමා විසින් පවත්වනු ලැබූ කථාව

1981 ජනවාරි 29

ගරු විපක්ෂ නායකතුමා එතුමාගේ කථාවේදී සෙනසුරු ග්‍රහයා ගැන සඳහන් කළා. සෙනසුරා හැම අවස්ථාවෙකදීම නරක ග්‍රහයකු නොවන බව එතුමාට සහතික වශයෙන්ම කිය හැකියි. සෙනසුරා නරකද, හොඳද යන්න රඳා පවත්නේ ඔහු සිටින රාශිය මතයි.

රජයේ සංවර්ධන ප්‍රතිපත්තිය ගැන ගරු විපක්ෂ නායකතුමා කිසිදු සැකයක් ඇති කොට ගත යුතු නැති බව මා කියන්නට සතුටුයි. කිසිම ආකාරයක වෙනස්කම් දැක්වීමක් නොමැතිව උතුරද ඇතුළු මුළුරටම සංවර්ධනය කිරීමට අප තුළ ලොකු උනන්දුවක් තිබෙනවා. කැබිනට් මණ්ඩලයේ දෙමළ කථා කරන සාමාජිකයකු ලෙසට මා උතුරට ගමන් කීපයක්ම පැමිණ තිබෙනවා. ඇත්තවශයෙන්ම මා ප්‍රවාහන අමාත්‍යවරයා ලෙසට වැඩ භාර ගත්තාට පසු මෙම ප්‍රදේශයට පැමිණි හයවන වතාවයි මේ. රටේ වෙනත් ප්‍රදේශවල ජනයා භුක්ති විඳින පහසුකම්වලට සමාන පහසුකම් මෙම ප්‍රදේශයේ ජනතාවටත් භුක්ති විඳීමට හැකිවන අයුරු අප මවබිමේ මෙම කොටසත් සංවර්ධනය කෙරෙනු දැකිමට මා තුළ හැම විටෙකම තදබල ආසාවක් හා උනන්දුවක් තිබුණු බව කීමට සතුටුයි. අපගේ රජයේ අර මුණත් එයමයි. අපගේ ආදරණීය අග්‍රාමාත්‍යතුමා පැමිණ සිටින්නේ එම අරමුණ පෙරදැරි කරගෙනයි. එතුමා පැමිණ සිටින්නේ මෙම ප්‍රදේශයේ කුමන අඩුපාඩුකම් තිබේ දැයි දැනගෙන ඒවා හැකි තරම් ඉක්මනින් පිරිමසා දීමටයි.

ඇතැම් අය කියාපාන්නට ඉතා පහසුවෙන්ම පෙළඹෙන ඊනියා වෙනස්කම් කිරීම් ගැනත් මා දැන් වචනයක් කථා කරන්නට සතුටුයි. වෙනස්කම් කිරීම යන්න හැම කෙනෙකුම, හැම දෙනෙකුම, හැම අවස්ථාවකම වාගේ කියන දෙයක්. එය මෙතැනත් කියැවෙනවා. සිංහල කථා කරන පළාත්-වලට යන්න, ඒ තැන්වලත් එය ඇසෙනවා. කොතැනත් තමන්ට වෙනස්කම් කරනු ලබනවා යයි කියා සිතන කොටස් සිටිනවා. සිංහල ප්‍රදේශවලත්, තව ජන කොටසක් ජීවත්වන නැගෙනහිර ප්‍රදේශවලත් වෙනස්කම් කිරීම ගැන කථා කරනවා.

කිසිදු වෙනස්කම් කිරීමක් නැතත් තිබෙන අඩුපාඩුකම් සියල්ල, වෙනස්කම් කිරීම නිසා සිදුවන බව කියනවා. එසේ වුවද කිසිදු තැනක වෙනස් කිරීමක් ලෙස පෙනෙන්න තිබෙනම් එය ඉවත් කොට දැමීම මෙම රජයේ අරමුණයි. මේ සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නයට අප මූණ දිය යුතුයි. රජයක් ලෙසට අපට අපගේ වගකීම්වලින් පලාගිය නොහැකියි. සෑම ප්‍රදේශයකටම ගොස් මහජනතාවගේ ප්‍රශ්න කවරේදැයි දැනගෙන එසේම එම ප්‍රදේශ සංවර්ධනය කළහැක්කේ කෙසේ දැයි දැනගෙන මහජනතාවට සෙත සැලසෙන අයුරු ක්‍රියාකිරීම අපගේ යුතුකමයි.

මට පෞද්ගලිකව කල්පනා වන හැටියට නම්, වෙනස්කම් කිරීමක් ගැන කරන මේ පැමිණිල්ලෙහි කිසිම සත්‍යයක් තිබෙන බවක් පේන්නේ නැහැ. මගේ ඡන්ද කොට්ඨාශය ඉතා වැඩි සංඛ්‍යාවක් බෞද්ධයින් වෙසෙන ඡන්ද කොට්ඨාශයක්. ඇත්තවශයෙන්ම කියනවා නම් ජනතාවගෙන් සියයට 90 ක්ම බෞද්ධයෝ. ඔවුන් නියෝජනය කරන්නට මා තෝරා ගැනීමෙන් පෙනී යන්නේ රටේ අප වසන ප්‍රදේශයේ, එනම් දකුණේ, වෙනස්කම් කිරීමක් නොමැති බවයි.

දකුණින් කැරෙන '' දේශපාලන ආක්‍රමණයක් '' ගැන ගරු විපක්ෂ නායකතුමා කථා කළා. එබඳු '' ආක්‍රමණයකින් '' රටේ මෙම ප්‍රදේශයේ ජනයා මූණපාන ප්‍රශ්න ගැන සොයා බලා ඒවා විසඳීමට පියවර ගනු ඇත්නම් එබන්දක් කිරීම ඉතා හොඳ දෙයක් බවට අප සැමට එකඟවිය හැකියි මා විශ්වාස කරනවා. එසේ කළොත් රටේ වසන සියළුම ජන කොටස් අතර වඩාත් හොඳ අවබෝධයක් ගොඩ නැගීමට අවශ්‍ය සංවාදය ඇතිවීමට එය බොහෝ සෙයින් උපකාර වනු නිසැකයි.

මා පෞද්ගලිකව විශ්වාස කරන්නේ එක රටක එකම ජනකායක් ලෙසින් අප ජීවත්විය යුතු බවයි. එය හැම දෙනාගේම අරමුණ විය යුතුයි. අප සියළුදෙනාම නොයෙක් ප්‍රශ්නවලට මූණදී සිටින බව මා පිළිගන්නවා. ප්‍රශ්න සතුටුදායක අන්දමට විසඳිය හැකි එකම මග නම් ඒවාට අවංකව මූණ දී ක්‍රියාකිරීම හා අදාළ පක්ෂ අතර යහපත් සංවාදයක් ඇතිවීමට සැලැස්වීමයි.

වැඩ වර්ජකයින් නැවත සේවයෙහි පිහිටුවීම ගැන ගරු විපක්ෂ නායකතුමා කථා කළා. ගමනාගමන මණ්ඩලයෙහි වැඩ වර්ජකයින් 150 දෙනෙකු පමණ සිටින බව එතුමා කීවා. මෙම සියළුදෙනාගේම අයැදුම් අපගේ සැලකිල්ලට භාජනය වී තිබෙනවා. ඒවා සලකා බැලීම තවමත් සිදුවීගෙන යනවා. අලුත් සභාපතිවරයා ඔවුන්ට යම් යම් ආකෘති පත්‍ර යවා තිබෙනවා පුරවා එවන්නට. මෙම සේවකයින්ට නිදහසට කීමට ඇති කරුණු ලැබී අවශ්‍ය වර්ගකිරීම ආදිය කරනු ලැබුවායින් පසු එම කරුණු පරීක්ෂා කොට බලා සතුටුදායක විසඳුමක් ඇතිකරනු ලබනවා ඇති.

මීට අවුරුද්දකට පෙර ගරු විපක්ෂ නායකතුමා විසින් උතුරේ පළමු ගමනාගමන මණ්ඩල වැඩ පොළට මුල්ගල තබනු ලැබුවා. දැන් එහි වැඩ නිමවී තිබෙනු දැකීම මාහට ලොකු සතුටක්. මෙම වැඩපොළ විවෘත කරන ලෙස මා දැන් ගරු අග්‍රමාත්‍යවරයාගෙන් ඉල්ලා තිබෙනවා. මා දැන් ගරු විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලා සිටිනවා එම විවෘත කිරීමේ උත්සවයට සහභාගි වන්නටය කියා. විශේෂයෙන්ම එම වැඩ පොළට මුල්ගල තැබුවේ එතුමා නිසා. එම ඉල්ලීම කිරීමේ කිසිදු දේශපාලන අරමුණක් ඇතැයි මට පේන්නේ නැහැ. මෙම ප්‍රදේශයේ මහජනතාව වෙනුවෙන් ඔහුගෙන් ඉල්ලා සිටිනවා එම උත්සවයට සහභාගි වන්නට කියා. මහජනයා අතර වඩා හොඳ අන්‍යෝන්‍ය අවබෝධයක් ඇතිවීමට මෙම ක්‍රියාවනුත් උපකාර වේ යැයි මා විශ්වාස කරනවා.

අද මෙම අවස්ථාවේ ඔබ සැම සමග එක් වන්නට ලැබීම මට සතුටක්. මීට ටික කලකට පෙර පවත්වන ලද හිජ්රා උත්සවවලට සහභාගිවීම ගැන මා උතුරේ පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන්ට මගේ ස්තුතිය පළ කරන්නට කැමතියි. එම උත්සව සාර්ථක කිරීමට උතුරේ සියළුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් ඔවුන්ගේ සහයෝගයත්, ආධාරත් දුන් බව මා දන්නවා. එහෙයින් මුස්ලිම් භක්තිකයන් වෙනුවෙන් මා එතුමන්ලාට මගේ ස්තුතිය පළ කරනවා. ස්තුතියි.



## නෙලිප්පලේ යූනියන් විද්‍යාලයෙහි පැවැත්වූ මහජන රැස්වීම අමතමින් අග්‍රාමාත්‍ය ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමන් කළ කථාව

1981 ජනවාරි 30

මා ප්‍රථමයෙන් තමුන්නාන්සේලා හැම දෙනාටම මගේ කෘතඥතාවය පිරිනමනවා, මේ සා විශාල පිරිසක් අද මේ ස්ථානයට රැස්වීම ගැන. තමුන්නාන්සේලා පැමිණ සිටිනවා දක්කාම පමණක් නොවෙයි, තමුන්නාන්සේලාගේ මුහුණු දකින විට මට ඇති වන්නේ ලොකු ප්‍රීතියක්. වැඩිහිටි උදවිය දෙස බලන කොට මට පෙනෙනවා, හරියට තමන්ගේ දරුවෙක් කොහේ හරි ගිහින් ඉඳලා ගෙදරට පැමිණි අවස්ථාවේ දී පිළිගන්නා ආකාරයේ ප්‍රීතියක් ඒ අය තුල තිබෙන බව. අනෙකුත් අය අද බලාගෙන සිටින්නේ හරියට තමන්ගේ සහෝදරයෙක් ඥතිවරයෙක් මිත්‍රයෙක් ආපසු ගෙදරට ආ දවසක දී ව ගෙයි. මටත් හිතෙන්නේ ඒවාගෙමයි. හරියට අපේ නෑදෑයන් මිත්‍රයන් අතරට ආවා වාගෙයි. ඊයේ ගුවන් තොටුපොළට ආපු අවස්ථාවේ මට කොයි තරම් දුරට සැළකුවා ද කිව්වොත් තවමත් මගේ ඇඟපත රිදෙනවා. මල් මාලා දමන්නට ආචාර කරන්නට මගේ මූණ අත ගාන්නට මොන තරම් ජනකායක් පොර කෑවාද කියා දන්නේ මගේ ඇඟපතයි. ඒ ඇඟපතේ අමාරුව තමුන්නාන්සේලා දෙස බලන විට අඩු වෙනවා. මම ඒ ගැන තමුන්නාන්සේලා හැම දෙනාටම මගේ මුළු හෘදයෙන්ම මගේ කෘතඥතාවය පිරිනමනවා. මා එක්ක ඇමතිවරු අට දෙනෙක් ආවා. විසි හතර දෙනෙක් පමණ නියෝජ්‍ය ඇමතිවරු දිසා ඇමතිවරු මන්ත්‍රිවරු ආවා. ඊයේ කච්චේරියේ පැවති සාකච්ඡාවට තමුන්නාන්සේලාගේ මේ යාපනය දිස්ත්‍රික්කයේ කොට්ඨාශ එකොළහේ මන්ත්‍රිවරු එකොළොස් දෙනාත් ඇවිත් හිටියා. ඔක්කොම තිස් හතර දෙනෙක් තිස් පස් දෙනෙක් පමණ යාපනයට එක් රැස් වුණා. ඉතිහාසයේ කවදවත් මේ තරම් මන්ත්‍රිවරු සංඛ්‍යාවක් එකට යාපනයට ඇවිත් නැහැ. ඒකෙන්ම පෙනෙනවා ඇති තමුන්නාන්සේලාගේ දියුණුව ගැන අපේ රජය මොන තරම් කැක්කුමකින් ආසාවකින් සහ ඕනෑකමකින් වැඩ කරනවා ද කියා. අපි ආවේ අපේ ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ සුබ පැතුම් තමුන්නාන්සේලාට අරගෙන. අපි කල්පනා කරන්නේ මුළු ලංකාවම එකම රටක් හැටියටයි, මේ රටේ ජීවත්වන හැම දෙනාටම උරුමයක් තිබෙනවා තමන්ගේ දියුණුව සලසා ගන්නට, ඒ සඳහා යමක් අපේ රජයෙන්

කෙරෙන්නට තිබෙනවා නම් ඒ හැම දෙයක්ම නොපිරිහෙළා නොකඩවා කරන්නට අපි සූදානම් බව නමුන්නාන්සේලාට ප්‍රකාශ කරන ලෙස ජනාධිපතිතුමා මට දැනුම් දුන්නා.

ඊයේ කචචේරියේ දී තමුන්නාන්සේලාගේ වර්තමාන මන්ත්‍රීතුමා වූ මගේ මිත්‍ර විරුද්ධ පක්ෂයේ නායක අමිර්තලිංගම් මහත්මයා මට කිව්වා අගමැතිතුමාත් සමඟ මේ තරම් මැති ඇමතිවරු සංඛ්‍යාවක් යාපනයට ආපු එක ගැන එතුමා ඉතාම සතුටු වෙනවාය කියා. ඒවාගේම එතුමා කිව්වා මේ රජය ගෙන යන සංවර්ධන වැඩ පිළිවෙළට සම්පූර්ණ සහාය දී ක්‍රියා කරනවාය කියා. මා ඒ ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඊයේ එතුමා පොඩි විහිළුවකුත් කළා. එතුමා කිව්වා ඇමතිවරු නව දෙනෙක් යාපනයට එන බව දැනගන්න ලැබුණ විට එක පාරටම නවග්‍රහ මණ්ඩලය මතක් වුනාය කියා. දැන් බලන කොට එක ග්‍රහයෙක් ඇවිත් නැති බවත් ඒ සෙනසුරු ග්‍රහයා බවත් ඒ ගැන එතුමා සතුටු වෙනවාය කියාත් එතුමා කිව්වා. සෙනසුරාත් ග්‍රහයෙක් බව තමුන්නාන්සේලා දන්නවා. සමහර අයට සෙනසුරා හොඳ නැහැ. සමහර අයට සෙනසුරා බොහොම හොඳයි. මේ ග්‍රහයා ග්‍රහ චක්‍රයේ සිටින තැනේ හැටියට තමයි, හොඳ හෝ නරක ලැබෙන්නේ. මේකට හොඳ උත්තරයක් දුන්නා, අපේ එම්. එච්. මොහොමඩ් ඇමතිතුමා. සෙනසුරා සමහර තැන්වල සිටින කොට සමහර උදවියට හොඳ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ ග්‍රහ චාර එක අනුව — ග්‍රහචාරය අනුව — සෙනසුරා පක්ෂයට බොහොම හොඳ ග්‍රහයෙක්. නමුත් ඒ සෙනසුරාම වෙන පක්ෂවලට ගියාම ඒ පක්ෂවල උදවියට බොහොම නරකයි. තමුන්නාන්සේලා පිළිගන්නවා ඇති මේ ග්‍රහයන් නව දෙනාම අපේ ජීවිතයට ඉතාම අවශ්‍ය බව.

මැති ඇමතිවරු මේ තරම් පිරිසක් මේ දින හතරට පනට යාපනයට ආවේ ඇයි. සමහර උදවිය චෝදනා කරනවා යාපනය ගැන — උතුරු ප්‍රදේශය ගැන — අපි වැඩි සැළකිල්ලක් දක්වන්නේ නැත කියා. ඒ උනත් මෙහාට ආවාම තමයි පෙනෙන්නේ මේ අවුරුදු තුනට මොන තරම් වැඩ රාශියක් කර තිබෙනවා ද කියා. තමුන්නාන්සේලා පත් කළ මන්ත්‍රීවරු ඔක්කොම ඉන්නෙ විරුද්ධ පක්ෂයෙ. එක්සත් ජාතික පක්ෂයෙ නොවෙයි. නමුත් එහෙම විරුද්ධ පක්ෂයේ සිටියාය කියා අපි වෙනසක් කර නැහැ. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ දී කර තිබෙන කථා කිපයක් මෙතැනදී සඳහන් කළා. කිසිම පළාතකට වෙනසක් කරන්නට අපේ බලාපොරොත්තුවක් නැහැ. සිංහල උදවිය වුණත් ද්‍රවිඩ උදවිය වුණත් මුස්ලිම් උදවිය වුණත් බර්ගර් උදවිය වුණත් මේ හැම දෙනාම ලංකාවේ පුරවැසියන්. මේ සියලු දෙනාම මනුෂ්‍යයින්. ටිකක් කල්පනා කර බලන්න. මම සිංහලයෙක්. මේ මගේ මිත්‍රයා මුස්ලිම් කෙනෙක්. දැන් මම උන්නැහෙගෙන් අහන්නට සතුටුයි මෙහෙ උපදින්නට කලින් මුස්ලිම් වෙලා උපදින්නට ලකුණු කරගෙන ආවාද කියා. මම හිතාගෙන

ආවෙත් නැහැ සිංහල වෙන්නට. ඉපදිලා ටික කාලයක් ගියාට පසුව තමයි මා දන්නෙ සිංහල පවුලකට සම්බන්ධ වී උපන්නාය කියා. මම කොහොමද දන්නෙ කොහේ ඉඳල ආවද කියා. මීට කලින් මේ මහත්මය සිංහල පවුලක සිංහල කෙනෙකු වී හිටියාද කියා කවුද දන්නෙ ? මේ පාර මා මැරුණාම ගිහින් කොහේ උපදිනවාද කියා මා දන්නේ නැහැ. අද මානිපායි පුස්තකාලය විවෘත කරන විට මා කිව්වා අපේ මැති ඇමතිවරුන් ඔක්කොටම ඒ පොතේ අත්සන් කරන්නය කියා. ඒ වෙලාවේදී මා වින්සන්ට පෙරේරා ඇමතිතුමාට කිව්වා, " තමුන්නාන්සේ ලබන ආත්මයේදී මානිපායි ප්‍රදේශයේ උපදියිද " කියන්ට බැහැ කියා. සහෝදර සහෝදරියනි, අපි එක්කෙනෙකුවත් සිංහල වෙන්නට හරි මුස්ලිම් වෙන්නට හරි බර්ගර් වෙන්නට හරි නම නියම කරගෙන ඇවිත් නොවෙයි උපදින්නේ. ඒක ස්වභාව ධර්මයෙන් වන දෙයක්. ඒ නිසා අපේ ජාතිය, ආගම, කුලය, පන්තිය, භාෂාව උඩ වෙන් වෙන්න අදහස් කිරීම ඉතාම මෝඩ කල්පනාවක්. අපි මිනිසුන් හැටියට මනුෂ්‍යත්වය ගැන සළකා ක්‍රියා කරන්නට උත්සාහ කරන්නට ඕනෑ. අපි අදහන නොයෙකුත් ශාස්තෘන් වහන්සේල — බුදුරජාණන් වහන්සේ, ක්‍රිස්තුස්තුමා, නබි නායකතුමා, හින්දු ධර්මයේ ශ්‍රී කෘෂ්ණ වැනි ශාස්තෘන් වහන්සේලා ගැන — කල්පනා කර බලන්න. ඒ එක්කෙනෙකුවත් සිංහල නොවෙයි. ද්‍රවිඩ නොවෙයි. ලාංකිකයන් නොවෙයි. නමුත් අපි ඒ උදවිය අදහනවා. එතුමන්ලාගේ ධර්මය අපි අනුගමනය කරන්නට උත්සාහ කරනවා. ඒක තමයි නියම මනුෂ්‍යකම. අපි ඒ අනුව අපේ ප්‍රශ්න ගැනත් කල්පනා කරන්නට ඕනෑ.

අපි වෙන්වෙලා කොටු වෙලා භේද වෙලා ජීවත්වීමෙන් ප්‍රයෝජනයක් ඇති වෙනවාද කියා තමුන්නාන්සේලාගේ හෘදය සාක්ෂියෙන් අහන්නය යයි මා කියනවා. අපේ රට කෑලි කෑලිවලට අපි වෙන් කර ගත්තොත් අපි භේද වුණොත් අපි වෙන් වුණොත් අපට ඒකෙන් දියුණුවක් ඇති වෙයිද කියා කල්පනා කර බලන්න. ලෝකයේ ඒ විදියට වෙන්වූ රටවල් ගැන බලන්න. ඒ රටවල මොන විදියේ තත්ත්වයක් ඇති වී තිබෙනවාද කියා තමුන්නාන් සේලාට පෙනෙනවා. ඉන්දියාව දෙස බලන්න. ඉන්දියාව කැඩුණා ඉන්දියාව, පාකිස්ථානය හැටියට. පසුව පාකිස්ථානය කැඩුණා පකිස්ථානය, බංග්ලා දේශය හැටියට. වෙනත් රටවල් ගැන බලන්න. ජර්මනිය ගන්න. ජර්මනිය කැඩුණා, නැගෙනහිර හා බටහිර හැටියට. කොරියාව කැඩුණා. වියට්නාමය කැඩුණා. ඒ කැඩුණු එක තැනකවත් සාමය තිබෙනවාද ? සංවරය තිබෙනවාද ? සතුට තිබෙනවාද ? හොඳක් වී තිබෙනවා නම් අපිත් කෑලි කෑලිවලට කැඩෙමු. එහෙම වෙලා නැත්නම් අපි වඩ වඩාත් එක් වෙමු.

මා පාර්ලිමේන්තුවේදී කිව්වා ලෝකයේ වෙන් වූ කැඩුණු බෙදුණු රටවල් දූන් එකට එකතු වෙන්නට යනවාය කියා. අද ලෝකයේ කිසිම රටකට පුළුවන්කමක් නැහැ තනි තනිව ජීවත් වෙන්නට. වෙනත් රටවල උදව් ආධාර නැතිව ජීවත් වෙන්නට බැහැ. ඒකයි තත්ත්වය. එහෙම නම් රටවල් ඇතුළේ තත්ත්වය කොහොම වෙයිද ? බැරි වෙලාවත් අපි කල්පනා කළොත් අපි ලංකාව හැටියට ලෝකයේ වෙනත් රටවලින් වෙන් වී තනිවම ජීවත්වෙන්නට ඕනෑය කියා මොකක්ද ඇති වන තත්ත්වය ? බැරි වෙලාවත් අපට එහෙම වෙන් වෙන්නට වුණොත් අපට තෙල් ලැබෙන්නේ නැහැ. එතකොට මොකක්ද තත්ත්වය ? අපි මේ ගැන ටිකක් කල්පනා කරන්නට ඕනෑ. අසාධාරණකම් තියෙන්නට පුළුවනි. අයුතුකම් තියෙන්නට පුළුවනි. නමුත් අසාධාරණකම් තිබෙනවාය කියා අයුතුකම් තිබෙනවාය කියා අපි කැඩෙන්නට වෙන් වෙන්නට බෙදෙන්නට වුවමනා නැහැ.

මා මන්නාරමට ගිය අවස්ථාවේදී මන්නාරමේ මන්ත්‍රී සූසෙයිදාසන් මහත්මයා මට කිව්වා මන්නාරමේ තිබෙන ලොකු අඩුපාඩුවක් ගැන. එතුමා මට කිව්වා මන්නාරමට විදුලිය බලය සපයන්නේ එන්ජින් මාර්ග යෙන්ය. ඒ සඳහා ඩීසල්වලට පෙට්රල්වලට විශාල මුදලක් යනවාය. එමනිසා කරුණාකර ජල විදුලි බලය මෙම ප්‍රදේශයට ලබා දෙන්නය කියා එතුමා මගෙන් ඉල්ලීමක් කළා. මම ඇහුව ඒ මන්ත්‍රීතුමාගෙන් බැරි වෙලාවත් මන්නාරම වෙන් වුණොත් කොහෙන්ද ජල විදුලිය ලැබෙන්නෙ කියල. එතුමා ඒ වෙලාවේ හිනැහ වුණා. ඒ විධියට අපි කල්පනා කරන්නට ඕනෑ. මේ රජය කල්පනා කරන්නේ අසාධාරණකම් තිබෙනවා නම අයුතුකම් තිබෙනවා නම් ඒ අසාධාරණකම් සහ අයුතුකම් නැති කර මේ රට වඩ වඩාත් සමගි සම්පන්න කරන්නටයි. බලන්න, මේ අවුරුදු තුන ඇතුළත අපි බරපතළ ප්‍රශ්න කීපයක්ම විසඳුවා. අසාධාරණ දේවල් අපි සාධාරණ තත්ත්වයට පත් කළා. අද සිරිමා බණ්ඩාරනායක මහත්මිය යාපනයට ඇවිත් කිඹුල් කඳුළු හෙළනවා. නමුත් එයාගෙ කාලෙ අසාධාරණකම් නැති කරන්නට කළේ මොනවාද කියා මා අසන්නට කැමතියි.

තමුන්නාන්සේලාට මතක ඇති, 1966 දී දෙමළ භාෂාවට සාධාරණ තැන දීමේ පනත අනුව අපි පාර්ලිමේන්තුවට පනතක් ගෙනාවා රෙගුලාසි පනවන්නට. ඒ පනත ගෙනාවේ අපේ වර්තමාන ජනාධිපති ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමායි. ඒක ස්ථිර කලේ එද පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ උප ඇමතිවරයකු වී සිටි මමයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සිරිමා බණ්ඩාරනායක මහත්මියගේ නායකත්වයෙන් එද මොකක්ද කළේ ? ද්‍රවිඩ භාෂාවට සාධාරණ තැන ලබා දීම පිණිස මේ රෙගුලාසි කීපයක් ගෙනාවාය කියා ඊට විරුද්ධව මොකක්ද කළේ ? ලොකු පෙළපාලියක් සූදානම් කළා. කලු පටි ඇඳගෙන ඒ පෙළපාලියෙන් ඇවිත් තමුන්නාන්සේලා

දන්නවා මහා අවහිරයක් කළ බව. භික්ෂූන් වහන්සේලා ඉස්සර කරගෙන මහා දමරික වැඩ පිළිවෙළක් ගෙන ගියා. ඒ අවස්ථාවේදී වෙඩි තබන්නට පවා පොලීසියට සිද්ධ වූ බව තමුන්නාන්සේලා දන්නවා. දැන් සමහර අයට මේවා මතක නැති වෙ ගෙන යනවා. අපේ ආණ්ඩුව පත් වුණාට පස්සෙ අපි ආණ්ඩු ක්‍රමය වෙනස් කළා. ලංකාවේ ඉතිහාසයේ ප්‍රථමවරට සිංහල සහ දෙමළ භාෂා දෙක ජාතික භාෂා හැටියට භාර ගත්තෙ මෙ ආණ්ඩුව බව මා ප්‍රකාශ කරන්නට කැමතියි. ඒ අවස්ථාව වන විට මෙ රටෙ පූරවැසියන් වර්ග කිපයක් සිටියා. සමහර උදවිය උත්පත්තියෙන් පුරවැසියන්. සමහර උදවිය ලියාපදිංචි වීමෙන් පුරවැසියන්. සමහර උදවිය කසාද බැඳීම අනුව පුරවැසියන්. තවත් සමහර උදවිය වෙනත් වෙනත් හේතු උඩ පුරවැසියන්. ඒ විධියට පුරවැසි මට්ටම කිපයක් තිබුණු බව තමුන්නාන්සේලා දන්නවා. ඒ අනුව මෙ රටේ පළමුවැනි පන්තියේ පුරවැසියන්ය, දෙවැනි පන්තියේ පුරවැසියන්ය, තුන්වැනි පන්තියේ පුරවැසියන්ය, හතරවැනි පන්තියේ පුරවැසියන්ය, පස්වැනි පන්තියේ පුරවැසියන්ය ආදි වශයෙන් වර්ග භේදයක් තිබුණා. ඒ භේදය සම්පූර්ණයෙන්ම නැති කර මේ රට තමන්ගේ මවු බිම කර ගන්නා හැම දෙනාම පුරවැසියන්ය කියා තිරණය කළේ එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුව බව මා මතක් කරන්නට සතුටුයි.

ඒවාගේම ඉඩම බෙද දිමේදි, ඒ ඒ ප්‍රදේශයේ ඉඩම නැති ජනතාවට ප්‍රමුඛත්වය දෙන්නය කියන ප්‍රතිපත්තිය සකස් කළේත් මේ එක්සත් ජාතික පක්ෂයේ රජය බව මා ප්‍රකාශ කරන්නට සතුටුයි. එපමණක් නොවෙයි. සංවර්ධන වැඩක් කරනවා නම් ඒක රටපුරාම හැම ප්‍රදේශයේම වුමනාව අනුව විය යුතුය — ජාතිය අනුව වර්ගය අනුව නොවෙයි අවශ්‍යතාවය අනුව විය යුතුය — කියා තිරණය කළේත් එක්සත් ජාතික පක්ෂයේ මෙ රජය බවත් මා මතක් කරන්නට සතුටුයි. තමුන්නාන්සේලාගේ ස්වදේශ කටයුතු භාර ඇමති මෙ දේවනායගම මැතිතුමාත් ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන ඇමති තොන්ඩමන් මැතිතුමාත් තමුන්නාන්සේලාට කියා දෙයි, මෙ කාරණාවල් ඉදිරිපත් වූ අවස්ථාවෙ ජනාධිපතිතුමා ඇතුළු කැබිනට මණ්ඩලයත් අපේ මැති ඇමති වරුත් සියලු දෙනාම කිසිම වාද විවාදයක් නැතිව ඒකච්ඡන්දයෙන්ම මෙ වැඩ පිළිවෙළ අනුමත කළ බව.

අපි ළඟදි ගෙනාවා පනතක් දිස්ත්‍රික්ක මට්ටමින් සංවර්ධන සභා පිහිටුවන්නට. ඒ සංවර්ධන සභා ක්‍රමයෙන් තමයි ඒ ඒ ප්‍රදේශවල ජනතාවට බලයක් ලැබෙන්නේ තමන්ගේ ඕන එපාකම් ඉෂ්ට කර ගන්නටත් පරිපාලනයට සම්බන්ධ වෙන්නටත්. තමුන්නාන්සේලා තෝරා පත් කළ මන්ත්‍රිවරු සිටින දෙමළ එක්සත් විමුක්ති පෙරමුණත් ඒ වැඩ පිළිවෙල ඒකච්ඡන්දයෙන්ම පිළිගත් බව මා මතක් කරන්නට සතුටුයි. ඒ අවස්ථාවේදීත් සිරිමා බණ්ඩාරනායක මැතිනියගේ

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මොකක්ද කළේ ? ඒ අය රටපුරාම රැස්වීම් තබමින් සිංහල ජනතාව අවුස්සන්නට පටන් ගත්තා "මෙන්න එක්සත් ජාතික පක්ෂය රට දෙමළ ජනතාවට විකුණන්නට යනවා" ය කියා. අපි ඒ අවස්ථාවේදී ඒවාට බය වුණේ නැහැ. අපි මහජනතාවට තෝරා දුන්නා මුළු ලංකාවේම දිස්ත්‍රික්ක 24 හතර තුළ සිටින ජනතාවට නියම විධියට මේ රටේ උරුමක්කාරයින් හැටියට තමන්ගේ වැඩ කටයුතු කරවා ගන්නට පුළුවන් වෙන්නේ මෙම වැඩ පිළිවෙළින් බව. ඒ විධියට රටේ බොරු ප්‍රචාරය කර අපේ රටේ ජනතාව භේද භින්න කරන්නට ලැස්ති වන සිරිමා බණ්ඩාරනායක මහත්මිය තමයි යාපනයට ඇවිත් ආයෙමත් කිඹුල් කඳුළු හෙළුවේ. සහෝදර සහෝදරියනි, එයාට උදව් කරන සමහර උදවියටත් එයාගේ අතීතය මතක නැති වෙලා. එයා ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා.

මේ කන්කසන්තුරේ ආසනය නියෝජනය කළ දිවංගත එස්. ජේ. වී. චෙල්වනායකම් මැතිතුමාගේ ඉල්ලා අස්වීමෙන් ආසනය හිස් වූ බව තමුන්නාන්සේලා දන්නවා. ඒ මැතිවරණය පැවැත්වූවා ද සිරිමා බණ්ඩාරනායක ? මේවා සමහර උදවියට දුන් මතක නැති වෙ ගෙන යනවා. එපමණක් නොවෙයි. තමුන්නාන්සේලා දන්නවා මොන විධියට මේ රටේ ජනතාව ආර්ථික වශයෙන් පරිහානියට දැම්මාද කියා. කොන්ට්‍රෝල් කරල, සලාක ඇති කරල, ටෝකන් කාඩ් දමල, මේ රටේ ජනතාව කන්න අඳින්න නැති තත්ත්වයකට පත් කළේ කවුද කියා මා අහනවා. පස් දෙනෙකුගෙන් යුක්ත පවුලකට සතියකට පාන් රාත්තලක් දෙන්න ටෝකන් කාඩ් දුන්නෙ කවුද කියා මා තමුන්-නාන්සේලාගෙන් අහනවා. ලංකාවේ සමහර ප්‍රදේශවල උදවිය ඒ ටෝකන් කාඩ් එක තවමත් ප්‍රවේසම් කරගෙන ඉන්නවා. ළඟදි එයා ගියා රැස්වීමකට එක්තරා ප්‍රදේශයකට. සිරිමා බණ්ඩාරනායක මහත්මිය ඒ රැස්වීමේ මුල් ආසනයේ හිටියා. එක මනුෂ්‍යයෙක් වේදිකාවට ඇවිත් සිරිමා බණ්ඩාරනායකගේ අතට තෑග්ගක් දුන්නා. ඒක බොහොම හොඳට පාර්සල් කර තිබුණා. ලක්ෂණ රිබන් පටියකින් බැඳල තිබුණා. එයා බොහොම සන්තෝෂයෙන් ඒක භාර ගත්තා. එයා හිතන්න ඇති ඒක ඇතුළෙ පවුඩර් ටින් නැත්නම් ලිප්ස්ටික් කූරු ටිකක් නැත්නම් කියුටෙක්ස් ටිකක් ඇති කියල. බොහොම ආසාවෙන් ඒක භාර ගත්තා. ඒක ගෙදර ගෙන ගොස් ලිහන්න තරම්වත් මෙයාට ඉවසිල්ලක් නැහැ. එවෙලෙම ලිහල බැලුවා. මොනවද ඒකෙ තිබුණෙ ? ප්‍රදේශයේම තිබුණු පරණ පාන් කාඩ් ! ආයෙත් පාන් කාඩ් ලබා ගන්න ඕනෑ කර තිබෙනවාද කියා මා සිරිමා බණ්ඩාරනායක පස්සෙන් යන අයගෙන් අහන්නට සතුටුයි. හාල් සේරු දෙකක් පාරෙ ගෙන යන්න ඉඩ නොදුන්නෙ කවුද කියා මා තමුන්නාන්සේලාගෙන් අහන්නට සතුටුයි. හාල් සේරු දෙකක් ගෙන යන කොට පාර හරහා පොල්ලක් දැම්මෙ කවුද කියා මා අහන්නට කැමතියි. රතුලූනු ටිකක් පාරෙ ගෙන යන්න ඉඩ නොදුන්නෙ කවුද කියා මා අහන්නට

කැමතියි. මිරිස් ටිකක් පාරෙ ගෙන යන්න ඉඩ නොදුන්නෙ කවුද කියා මං අහන්නට කැමතියි. මේවා අරගෙන යන කොට මොකක්ද තමුන්නාන්සේලාට සිද්ධ වුණේ ? පොල්ලක් පාර හරහා බාන එක! මා අහන්නට සතුටුයි ආයෙත් පාර හරහා පොලු දමාගන්නට කැමතිද කියල? තමුන්නාන්සේලාට අඳින්න රෙදි කෑල්ලක් ගන්න කොතරම් කරදර වුණාද ? රුපියල් 15ක් දිල තමුන්නාන්සේලා ගත් රෙදි යාරය ඇඳ ගෙන යන්න පුළුවන් වුණාද ? අද මොකක්ද තත්ත්වය ? සහෝදර සහෝදරියනි, අද තමුන්නාන්සේලා ඇඳගෙන සිටින ඇඳුම් පැළඳුම් දෙස තමුන්නාන්සේලාම බලන්න. මෙ අවුරුදු තුන ඇතුළතදී එයාගේ පාලනයට වඩා වෙනසක් ඇති වෙලා නැද්ද කියා කල්පනා කර බලන්න. එසේ නම් තමුන්නාන්සේලාට පෙනෙයි ආයෙමත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට යම් කෙනෙකු උදව් දෙන්න ලෑස්ති වෙනවා නම් එය ඉතාම මෝඩ ක්‍රියාවක් බව.


ආපස්සට යන්නට කවුරුවත් කැමති වෙය කියා මා සිතන්නේ නැහැ. එද සිංහල උදවිය දෙමළ උදවිය එක්ක හෙද කළා. කතෝලිකයන් බෞද්ධයින් එක්ක හෙද කළා. හින්දු උදවිය මුස්ලිම් උදවිය එක්ක හෙද කළා. ඒ විධියට නේද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රටේ පාලනය ගෙනිච්චේ ? එවැනි දුෂ්ට පාලනයක් ආයෙමත් කවුරුවත් බලාපොරොත්තු වෙනවාද ? තමුන්නාන්සේලා දන්නවා කෙනෙකුට පිටරට යන්නට ඉඩ දුන්නෙ නැහැ. ඒ අයගේ නෑදෑ මිත්‍රයන්ට පමණයි පිටරට යන්නට ඉඩ දුන්නේ. තමුන්නාන්සේලාගේ වර්තමාන මන්ත්‍රීතුමාට — අමිර්තලිංගම් මහත්මයාට — ඉන්දියාවටවත් යන්නට ඉඩ දුන්නෙ නැහැ. ඒ බාධාවල් අද තිබෙනවාද ? අද ඕනෑම කෙනෙකුට ඕනෑම තැනකට ගිහින් — ලෝකයේ ඕනෑම රටකට ගිහින් රක්ෂාවල් කරමින් මුදල් හම්බ කරන්නටත් — අපි ඉඩ දී තිබෙනවා. මා සිතන්නේ නැහැ මෙ තත්ත්වය නැති කර ගන්නට කවුරුවත් කැමති වෙය කියා. අද මම මෙහාට එන කොට අතන බයිසිකල් දහස් ගණනක් නතර කර තිබෙන බව දුටුවා. ඉස්සර ඔහොම බයිසිකල් එකක් ලබා ගන්නට පුළුවන්කමක් තිබුණාද ? අද මෝටර් සයිකල් තිබෙනවා රටපුරාම. ඉස්සර ලොරියක් ගන්නට පුළුවන්කම තිබුණාද ? ඒ කාලෙ ගම් රටවල තිබුණු ගරාජ ඔක්කොම වහන තත්ත්වයකට ඇවිත් තිබුණා. කල්පනා කර බලන්න අද කී දහක් අපේ මෙ වැඩ පිළිවෙළ නිසා රැකීරක්ෂා ලබාගෙන තිබෙනවාද කියා. ආයෙමත් අර අඳුරු යුගයට යන්න කවුරුවත් කැමති වෙයිද ? ඒ නිසයි සහෝදර සහෝදරියනි, අප සියලු දෙනාම වඩ වඩා කිට්ටු වෙලා එක්සත් වෙලා අපේ මෙ ඉදිරි ගමන තවත් වේගවත්ව යා යුතුව තිබෙන්නේ.

මෙ අවුරුදු තුනට මේ ඇති වී තිබෙන වෙනස තමුන්නාන්සේලාට පෙනෙනවා. මෙ වැඩ පිළිවෙල තවත් අවුරුදු 10ක් වත් ගෙනිච්චොත් මොන විධියේ දියුණුවක් මෙ රටේ ඇති වෙයිද කියා තමුන්නාන්සේලාටම කල්පනා කරන්නට පුළුවනි. තමුන්නාන්සේලා දන්නවා අමමා කෙනෙකු

ගේ ලොකුම ආසාව තාත්තා කෙනෙකුගේ ලොකුම ආසාව—දෙමව්පියන්ගේ ලොකුම ආසාව– තමන්ගේ දූ දරුවන් තමන්ට වඩා වාසනාවන්ත ජීවිත ගත කරනවා දැක මැරෙන්නටයි. සිරිමා බණ්ඩාරනායකගේ කාලයේ ''අනේ දරුවනේ, උඹලාට වඩා හොඳ ජීවිතයක් අපි ඉස්සර ගත කළාය'' කියලයි කිව්වෙ. අද මේ රජය ගෙන යන වැඩ පිළිවෙළ අනුව හැම අම්මා කෙනෙකුටම හැම තාත්තා කෙනෙකුටම පුළුවනි තමන්ගේ ඇස් ඉදිරිපිටම තමන්ට වඩා වාසනාවන්ත ජීවිත තමන්ගේ දූ දරුවන් ගත කරනවා දකින්නට. අන්න ඒ විශ්වාසය තමයි අද රටපුරාම ඇති වෙලා තියෙන්නෙ. අපට වුවමනා කරන්නේ ඒ විශ්වාසය තවදුරටත් ශක්තිමත් කරවන්නටයි. මේ විදියට අපි වැඩ කරගෙන ගියොත් වැඩි කල් යන්න ඉස්සෙල්ලා අපේ රැකිරක්ෂා ප්‍රශ්නය විසඳා ගැනීම ඒ තරම් අමාරු දෙයක් නොවෙයි.

මේ යාපනය දිස්ත්‍රික්කයේ තමුන්නාන්සේලා අපේ රටේ ජනතාවට ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ජනතාවක්. තමුන්නාන්සේලාගේ නිෂ්පාදනවලට නියම වටිනාකමක් දෙන්නට අපට වුවමනා කරනවා. මේ රටට වුවමනා ප්‍රමාණයට නිෂ්පාදනය නංවනවා වාගේම බඩු පිටරටින් ගෙන්වීම අඩු කරන්නටත් අපි යම් වැඩ පිළිවෙළක් සකස් කරගෙන යනවා. අපි යම් ආහාර ද්‍රව්‍යයක් පිටරටින් ගෙන්වනවා නම් එසේ කරන්නේ තමුන්නාන්සේලාගේ නිෂ්පාදන වලට හානියක් කරන්නට නොවෙයි. රටේ විශාල පාරිභෝගික සංඛ්‍යාවක් ඉන්නවා. ඒ උදවියටත් අපි සාධාරණයක් සලස්වන්නට ඕනෑ කරන නිසයි. ඒ නිසා මා කියන්නට සතුටුයි තමුන්නාන්සේලාගේ නිෂ්පාදන ශක්තිය තහවුරු කිරීමට අපි ඉක්මණින්ම සාධාරණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන බව.

මේ විදියට අපි සමගියෙන් සාමයෙන් එක්සත්ව එක්මුත්ව වැඩ කරගෙන ගියොත් තමුන්නාන්සේලාට පෙනෙයි වැඩි කල් යන්නට ඉස්සෙල්ලා මුළු ලංකාවම එකාකාර දියුණුවකට පත් වන බව. මේ පණිවුඩය දෙන්නයි මා තමුන්නාන්සේලා අතරට ආවේ. අද කෙරී ගෙන යන සංවර්ධන වැඩ කටයුතු පරීක්ෂා කරන්නටයි අපි මෙහාට ආවෙ. ඒවායේ තිබෙන අඩුපාඩු කම් මේ ඇති ඇමතිවරුන් තමන්ගේම ඇස්වලින්ම බලා ඒවා සම්පූර්ණ කරන්නටයි අපි තමුන්නාන්සේලා අතරට ආවෙ. අපි සියලු දෙනාම එක පවුලෙ දරුවො. අපි සියලු දෙනාම ඒ දරු පවුලෙ නෑදෑයින් මිත්‍රයින්. අපි වෙනත් භාෂා කථා කළත් වෙනත් ආගම් ඇදහුවත් ඒ එකක්වත් අපි එක එක්කෙනා නියම කරගෙන ආපු ඒවා නොවෙයි. අපි සියලු දෙනාම එක රටක එක අම්මා කෙනෙකුගේ දරුවන් හැටියටයි ජීවත් වෙන්නෙ. තමුන්නාන්සේලාගේ මේ ප්‍රදේශයේ කළයුතු යම් වැඩක් තිබෙනවා නම් ඒ හැම දෙයක්ම නොපිරිහෙළා ඉටු කරන්නට පොරොන්දු වෙමින් මේ ආ ගමනේදී තමුන්නාන්සේලාගෙන් අපට ලැබුණු සංග්‍රහ සැලකිලි සත්කාර අපි දිවි හිමියෙන් අමතක නොකරන බව පළ කරමින් තමුන්නාන්සේලා සියලු දෙනාටම ජයවේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසාන කරනවා.



## යාපනය දිස්ත්‍රික්කයේ කිරමලේහි තීර්ත මණ්ඩපය හා පොකුණ විවෘත කිරීමෙන් අනතුරුව, අග්‍රාමාත්‍ය ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමන් විසින් කරන ලද කථාව

1981 ජනවාරි 31

මෙ කිරමලේ ප්‍රදේශයට මම මුලින්ම ආවෙ 1947 දියි. මාව ඒ අවස්ථාවේ දී මෙහාට කැඳවාගෙන ආවෙ තෙල්ලිපලේ ග්‍රාමයේ උපන් මගේ හොඳ මිත්‍රයෙක්. එතුමා නම්, කොළඹ ඔල්කට් මාවතේ ලීලා ස්ටෝර්ස් වෙළඳ ව්‍යාපාරයේ අධිපති එස්. පී. සින්නතුරේ මහතායි. එතුමා මෑතකදී අප අතරින් වියෝ වූ බව තමුන්නාන්සේලා දන්නවා.

මාත් සමග ඒ ගමනේදී ආ තවත් මහත්මයෙක් අද ජීවතුන් අතර නැහැ. ඒ පියදාස පළන්සූරිය මහතායි. ඒ ගමනට සහභාගිවුණු තවත් එක්කෙනෙක් පමණයි මා සමග අද ජීවතුන් අතර ඉන්නේ.

එද සින්නතුරේ මහතා අපිව යාපනේ සෑම තැනම කැඳවා ගෙන ගියා. නාගදීපයට පවා ගෙන ගියා. මට මතකයි ඩෙල්ෆ්ට් දූපතට පවා අපි බෝට්ටුවෙන් ගිය බව. අපි මෙහාට ඇවිල්ලා කිරමලෙන් හොඳට නෑවා. ඒ අවස්ථාවේ මට පෙණුනා මෙ ස්ථානය හුඟක් අබලන් තත්ත්වයකට පත්වී තිබෙනවා.

ඊට පසුවත් කිහිප විටක්ම අපි මෙහාට ආවා. ඒ හැම අවස්ථාවෙම ආවෙ එස්. පී. සින්නතුරේ මහතා සමගයි. ඒ ගමන් වලදී මා එක අධිෂ්ඨානයක් ඇතිකර ගත්තා ; යම් දවසක මෙ ස්ථානය දියුණු කරන්න පුළුවන්කමක් තිබුණොත් මෙ ස්ථානය ඉතාමත්ම දර්ශනීය තැනක් බවට පත් කරනවාය කියා.

1966 දි ඩඩ්ලි සේනානායක මහතාගේ ප්‍රධානත්වයෙන් එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් පිහිටෙව්වා තමුන්නාන්සේලාට මතකයි. ඒ ආණ්ඩුවෙ මම පළාත් පාලන උප ඇමති හැටියට පත්වුණා. ඊට පස්සේ 1968 දි පළාත් පාලන ඇමති හැටියට පත්වුණා. අර හතළිස් ගණන්වල මට ඇතිවුණු අධිෂ්ඨානය ක්‍රියාත්මක කරන්නට මට ඒ අවස්ථාවෙ දි පුළුවන් වුණා.

ඔය පොකුණුවල තිබුණු ගල් ඔක්කොම කැඩිලා බිඳිලයි තිබුණෙ. ඒවා ඔක්කොම නියම විධියට සකස් කර අපි හඳුන්නට පටන් ගත්තා පළාත් පාලන අමාත්‍යාංශයේ මාර්ගයෙන්. ඒ වාගේම අතන දකින්නට ලැබෙන මණ්ඩපයත් ඒ වෙලාවෙම සකස් කළා. ඊට පසු මේ වාරයේදී මේ දියුණුව ඇති කිරීමට මම නියම කළා.

මම ඉතාම සතුටුයි කියන්නට පළාත් පාලන දෙපාර්තමේන්තුවත්, ඒ වාගේම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවත්, මේ විශේෂ කොමසාරිස්තුමා ඇතුළු හැමදෙනාමත් එකතුවී ඉතා ලස්සනට මේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා. මේ ස්ථානය, විශේෂ කොමසාරිස්තුමා කිව්වා වාගේ ඉතාමත්ම දකුම්කළු පූජනීය ස්ථානයක්. එතුමා කී විධියට මේ ස්ථානය අපි වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වෙනවා.

ඒ විධියට කල්පනා කර බැලුවොත් ලංකාව පුරාම ඉතාමත්ම දකුම්කළු ස්ථාන තිබෙනවා. ඒ වාගේම මේ පොකුණුවල ජලය සම්බන්ධයෙන් තමුන්නාන්සේලා දන්නා දෙයක් තමයි මේ ජලයේ පුදුම විධියේ ගුණයක් තිබෙන බව—මා තමුන්නාන්සේලාට ඒක අමුතුවෙන් කියන්නට වුවමනා නැහැ. මේ ගැන අද මේ රටේ පමණක් නොවෙයි, ලෝකයේ වෙනත් රටවලින් මෙහාට එන කවුරුත් පිළිගන්නා දෙයක්. මේ ස්ථානයේ මේ පොකුණු පමණක් නොවෙයි, පූජනීය ස්ථාන කීපයකුත් තිබෙනවා. තමුන් නාන්සේලා පිළිගන්නවා ඇති මේ මහා මුහුදට කිට්ටුව පිහිටා තිබෙන මේ ස්ථානය අපි ඊට උචිත අන්දමින් සංවර්ධනය කළයුතු බව.

සහෝදර සහෝදරියනි, අපේ රජය බලාපොරොත්තුවන්නේ මේ විධියට රට පුරාම දියුණු කළයුතු තැන් තිබෙනවා නම් ඒවා නොපිරිහෙළා දියුණු කිරීමටයි. මේ ලංකාවේ මුළු මහා පොළොවම අපේ ගෙදර පොළොව වාගෙයි අපි සළකන්නේ. එහෙම කල්පනා කරළා අපි වැඩ කළොත් අපට මේ රට දියුණු කර ගැනීම ඒ තරම් අමාරු වන්නේ නැහැ. අපි කවුරුත් කල්පනා කරන්න ඕනැ මේ මුළු රටේම ජනතාව හැටියට.

අපි පදිංචි ප්‍රදේශයට පමණක් සීමාවෙන්න ඕනැ කියලා අපි එකිනෙකා කල්පනා කළොත්, අපි උපන් ප්‍රදේශයට පමණක් සීමා වෙන්න ඕනැ කියලා කල්පනා කළොත් ඒ එක්කම අපේ සිතුවිලිත් පටුවෙනවා, කොටුවෙනවා. අපි කවුරුත් කල්පනා කරන්නට ඕනැ අපේ හදවත පළල් අන්දමින් දියුණු කර ගන්නට. අපේ හදවත් වලට මේ සමාජයේ හැම අංශයක්ම යොමුවෙන විධියට අපි අපේ හදවත් දියුණු කර ගන්නට උත්සාහ කරන්න ඕනැ. ආගම ධර්මයෙන් අපට උගන්වන්නෙත් ඒකයි.

මනුෂ්‍යයා එක එක තැන්වලට කොටු වුනොත්, වෙන් වුනොත්, එතැන මනුෂ්‍ය කමක් ඇතිවෙන්නෙ නැහැ. මනුෂ්‍ය හදවතට මේ මුළු විශ්වයම ඇතුළත් වෙන්නට ඕනැ. මනුෂ්‍යයා ස්වභාව ධර්මය අනුව ජීවත්වෙන්නට

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

කල්පනා කරන්නට ඕනෑ. තමුන්නාන්සේලා දන්නවා මේ මහ පොළව කවදවත් අපිව උස්සාගෙන ඉන්න බැරිය කියා නැහැ. මේ මහ පොළොව කවදවත් කියන්නෙ නැහැ. "උඹ අර ජාතියට, මෙ ජාතියට අයිතියි, අර ආගම, මේ ආගම අදහනවා. ඒ නිසා උඹව උසුළාගෙන ඉන්න බැහැ" කියා, මේ මහ පොළවට ඕනෑ කෙනෙකු උසුළාගෙන ඉන්න පුළුවන් කමක් තිබෙනවා. අපිත් ඒ වාගේ වෙන්න ඕනෑ.

අපි කල්පනා කරන්නට ඕනෑ ඉර, හඳ වාගේ ජීවත් වෙන්න. හිරු කාටත් පොදුවේ රශ්මිය බෙදනවා. සඳ කාටත් පොදුවේ රැස් විහිදවනවා. සුළඟ වාගේ ජීවත් වෙන්න අපි කල්පනා කරන්න ඕනෑ. මේ ස්වාභාවික සම්පත් කවදවත් කිසිම වෙනසක්, වාදයක්, භේදයක් සලකන්නේ නැහැ.

ස්වභාව ධර්මයා වාගේ, මහජනයා ජීවත් වෙන්න ඕනෑ. මහජනයාට ස්වභාව ධර්මයේ ආශිර්වාදය ලැබෙන්නේ එතකොටයි. තමුන්නාන්සේලා දන්නවා ස්වභාව ධර්මයේ පිහිට නැතිව මහජනයාට කිසිම දෙයක් කරන්නට බැරි බව. නියි කලට වැස්ස ආවෙ නැත්නම්, නිසි කලට අව්ව පැව්වෙ නැත්නම්, නිසි අන්දමට පොළව සරු වුණේ නැත්නම්, නිසි අන්දමට සුළං හැමුවෙ නැත්නම්, මහජනයාට කවදවත් නිසි විධියට ජීවත් වෙන්න බැහැ.

ස්වභාව ධර්මයේ ආධාර ලබා ගන්නට වුවමනා නම්, අපිත් ස්වභාව ධර්මයා වාගේ ජීවත් වෙන්නට ඕනෑ. එතකොට තමයි අපිට නිසි කලට වැසි වසින්නේ. භව භෝග සම්පත් ඇති වන්නේ. අපි සියළුදෙනාටම ප්‍රයෝජනවත් ජීවිත ගත කරන්නට පුළුවන් වෙන්නේ.

මම මීට වඩා මේ අවස්ථාවේදී කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. විශාල මැති ඇමතිවරු පිරිසක් අද මෙහාට පැමිණ තිබෙනවා. එතුමන්ලා විශේෂයෙන්ම සතුටු වෙනවා ඇති මෙහි ඇතිවී තිබෙන දියුණුව ගැන.

අපි සියළුදෙනාම එකතුවෙලා මහජන ආධාරත් ලබාගෙන—විශ්‍රාම ශාලා පහසුකම් වැනි අවශ්‍යතා සපුරා ගැනීමට ක්‍රියා කරමු යයි මතක් කරමින් අද මෙහාට පැමිණි අප සාදරයෙන් පිළිගැනීම ගැන තමුන්නාන්සේලා සියළුදෙනාටම ස්තුති කරමින් මගේ කථාව මෙයින් සමාප්ත කරනවා.



# උඩුප්පිඩ්ඩි ඡන්ද කොට්ඨාශයේ 'රාජග්‍රාමම්' ආදර්ශ ගම්මානය විවෘත කිරීමේ උත්සවයේදී අග්‍රාමාත්‍ය ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමන් විසින් කරන ලද කථාව

1981 ජනවාරි 31

අද අපි මෙ විවෘත කෙරුවෙ හැත්තෑ පස්වෙනි ආදර්ශ ගම්මානයයි. එය යාපනය දිස්ත්‍රික්කයේ උඩුප්පිඩ්ඩි කොට්ඨාශයේ විවෘත කරන්නට ලැබීම ගැන මම ඉතාමත්ම සන්තෝෂ වෙනවා.

මා ඒ ගැන විශේෂයෙන් සන්තෝෂ වෙන්නේ පැගී සිටින ජනතාවක් මෙ ආදර්ශ ගම්මානය නිසා නගා හිටුවීමට පුළුවන් වීම නිසයි. අපේ ආදර්ශ ගම්මාන වැඩපිළිවෙළ යටතේ මෙ කාර්යය කිරීමට අපට උදව් උපකාර කළ හැම දෙනාටම මගේ කෘතඥතාවය පිරිනමන්නට කැමැතියි.

මෙ ආදර්ශ ගම්මාන වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්න කියා අපි කියපු වෙලාවෙ මේ ප්‍රදේශයේ, යාපනය දිස්ත්‍රික්කයේ දිසා ඇමති හැටියට සිටියේ අද මෙ දිසාවෙ දිසා ඇමති නොවුනත්, වෙනත් දිසාවක දිසා ඇමති හැටියට ඉන්නා ඒ. ආර්. මන්සූර් ඇමතිතුමයි.

එතුමා තමුන්නාන්සේලාගේ මන්ත්‍රී, රාසලිංගම් මහතා සමග සාකච්ඡා කර ඒ මන්ත්‍රීතුමාගේ අදහස අනුව, මෙ ස්ථානයේ, මෙ ගම්මානය නිර්මාණය කරන්නට නිර්දේශ කළා. ඒ වාගේම මෙ වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යන්න එද හිටපු දිසාපති, ලයනල් ප්‍රනාන්දු මහතාත්, ඒ වාගේම අපේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රාදේශීය කළමනාකාර මහතා ඇ තුළු මගේ අමාත්‍යාංශයේ සියළුම නිළධාරීනුත් බොහොම මහන්සි වෙලා වැඩ කළා.

දැන් සිටින දිසා ඇමති යූ. බී. විජේකෝන් මහතාත්, දැනට සිටින දිසාපති තුමාත්, මෙ කටයුත්ත ඉදිරියට ගෙන යන්නට මහන්සි වෙලා ක්‍රියා කළා. මෙ ග්‍රාමය මෙ තරම් සාර්ථක අන්දමින් නිම කරන්නට පුළුවන් වුණේ සෑම අංශවලින්, දෙපාර්තමේන්තු වලින් ලැබුණු සහයෝගය නිසයි.

මෙ ගමෙ ජිවත්වන ජනතාව දුගී දුප්පත්කමෙ අන්ත පාතාලයේ සිටින පිරිසක්. තමුන්නාන්සේලාට අදත් දකින්නට ලැබුණා මොන විදියේ කුඩා පොල් අතු මඩුවලද ඔවුන් ජීවත් වුණේ කියා. ඔවුන්ට කිසිම සෞඛ්‍ය

පහසුකමක් තිබුණෙ නැහැ. ඔවුන්ට නූතන පහසුකම් කිසිවක් තිබුණෙ නැහැ. එවැනි පිරිසක් අද අළුත් ජීවිතයක් ආරම්භ කරනවා දකින්නට ලැබීම ඓතිහාසික සිද්ධියක්. අපේ ආණ්ඩුවේ ප්‍රතිපත්තියත්, දර්ශනයත්, වැටී සිටින ජනතාව නගා සිටුවීමයි.

අපේ රටේ ජනතාව දීර්ඝ කාලයක් පැගී සිටිය ජනතාවක්. ඒ බව තමුන් නාන්සේලා දන්නවා. විදේශිකයන්ට පමණක් නොවෙයි, ස්වදේශික යන්ටත් ඔවුන් පෑගුණා. ඈත පිටිසර ගම්මානවල එසේ පෑගී, මිරිකී සිටි ජනතාව නගා සිටුවන්නට වැඩපිළිවෙළක් තිබුණේ නැහැ. අද රට පුරාම ඒ ජනතාව නගා සිටුවන්නට අළුත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා.

ඒ වැඩපිළිවෙළ ආරම්භ වුණේ 1977 න් පස්සෙ, අපේ ශ්‍රීමත් ජනාධිපති තුමාගේ නායකත්වයෙන් මේ පාලනය පිහිටෙව්වාට පස්සෙ. මුළු රටම එකම ඒකකයක් හැටියට අරගෙන, ජාතිය, ආගම, කුලය, පංතිය, ප්‍රදේශය ආදිය ගැන බලන්නෙ නැතුව ; සේවය අවශ්‍ය කොතැනට ද එතැනට සේවය දීම අපේ අළුත් ආණ්ඩුවේ වැඩපිළිවෙළ බව දූන් සියළුදෙනාම දන්නවා.

ඒ නිසා තමුන්නාන්සේලාට මම කියන්නට කැමතියි අද මේ රටේ අළුත් යුගයක් ආරම්භ වී තිබෙන බව. ඒ යුගය ආරම්භ වුණේ 1977 න් පස්සෙ. තමුන්නාන්සේලා ඒ යුගයට අද එක් වී සිටිනවා. මේ වැඩපිළිවෙළ යටතේ අපි පක්ෂ භෙදයක් සළකන්නේ නැහැ. ඕනෑම කෙනකුට තමන් කැමැති දේශපාලන දර්ශනයක් අදහන්නට පුළුවන්. තමන් කැමැති දේශපාලන සංවිධානයකට බැඳෙන්නට පුළුවන්. අපි කිසිම කෙනකුට අවහිරයක්, ගිරිහැරයක්, කරදරයක් කරන්නේ නැහැ.

හැබැයි, කුමන දේශපාලන දර්ශනයක් වුනත්, කුමන දේශපාලන සංවිධානයක් වුනත් ඉතාමත්ම වැදගත් ප්‍රතිපත්ති කිහිපයක් තුළ එය ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. රටේ ජනතාවගේ සර්වජන ඡන්ද බලය ආරක්ෂා විය යුතුයි. හිංසාවට තැනක් නොතිබිය යුතුයි. රටේ ජීවත්වන ජනතාවගේ මානුෂික අයිතිවාසිකම් ආරක්ෂා විය යුතුයි. තමන් කැමැති ආගමක් ඇදහීමට හැම කෙනකුටම නිදහස තිබිය යුතුයි. තමන් කැමැති භාෂාවක් කථා කරන්නට, ඒ අනුව ක්‍රියා කරන්නට පුළුවන්කම තිබිය යුතුයි. මෙන්න මේ මූලික පදනම ආරක්ෂා විය යුතුයි. රටේ තිබෙන නීතිය හැම කෙනකුටම පොදු විය යුතුයි. එම නීතියට කවුරුත් අවනත විය යුතුයි, කොයිතරම් උසස් කෙනෙකුට වුනත්, කොයිතරම් අහිංසක කෙනෙකුට වුනත්, නීතිය හමුවේ සමානව පෙනී සිටීමට පුළුවන් කමක් තිබෙන්නට ඕනෑ.

මෙන්න මේ ප්‍රතිපත්ති තුළ ඕනෑම දේශපාලන මතයක්, ඕනෑම දේශ පාලන සංවිධානයක්, ක්‍රියාත්මක වීමට අපි අපේ අළුත් ආණ්ඩු ක්‍රම පත තෙන් අවකාශ සළසා තිබෙනවා.

තමුන්නාන්සේලාට එහෙම නම් පෙනෙයි, රටේ ජනතාවගේ ශුභ සිද්ධියට වැඩ කරන්න යම් කෙනෙක් ලෑස්ති නම්, ඒ උදව්යට ඔනෑ විධියට සංවිධාන ඇතිකර ගැනීමට නිදහස අද තිබෙන බව.

නීතිය කඩන්නේ නැතිව, හිංසාවට පෙළඹෙන්නේ නැතිව, මිනිස් අයිතිවාසිකම් විනාශ නොකර, ඕනෑම වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට අද නිදහස තිබෙනවා. එසේ නැතිව හිංසාවෙන්, ලේ හැලීමෙන්, මිනී මැරීමෙන්, ගිනි තැබීමෙන්, මිනිසුන්ගේ අයිතිවාසිකම් නැති කිරීමෙන්, රටේ ජනතාවට කන්න බොන්න, ඉන්න හිටින්න තැන් නැතිවෙන හැටියට දමරිකකම් කිරීමෙන්, යම්කිසි දේශපාලන පරමාර්ථයක් ඉටුකර ගන්නට යම්කිසි කොටසක් කල්පනා කළොත් ඒක කණගාටුදයක වැරදීමක් බව මා මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්නට කැමතියි.

මිනිසුන්ගේ ජීවිත අනික් හැම දේකටම වඩා වටිනා බව සලකන රජයක් අද තිබෙන්නේ. රටේ ජනතාව විවිධ ජාතිවලට අයිති, විවිධ ආගම් අදහන, විවිධ භාෂාවන් කථා කරන අයයි. නමුත් ඒ හැම දෙනාටම තිබෙන්නේ එක හා සමාන අයිතියක් බව පිළිගන්නා රජයක් එක්සත් ජාතික පක්ෂ රජය.

මේ රටේ ජීවත් වන හැම මනුෂ්‍යයකුටම නිදහසේ ජීවත් වෙන්නට අයිතියක් තිබෙනවා. රැකී රක්ෂා කරන්නට අයිතියක් තිබෙනවා. තමන්ගේය කියා ගෙයක් දොරක් හිමි කර ගන්නට අයිතියක් තිබෙනවා. මේ රජය උත්සාහ කරන්නේ ඒ අයිතිය තහවුරු කරන්නයි.

මේ පසුගිය අවුරුදු තුන ඇතුළතදී මේ මා කී ප්‍රතිපත්ති කොයිතරම් දුරට අපි ගෙන ගියාද කියා තමුන්නාන්සේලා දන්නවා. අපි උත්සාහ කළා මේ අවුරුදු තුන ඇතුළතදී රටේ සාමය, සංවරය ආරක්ෂා කරන්නට. අපට ඕනෑ කරනවා මේ රටේ ජීවත්වෙන හැම දෙනාම එක අම්මගෙ දරුවො වගේ ජීවත්වෙනවා දකින්නට. ඒනිසා තමයි අපි මෙහාට ආවේ. අපේ මැති ඇමතිවරු රාශියක් ආවෙ. අපි මේ ප්‍රදේශයට ආවෙ පාලකයින් හැටියට නොවෙයි. අපි මෙහාට ආවෙ අපේ නෑදෑ මිත්‍රයන්ගේ සැප දුක් බලාගෙන යන්නට එන සුහද පිරිසක් හැටියටයි.

තමුන්නාන්සේලාගේ දුක අපේ දුකයි. තමුන්නාන්සේලාගේ සැපත, අපේ සැපතයි. අද බලන්න, මේ රැස්වීමේ දී අපේ දිසා ඇමති විජේකෝන් මහතා කථා කළේ මොන භාෂාවෙන්ද ? බොහොම මහන්සියෙන්, උත්සාහයෙන් එතුමා කථා කලේ තමුන්නාන්සේලාගේ භාෂාව වන ද්‍රවිඩ භාෂාවෙන්. මොකක්ද එයින් එතුමා ප්‍රදර්ශනය කළේ ? තමුන්නාන්සේලා කෙරෙහි තිබෙන ගෞරවයයි. මේ විධියට තමයි අපේ සහෝදරත්වය වැඩිදියුණු කරගන්නට තිබෙන්නේ.

මම මේ අවස්ථාවේ එක්තරා ආරාධනාවක් කරන්නට කැමතියි. තමුන්නාන්සේලාගේ 'මන්ත්‍රී රාසලිංගම් මැතිතුමාට ආරාධනාවක් කරන්නට කැමැතියි. ලංකාවේ සිංහල පලාතකට ඇවිත්, අමාරුවෙන් හරි, ලියාගෙන හරි, සිංහල භාෂාවෙන් කථාවක් පවත්වන හැටියට මම එතුමාගෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා. මම විශ්වාස කරනවා එතුමාට දේශපාලන වශයෙන් එයින් පැඩුවක් නොවේය කියා. එහෙම පැඩුවක් වුනොත් එතුමාට අපේ ගෙවල් දොරවල් විවෘත කර දෙන්නට ලෑස්ති බව මම ප්‍රකාශ කරන්නට කැමතියි.

සමහරවිට එතුමාව ඉන්න ගෙදරින් එළියට පන්නන්න පුළුවන්. එදට බයවෙන්න එපා, ගෙයක් නැතැයි කියා. ඊට වඩා හොඳ ගෙයක් අපි විවෘත කර දෙන බව මම එතුමාට කියන්නට කැමතියි. මා ඒ ආරාධනාව එසේ කළේ වෙන කිසිවක් නිසා නොවෙයි, මෙ රටේ ජනතාවන් තුළ, හැම කොටසකම ජනතාවන් තුළ, සම්බන්ධතාවය තවදුරටත් දියුණු විය යුතු නිසයි.

අපට තවදුරටත් පුළුවන්කමක් නැහැ, වෙන්වෙලා, බෙදිලා, ජීවත් වෙන්නට. අපි සියළුදෙනාම එක රටේ ජනතාව. අපි සියළුදෙනාටම තිබෙන්නේ එකාකාර ප්‍රශ්න. අපි කථා කරන භාෂාව වෙනස් වෙන්නට පුළුවන්. අපේ සිරිත් විරිත් වෙනස් වෙන්නට පුළුවන්. අපි අදහන ආගම වෙනස් වෙන්නට පුළුවන්. අපේ ජාතිය, කුලය, වෙනස් වෙන්නට පුළුවන්. නමුත් අපි සියළුදෙනාම මනුෂ්‍යයෝ. අපි සියළුදෙනාම මේ ශ්‍රී ලංකාවේ උරුමක්කාරයෝ. අන්න ඒ විධියට කල්පනා කරලා අපි සියළුදෙනාම මහන්සියෙන් වැඩ කළොත්, අපට මීට වඩා වාසනාවන්ත ලංකාවක් නිර්මාණය කරන්නට පුළුවන් වෙයි.

තමුන්නාන්සේලා හැමදෙනාටම ශුභ පතමින්, මේ රාජ ග්‍රාමයේ ජීවත්වෙන ජනතාවගේ ජීවිතයන් වඩවඩාත් සෞභාග්‍ය සම්පන්න වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව මෙයින් සමාප්ත කරනවා.



## උඩුප්පිඩ්ඩි මැතිවරණ කොට්ඨාශයේ ඉදිකළ "රාජග්‍රාමම" ආදර්ශ ගම්මානය විවෘත කිරීමේ උත්සවයේදී යාපනය දිසා ඇමැති යූ. බී. විජේකෝන් මැතිතුමා කළ කථාව

1981 ජනවාරි 31

අපගේ කාර්යශූර ගරු අග්‍රාමාත්‍යතුමාගේ ගමුදාව වැඩ පිළිවෙල යටතේ යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රථම ආදර්ශ ගම්මානය සාර්ථක ලෙස ඉදි කිරීමට ක්‍රියාකළ සැම නිලධාරින්ටත්, සෙසු අයටත් ප්‍රථමයෙන්ම මගේ ස්තුතිය පුදකළ යුතුයි. මෙම ආදර්ශ ගම්මානය ඉදි කිරීමේදී එක් එක් අවස්ථාවල මෙම නිලධාරින්ට විඳින්නට සිදුවූ දුෂ්කර තත්වයන් ගැන මා පුද්ගලිකව දන්නවා. සමහර අවස්ථාවලදී ඒ අයව ආරක්ෂා කර ගන්නට පොලිසියේ ආධාරයත් ලබා ගන්නට සිදුවුනා. අපගේ ගරු අග්‍රාමාත්‍යතුමා අතින් අද දින විවෘත කරනු ලබන " රාජග්‍රාමම " 75 වෙනි ආදර්ශ ගම්මානය යි.

යාපහුව ආසනයේ බඩල්ගම නමැති ගම්මානයේ උදගම් සංකල්පය උදර ලෙසින් ආරම්භ වුනා. මෙ රටෙ ජිවත්වන දුප්පත් මහජනතාවට උසස් ජිවන තත්ත්වයක් අප විසින් සලසා දිය යුතුයි. මෙ සඳහා ඒ අයට නිවාස පහසුකම්ද, ජීවත්වීමෙ මාර්ග හා අනිකුත් පහසුකම්ද සලසා දිය යුතුයි. ආර්ථික, සමාජීය, සංස්කෘතික හා ආගමික අතිනුත් දියුණුවක් ඇතිකරවාලිම මෙම සංකල්පයේ අන්තර්ගතවී තිබෙනවා. මිනිස් නිදහස, දේශපාලන නිදහස, ආර්ථික නිදහස, ආර්ථික සංවර්ධනය හා සංවරශිලී සහජිවනය යනාදිය ධර්මිෂ්ඨ සමාජ ක්‍රමයක් ගොඩනැංවීමට ඉතාමත්ම අත්‍යාවශ්‍යයි. මෙම උසස් බලාපොරොත්තුව ඇතුවයි ගරු අග්‍රාමාත්‍යතුමා මෙ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන්නෙ.

අපෙ රටත්, අප රටෙ මහජනතාවත් නැවත වරක් කිසි කෙනෙකුට වහල් නොවී, එඩිතර ලෙස ජිවත් කරවන්නට අපට පුළුවනි. අප තුළ තිබෙන්නාවූ වහල් ගතිගුණ අප අතරින් තුරන් කරගත යුතුයි. අපගේ මෙම වැඩ පිළිවෙල පටන් ගත්තේ මහජනයාට හොඳ නිවාස ලබා දෙන්නට පමණක් නොවෙයි. අප අතරින් තුරන්වී යන ආත්ම විශ්වාසයත්, පරිත්‍යාගශිලි භාවයත්, සංවර ගතියක් ආරක්ෂා කොට, වහල් ගතිගුණ තුරන් කිරීමටත්, අපි උත්සාහ කරනවා. ජාති භේද, කුල භේද හෝ ආගම් භේද ගැන නොතකා

සමගියෙන් හා සමාදනයෙන් නිදහස් සමාජවාදී සමාජයක් බිහි කිරීමටයි අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, අපගේ රජයත් ක්‍රියා-කරගෙන යන්නෙ.

නිරෝගිභාවය, බුද්ධිමත්කම, ආරක්ෂාව සහ කථා කිරීමේ, අදහස් ප්‍රකාශ කිරීමේ හා රැස්වීමේ නිදහස යනාදී මූලික නිදහස තහවුරු කරවාලීම සමාජයක වැදගත්ම කාර්යයක් වෙනවා. ජාති භෙදයත්, ජාතින් අතර අසමගිතාවයත් තිබෙනතාක් මෙකී නිදහස අපට ලබාගන්නට පුළුවන් වෙන්නේ නැහැ. එමනිසා මේ කර්තව්‍යයට ඔබ ගැමගේ ආධාරය හා සහයෝගය අපගේ ජනාධිපතිතුමාට අවශ්‍ය වෙනවා. අප රටේ මහජන තාවගේ පුරෝගාමියෙක් හැටියටත්, නියමුවෙක් හැටියටත් සිටින ජනාධිපතිතුමාගේ කාලය තුළදී, අපව බෙද භින්න කරන්නට තැත් කරන සෑම තර්ජනයක්ම සුණු විසුණු කර, නිදහස් සමාජවාදී සමාජයක් බිහි කිරීමට කටයුතු කිරීම අප කාගේත් යුතුකමක් වෙනවා. සමාජවාදී සමාජයක පුද්ගලික නිදහසත්, අයිතියත් ඉතා වැදගත් වෙනවා. සුළු ජාතින්ට ඇති වරප්‍රසාදය මෙයයි. සමාජවාදී සමාජයක විශේෂ ලක්ෂණය නම් සුළු ජාතින්ට අයිතියත්, සුභ සිද්ධියත්, ආරක්ෂාවත්, බහුතර ජාතිය විසින් ලබාදීමයි. එයේම සුළු ජාතියත් බහුතර ජාතියේ විශේෂ අයිතිවාසිකම් ගැනත් සැලකිල්ලක් දක්වන්නට ඕන. සෑම ජාතියකම යුතුකම මොනවා-දයි පිළිගෙන, අයිතිවාසිකමද අනුමත කළායින් පසු, ජනතාව අතරේ පවතින අසමගිකම් තුරන්වී යනවා ඇති. එවිට සුළු ජාතිකයකු දෙවෙනි පන්තියේ පුරවැසියෙක් හැටියට දකින්නට බහුතර ජාතියේ පුරවැසියන් කැමැති වන්නේ නැහැ. සිංහල පුරවැසියෙකුට තිබෙන සෑම අයිතිවාසිකමක්ම නිදහසේ භුක්ති විඳින්නට සෑම ද්‍රවිඩ පුරවැසියෙකුටම අවස්ථාව සැලසෙනවා.

මේ රටේ ජීවත්වන සිංහල ජනතාවත් ද්‍රවිඩ ජනතාවත් වෙන් කරන්නාවූ සමහර මූලික ප්‍රශ්නවලට යුක්තියහගත විසඳුමක් ඇති කරන්නට ජනාධි-පතිතුමා දක්වූ කැමැත්ත, 1978 දී අපගේ රජයෙන් සම්පාදනය කළ නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන් පැහැදිලිව පෙනී යනවා. ද්‍රවිඩ භාෂාව ජාතික භාෂාවක් හැටියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර තිබෙනවා පමණක් නොවෙයි, සෑම දේශපාලන පක්ෂයක්ම කිසිම විරුද්ධත්වයක් නැතුව මෙය පිළිගත්තා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති ආකාරයට එය ක්‍රියාවට යෙදවීම ශ්‍රී ලංකාවාසී අපි හැමදෙනාටම භාරවූ කර්තව්‍යයක්.

මෙම තත්ත්වය පිළිගෙන තහවුරු වූවායින් පසුව, සමාජවාදී සමාජයක සුළු ජාතින්ට හෝ වේවා, අන් කිසිවෙකුට හෝ වේවා, විශේෂ වරප්‍රසාද ලබාදීමට අවශ්‍යතාවයක් උද්ගත වන්නේ නැහැ. සුළු ජාතින් සඳහා ඉල්ලනු ලබන විශේෂ වෙන් කිරීම් හා ජනපද ව්‍යාපාර තරයේම හෙළා දැකිය යුතුයි. සමාජවාදී සමාජයක ජාති භේදයක් හෝ ආගම් භේදයක් නොතකා සෑම

පුරවැසියෙක්ම එකාමෙන් සැළකිය යුතුයි. කිසිම කණ්ඩායමක් හෝ කොටසක් විශේෂ වරප්‍රසාද ඉල්ලා රටේ ඒකීය භාවයට හානියක් ඇති කරන්නට බැහැ.

ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලින්ම පමණක් නොව, ශත වර්ෂ ගණනාවක් තිස්සේ අප මහජනතාවගේ ජීවන ක්‍රමතුලිනුත්, මෙ රට ඒකීය රාජ්‍යයක් හැටියට පැවතිගෙන එනවා. ආර්ථික උද්ධමනය, දිළිඳු භාවය, විදේශ ආක්‍රමණය යනාදි දුෂ්කරතාවයන් පැවැති කාලසීමාවලදීත් අප රටේ ඒකීය භාවය ආරක්ෂාවූ බව ඉතිහාසය පවා සාක්ෂි දරයි. මෙයට හේතුවූයේ අපි කවුරුත් පිළිපදින්නාවූ යුක්තිගරුක භාවය හා සංවරශීලීභාවයයි. සංග්‍රහ සත්කාර කිරීමට ශ්‍රී ලංකාවාසීන් දක්වන ලැදියාව ලෝ ප්‍රසිද්ධ දෙයක්. සැම පුරවැසියෙක් තුළම ඇති දයාව,සභ්‍යත්වය, නැණවත්කම, පැහැදිලි චින්තනය, සෙසු ජනතාවගේ හැඟීම් වටහා ගැනිම යනාදි ගුණාංගයන් මෙයට මූලික හේතුන් හැටියට අපට සලකන්නට පුළුවනි. ශ්‍රී ලංකාවේ සංවරශීලී සමාජය රට බෙදීමේ උත්සාහයට කවදත් විරුද්ධයි. අප රටේ ජාතින් අතරත් ආගම් අතරත් පවතින සුහදතාවයෙන්, අවුරුදු සිය ගණනක් තිස්සේ අපි සැවොම එක්සත්ව සමගියෙන් ජීවත්වූ බව පැහැදිලි වෙයි. 1958 සහ 1977 වර්ෂවල සිදුවූ අවාසනාවන්ත සිද්ධින්ට පසු-වත් දිගටම පවතින්නාවූ සම්බන්ධය හා සුහදතාවය ඉතාමත්ම ප්‍රශංසනියයි. කිසිම අසාධාරණයක් නැතිව මූලික අයිතිවාසිකම්වලට නිසි තැනදී ඒවා තහවුරුකර ඇති වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තරම් හොඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් මීට කලින් තිබුණේ නැහැ. මෙය සමගි සම්පන්නව ජීවත්වෙන මහජනතාවගේ සමාජයීය හා දේශපාලන අභිමතාර්ථයන් පැහැදිලි ලෙස පෙන්නුම් කරයි.

අවුරුදු සිය ගණනාවකට වැඩි කාලයක් තිස්සේ නිදහස් ඒකීයභාවයෙනුත් සමගියෙන් හා සාමයෙනුත් යොහොයුරන් ලෙස ජීවත් වූ මහජනතාවට වැරදි මාර්ගයක් පෙන්නා, රට බෙදීමෙ ඉල්ලීම ඉදිරිපත් කරන සුළු පිරිසකගේ ක්‍රියා දමය දැක අපි කණගාටු වෙනවා. බහුතර ජාතිය හෝ වේවා, සුළු ජාතිය හෝ වේවා, ඕනෑම කුලයකට හෝ ආගමකට අයත් පිරිසක් හෝ වේවා, වෙන් වෙන්ව ජීවත්වීමේ සැලැස්මක් ඒ අය ඉදිරිපත් නොකළ යුතුයි. එසේ සිදුවීමට කිසිම දවසක ඉඩක් ලැබෙන්නෙත් නැහැ.

සැම අසාධාරණ ක්‍රියාවක්ම අපි තරයේම හෙළා දකිනවා. සැම අසාධාරණ ක්‍රියාවක්ම සුණුවිසුණු කරලන්නට අපගේ එක්සත් ජාතික පක්ෂය හැකි සියළුම දෙයක්ම කරනවා. ඔබතුමන්ලාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සැමදෙනාම අපගේ රජයට විරුද්ධ අයවුවත්, උඩුප්පිඩි ආසනයේ පමණක් නොවෙයි, අනිකුත් සැම මැතිවරණ කොට්ඨාශයකම මෙවැනි ආදර්ශ ගම්මාන ඉදි කිරීමට අදහස් කර තිබෙනවා. මේ සැලැස්ම අපගේ හොඳහිත විදහාපාන කදිම ආදර්ශයක් බව ඔබ කවුරුත් පිළිගන්නවා ඇති.

අවසාන වශයෙන්, ඉතිහාස ගතවන මෙම උත්සවයට සහභාගි වූ ගරු අග්‍රාමාත්‍ය ආර්. ප්‍රේමදාස මැතිතුමාටත්, අනිකුත් අමාත්‍යවරුන්ටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත්, දිසා ඇමති වශයෙන් මගේ හෘදයංගම ස්තුතිය පිරිනමන අතර, මෙමඋත්සවය සාර්ථක කර ගැනිමට ක්‍රියාකළ සැම දෙනාට මත් මගේ ස්තුතිය පුද කරමින් මා නිහඩ වෙනවා.



ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

# උඩුප්පිඩ්ඩි ඡන්ද කොට්ඨාශයේ පිහිටුවන ලද "රාජග්‍රාමම" ආදර්ශ ගම්මානය විවෘත කිරීමේ උත්සවයේදී උඩුප්පිඩ්ඩි පාර්ලිමේන්තු මන්ත්‍රී වි. රාසලිංගම් මහතා විසින් කරන ලද කථාව

1981 ජනවාරි 31

යාපනේ දිස්ත්‍රික්කයට අයත් පළමුවෙනි ආදර්ශ ගම්මානය, ගරු අගමැති ආර්. ප්‍රේමදාස මැතිතුමන්ගේ අදහස අනුව නිමවී අද ගන්පොල්ල නගරයේ පළමුවෙනි විශාලතම වැඩ පිළිවෙල වශයෙන් දිළිසෙයි. ගන්පොල්ල නගරයේ ආරම්භකරන ලද මේ විශාලතම ව්‍යාපාරය සම්පූර්ණ වී " රාජ ග්‍රාමම " යන නමින් යාපනේ දිස්ත්‍රික්කයට අමුතු ආලෝකයක් ඇති කර තිබීම ගැන අපි සන්තෝෂ වෙනවා. එයේ ප්‍රීතිවීමට අමතරව මේ සභාවේ දහස් ගණන් ජනතාව රැස්වී සිටිනවා දකිනවිට, " රාජග්‍රාමම " ඉදිකිරීමේ අවශ්‍යතාවයත්, රාජග්‍රාමේ පරමාර්ථයත්, රාජග්‍රාමේ ජයග්‍රහණයත් කෙතරම දුරට සඵල වී තිබෙනවාද යන්නත් තමුන්නාන්සේලාට මා කියා දීම අවශ්‍ය නොවන බවයි පෙනෙන්නේ.

දේශපාලන වශයෙන්, මා බැඳී සිටින පෙරමුණ ආණ්ඩුපක්ෂයත් සමග අදහස් අතින් වෙනස් වී සිටියත් දෙමළ විමුක්ති එක්සත් පෙරමුණේ සභික යෙක් වශයෙන්, එම පෙරමුණේ කාරක සභාවේ අනුමැතියත් ලබාගෙන මෙම උත්සවයට සහභාගිවීම හා මහගු සේවයක් ඉටුකළ ගරු අගමැති තුමාව පිළිගැනීම මගේ වැදගත් යුතුකමක් යන්න කවුරුත් පිළිගන්නවා ඇති. එමනිසා, මේ මහා සභාවේ මගේ අදහස් කීමට කැමතියි.

අද දින යාපනේ දිස්ත්‍රික්ක ඉතිහාසයේ ඉතා වැදගත් දිනයක්. රන් අකුරින් ලියවිය යුතු මංගල දවසක්. මක්නිසාද කියතොත් අද තමයි මේ දිස්ත්‍රික්කයේ පළමුවන ආදර්ශ ග්‍රාමයක් බිහි වෙන්නේ. ඒ ආදර්ශ ග්‍රාමයයි ඔබ ඉදිරියේ පෙනෙන ලස්සන රාජග්‍රාමම.

කාලාන්තරයක් තිස්සේ, සමාජ, ආර්ථික, අධ්‍යාපන තත්ත්වයන්ගෙන් කොන් වී, නොදියුණු තත්ත්වයේ සිටියාවූ "වදිරි" ගම්මාන ජනතාවට මෙවැනි වැදගත් ග්‍රාමෝදය වැඩ පිළිවෙලක් පහළවීම ගැන තමුන්නාන්සේලාත්, මාත් සන්තෝෂ නොවී සිටින්න බැහැ. ගෙයක් දොරක් නොමැතිව දුක් විඳින ගම්බද ජනතාවට මෙය වරප්‍රසාදයක්.

යමකිසි රටක් උසස් ජීවිතයක් ගත කරන්නට අදහස් කෙරේ නම්, ගම්වල පුනර්ජීවිතයක් බිහිවෙන්න ඕනැ. ගම්මානවල ප්‍රබෝධයක් ඇති වීමට නිවෙස්වල ප්‍රීතියත්, ප්‍රසන්න බවත්, සාමයත් තිබිය යුතුයි. එවිටයි රට සෞභාග්‍ය සම්පන්න වන්නේ. මෙය මනාසේ වටහාගත් ගරු අගමැතිතුමා ප්‍රීතියෙන් පිරී ඉතිරිගිය නිවෙස් පහළ කරවීමේ අරමුණ ඇතිව ග්‍රාමෝදය වැඩපිළිවෙලක් පුළුල් අන්දමින් සකස් කළා. මේ ගැන මුළු රටම එතුමන්ට හිස නමයි.

ගරු අගමැති ආර්. ප්‍රේමදාස මහතා මේ රටේ ජීවත්වන ලක්ෂ සංඛ්‍යාත සාමාන්‍ය ජනතාව අතරින් ජීවිතය පටන් ගත්තු කෙනෙක්. ගම් නියම්ගම් වල ගොවිතැනින් ජීවත්වන ජනතාවගේ උග්‍ර ප්‍රශ්නයක්ව පවතින ගෙවල් නැති ප්‍රශ්නය ගැන කල්පනා කොට ''රටේ කොඳු ඇටය ගමයි'', ''රටේ ජීවනාලිය ගම්වැසියයි'', ''ගමට ගරු කළොත් රට ගරුත්වය ලබයි'', ''නොදියුණු ගම්මුන්ගේ ජීවිතය නව එළියයි,'' ''නවෝදය පැතිරීමට නම් ගම්බද පරිසරයේ අමුත්තක් උදාවිය යුතුයි'' යන සත්‍යය හොඳට වටහා ගෙන ක්‍රියා කරන කෙනෙක් තමා අපේ ගරු අගමැති තුමා.

මෙවැනි පරිසරයක තමයි ''භාරති'' කවියා (සුබ්‍රමණියම් භාරති ප්‍රසිද්ධ ද්‍රවිඩ කවියෙකි) දුටු නව සමාජය,බියෙන්, මුළාවෙන් තොර සමාජය–නිවහල් නිදහස් සමාජය–මේ රටේ නගා සිටුවීමට පුළුවන් වන්නේ. ගරු අගමැති තුමා මෙය හොඳ හැටි වටහා ගෙනයි ඉන්නේ.

වර්තමාන ග්‍රාමෝදය ව්‍යාපාරය, ඉඩම් නැති ජනතාවට ඉඩම් ලබාදී ඔවුන්ට ජීවත් වන්නට මහ සැලසූ මහාත්මා ගන්ධි, විනෝබාජී යන නායකයින්ගේ භූදාන් ව්‍යාපාරයට සමාන එකක්. භූදාන් ව්‍යාපාරයේ ඵලදායි ප්‍රතිඵලය දැක එය කෙරෙහි විශ්වාසය තැබූ ගරු අගමැතිතුමා ග්‍රාමෝදය ව්‍යාපාරයක් පටන් ගෙන තිබීම අප රටේ ජනතාවගේ වාසනාවක්.

තම හිසට වහලක් නැතිව නොයෙකුත් දුක් ගැහැට විඳින අප රටේ ජනතාව ගේ දුක් කඳුළු පිසදැමීමට එතුමා ගත්තාවූ විශාල වැඩදායි ආදර්ශ ගම්මාන වැඩ පිළිවෙල අප මධ්‍යයේ ක්‍රියාත්මකවී තිබීම අපට ඉමහත් ප්‍රීතියට කරුණක්. ඒ වෙනුවෙන් එතුමාට හදපත්ලෙන් ආසිරි පතනවා.

අවුරුදු කිහිපයකට පෙර, කොළඹ නගරයේ ජීවත්වූ දුප්පත් ජනතාව මත්පැන් නමැති රකුසාගේ ග්‍රහණයෙන් ගලවා ඔවුන්ට යහපත් ජීවිතයක් ගතකිරීමට මඟ පෙන්වා දුන්නා අපේ අගමැතිතුමා. අද දුගී ජනයාගේ ජීවිතය නවන් දියුණු කිරීමට ගෙවල් සහ පාරවල් තනාදීමට ඉදිරිපත්වීමෙන් ස්වකීය දේශානුරාගය මොනවට ඔප්පුකර තිබෙනවා.

මෙහි පිහිටුවා තිබෙන ග්‍රාමය සහ එහි සෞන්දර්යය දකින ගරු අගමැති තුමා, තම වැඩ පිළිවෙලේ සාර්ථකත්වයත්, ඒ ග්‍රාමය මහජනයාගේ සිත්තුළ ඇතිකර තිබෙන තෘප්තියත් ගැන සිතා ප්‍රීති සාගරයේ ගිලී සිටිනවා කියා මා සිතනවා.

මේ වැඩ පිළිවෙලේ නිර්මාතෘ වූ එතුමා අද මේ උත්සවයට සහභාගී වී, මෙම ගම්මානය උත්සවාකාරයෙන් විවෘත කිරීම ගැන අපි ඉමහත් සන්තෝෂයට පත්වෙනවා.

දිස්ත්‍රික්කයකට ආදර්ශ ගම්මානයක් යන වැඩපිළිවෙල යටතේ යාපනය දිස්ත්‍රික්කයට ගමක් ඉදිකිරීම සම්බන්ධයෙන් යාපනේ කච්චේරියේ රැස්වූ දිස්ත්‍රික් සම්බන්ධීකරන කමිටුව ඉදිරියේ "ගන්පොල්ල ගම" නිර්දේශ කළේ මායි. ද්‍රවිඩ නායකයෙක් වුත්, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ නායකයා වූත්, විපක්ෂ නායකවූත් ඒ. අමිර්තලිංගම් මහතාගේ ප්‍රධානත්වයෙන් යාපනේ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු එකොළොස් දෙනාම මගේ යෝජනාව එක්සිත්ව පිළිගත්තා. ඔවුන් සියලු දෙනාගේ සහයෝගයත් මෙම වැඩ පිළිවෙල සාර්ථකවීමට රුකුල්වුනා.

නෙල්ලියඩි සුළු නගර සභාවේ හදවතසේ ගන්පොල්ල ග්‍රාමය පිහිටා තිබුණත්, ඒ ගම දීර්ඝකාලයක් තිස්සේ සමාජ, ආර්ථික, අධ්‍යාපන, කලා, සංස්කෘතික අංශ අතින් නොදියුණු තත්වයකිනුයි තිබුණේ. යාපනේ දිස්ත්‍රික්කයේ ගම්වලින් ඉතාමත්ම අන්ත තත්වයේ ගම මෙයයි. මෙහි තිබුණේ පැල්පත් ගෙවල් පමණයි. හොඳ මංමාවත් පහසුකම් හෝ විදුලි පහසුකමක් හෝ සනීපාරක්ෂක වැඩපිළිවෙලක් හෝ නැතිව ඉතාමත් කනස්සලු තත්වයෙනුයි මේ ගමේ ජනතාව දිගුකලක් ජීවත් වුනේ. මේ ගමේ ග්‍රාමෝදය වැඩපිළිවෙල යටතේ ගෙවල් අසූපහක් නිර්මානය කර තිබෙනවා. තවත් එවැනි නිවෙස් දෙසීයක් තනන්ට ගරු අගමැතිතුමා ක්‍රියාකාරී වැඩපිළිවෙලක් සකස් කර තිබෙනවා. එයට අප කෘතඥ වෙනවා.

ගරු අගමැතිතුමාගේ ග්‍රාමෝදය වැඩපිළිවෙලේ දේශපාලනය ගැවී නැහැ. මහජනයාගේ අත්‍යාවශ්‍ය වුවමනාවන් ඉටු කරදීමයි එම වැඩපිළිවෙලේ අරමුණ. ජනතාවගේ ඕනෑ එපාකම සෙවීමත්, ඔවුන්ට සේවය කිරීමත් අපේ යුතුකම ලෙස මම සලකනවා. ගරු අගමැතිතුමාගේ ග්‍රාමෝදය ව්‍යාපාරය එක දිස්ත්‍රික්කයකට එක ගමක් වශයෙන් නොව ගම් දහයක් වී ක්‍රමයෙන් සියයක් වුවද වී දියුණු තියුණු වේවායි කියා මම ආසිරි පතන්නට කැමතියි.

මෙම ව්‍යාපාරය පටන්ගත්තු වෙලාවේ, එවකට දිසාපති වශයෙන් සිටි ලයනල් ප්‍රනාන්දු මහතාත්, මාත් ගන්පොල්ල ගමට ගොස් මෙම වැඩ පිළිවෙල සාර්ථක කරවන අදහසින්, එම ගම්මාන වාසීන්ගේ තත්වය පැහැදිලිවන ලෙස තේරුම්ගෙනයි මේ ගම ඒ සඳහා තෝරා ගත්තේ.


මෙය නිර්මානය කිරීමට අපට නොයෙක් අතින් උදව් උපකාර කළ එවකට උප දිසාපතිව සිටි ගුණනායගම් මහතාවද මෙ අවස්ථාවේදී මතක් කිරීම යුතුයි. එ වගේම මේ ව්‍යාපාරයට මුල්ගල් තබා එය නිසියාකාරව නිමකිරීමට

මහ සැලසුම් එකල යාපනේ. දිසා ඇමති වශයෙන් කටයුතු කළ ඒ. ආර්. මන්සූර් මහතාද මෙම උත්සවයට සහභාගිවීමට පැමිණ සිටීම අප කාගේත් සතුටට කරුණක් බව කියන්ට කැමතියි.

දැන් මේ වේලාවේ කළගුණ සැලකීම සම්බන්ධයෙන් අපේ ශ්‍රේෂ්ඨතම කිවිවරයකුවූ තිරුවල්ලුවර්ගේ කවියක් කියා මගේ කථාව අවසන් කරනවා.

"ගැළවීමට හැකිය—බිඳලුව නමුදු අන් ගුණ

කළගුණ නොනැසුවොත්—නොහැකිවේ ගැලවීම ලැබුමට"



## උඩුප්පිඩ්ඩි ඡන්ද කොට්ඨාශයේ "රාජග්‍රාමම්" ආදර්ශ ගම්මානය විවෘත කිරීමේ උත්සවයේදී උඩුප්පිඩ්ඩි පාර්ලිමේන්තු මන්ත්‍රී ටී. රාසලිංගම් මහතා විසින් ඉංග්‍රීසි භාෂාවෙන් පවත්වන ලද කථාව

1981 ජනවාරි 31

ගරු අග්‍රාමාත්‍යතුමනි, කන්පොල්ලෙයි ගම දිග ඉතිහාසයක් තිබෙන ගමක්. එසේම එය දීර්ඝ කාලයක් තිස්සේ නොසලකා හරින ලද ගමක්. සමාජයීය, ආර්ථික, අධ්‍යාපනික හා සංස්කෘතික යන හැම අංශයකින්ම ඊට තිබෙන්නේ නොසලකා හරිනු ලැබීමේ දිග ඉතිහාසයක්. ජනතාවගේ දියුණුවට මඳ වශයෙන් හෝ හේතුවන කිසිදු සංවර්ධනයක් මේ කිසිදු අංශයක සිදුවෙලා නැහැ. තත්ත්වය මෙසේ පවතිද්දී රටේ, මෙම පළාතේ නිවාස වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට ස්ථානයක් තෝරා ගැනීමේ අවස්ථාව අපට දෙනු ලැබූ විට මා යෝජනාවක් ඉදිරිපත් කළා. මෙම යෝජනාව පාර්ලිමේන්තුවේ සිටින ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් එකොළොස්දෙනා විසින් ඒකච්ඡන්දයෙන්ම පිළිගනු ලැබුවා. එම ඒකමතික බව ඇති වුනේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ලෙසට ද්‍රවිඩ ජනතාවගේ නියෝජිතයින් ලෙසට, එම මන්ත්‍රීවරුන්ට පොදුවේ එක් අවබෝධයක් ඇතිවීම නිසයි. එනම්, ඓතිහාසික හේතු නිසා පරම්පරාවෙන් පරම්පරාවට, අයුක්තියක් සිදුවී තිබෙන ද්‍රවිඩ ජනතාව අතර සිටින එක්තරා ජන කොටසකට දැන් එම අයුක්තිය වෙනුවෙන් යම් වන්දියක් ලැබෙන්නට සැලැස්විය යුතුය යන අවබෝධයයි.

ශ්‍රී ලංකාවට වර්ෂ 1948 දී නිදහස ලැබුණු නමුත් සමාජයීය, අධ්‍යාපනික, ආර්ථික හෝ සංස්කෘතික වශයෙන් එම නිදහසේ බලපෑමක් මෙම ජන කොටසට ඇතිවී නැහැ. එහි ඵල ප්‍රයෝජනයක් ඔවුන්ට අත්වී නැහැ. මීට ප්‍රධානම හේතුව මැතිවරණ කොට්ඨාශ බෙදා වෙන් කිරීමේ කොමිෂන් සභා විසින් මෙම ජන කොටසට දේශපාලන නියෝජනය අහිමිවන ආකාරයට මැතිවරණ කොට්ඨාශවල සීමා නිර්ණය කොට තිබීමයි. මෙරට දෙමළ ජනගහණයෙන් තුනෙන් පංගුවක් පමණම රීතියා ද්‍රවිඩ සුළුජන කොටස්වලින් හෝ රීතියා පීඩිත ජන කොටස්වලින් හෝ සමන්විත වන්නේ වී නමුත් ඡන්ද කොට්ඨාශ බෙදා වෙන්කිරීමේ කොමිෂන් සභාව විසින් දිගින් දිගටම

ඡන්ද කොට්ඨාශවල සීමා නිර්ණය කොට ඇත්තේ ඔවුන්ට සාමූහිකව තමන්ගේ අපේක්ෂකයෙකු මැතිවරණයකට ඉදිරිපත් කිරීම කිසිසේත්ම කළ නොහැකිවන අයුරු ඔවුන්ගේ ජනගහණය කොටස් වශයෙන් නොයෙක් ඡන්ද කොට්ඨාශවලට බෙදී යන ලෙසටයි.

වර්ෂ 1948 සිට 1977 දක්වාම මැතිවරණ තුළින් ඔවුන් නියෝජනය වන්නට සලස්වා ඔවුන්ගේ වුවමනා එපාකම් ඉටුකිරීමේ අවශ්‍යතාවය නොසලකා හැර තිබෙනවා. නිවාස වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීමට ස්ථානයක් තෝරා ගැනීමෙ අවස්ථාව මා හට ලබාදෙන ලද්දේ මෙසේ ඓතිහාසිකව සිදුව තිබෙන අයුක්තියට යම් තරමෙක වන්දියක් ලැබෙන්නට සලස්වනු පිණිසයි. ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබ තුමා, මෙම ගමේ මිනිසුන් කලින් ජීවත්වූ නිවාස, වත්මන් නව නිවාස හා සංසන්දනය කොට බලන විට මෙම ගම ආදර්ශ ගම්මානයක් බවට පරිවර්තනය කිරීමට ම විසින් තෝරා ගැනීමේ යුක්තිය වැටහෙන්නට ඇතැයි මා කල්පනා කරනවා. මෙ රාජග්‍රාමම් ආදර්ශ ගම්මානය ඇති කිරීම නිසා එහි ගම්වාසීන්ගේ එදිනෙදා ජීවිතයෙහි නව පරිච්ඡේදයක් ආරම්භවීම මට සහතිකයි. නව උද්‍යෝගයක්, නව ආත්ම විශ්වාසයක්, නව බලාපොරොත්තු පද්ධතියක්, නව ධෛර්යයක් හා නව අධිෂ්ඨානයක් ඇති නව පරපුරක් මෙ ගම හේතුකොටගෙන බිහිවන බව මට සහතිකයි. අප බලාපොරොත්තුවත්, පැතුමත් එයයි. ගරු අග්‍රාමාත්‍ය තුමනි, ඔවුන්ට නව අනාගතයක් ගොඩනගා ගැනීමේ කාර්යයෙහිලා ඔබතුමා අද මෙහි පැමිණීම මහත් ධෛර්යයක් වනු ඒකාන්තයි.

මෙම සුළු ද්‍රවිඩ ජන කොටස්වල අනාගතය ගොඩ නැංවීමෙහිලා සම්පූර්ණ කළයුතු ප්‍රධාන අවශ්‍යතා ටිකක් තිබෙනවා. විශේෂයෙන්ම අධ්‍යාපනයට සම්බන්ධව එබඳු අවශ්‍යතා ටිකක් තිබෙනවා. ප්‍රදේශ පදනම් කොට කැරෙන ප්‍රමිතිකරණය. රටේ අන් කවර තැනක හෝ ළමුන්ට වඩා අහිතකර අන්දමට, උතුරු ප්‍රදේශයේ ද්‍රවිඩ සුළුජන කොටස්වල ළමුන්ට බලපාන බව පෙන්නා දෙන්නට ඕනෑ. මෙසේ වීමට ප්‍රධාන හේතුව, මෙම ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉතාම දුර්වල හෙයින් ඔවුන්ට සිය දරුවන් ''හොඳ'' පාසල්වලට යැවීමට නොහැකිවීමයි. දුප්පත්කම නිසා සිය දරුවන් ගාස්තු අයකරන අමතර ඉගෙනුම් පන්තිවලට යැවීමට මෙම ජනයාට නොහැකියි. එහෙයින් මෙම දිළිඳු පවුල්වල ළමුන්ට පෝසත් පන්තිවල ළමුන් හා සම මට්ටමෙක සිට තරඟ කිරීමට අවස්ථාව ලැබෙන්නේ නැහැ. කිසියම් ප්‍රදේශයක් දියුණු ප්‍රදේශයක් ලෙස වර්ග කළ විට මෙම ළමයින් අතරමං වෙනවා. අප ජනතාවේ මෙම කොටසේ දරුවන්ට අධ්‍යාපනය දීමට හැකිවන අයුරින් ඔවුන්ට වඩාත් හොඳ අධ්‍යාපනික පහසුකම් සලසා දෙන ලෙස, මා මෙහි තරුණ පරපුරේ නාමයෙන් ඔබ තුමාගෙන් ඉල්ලා සිටිනවා.

මෙහි තිබෙන තවත් බැරෑරුම් ප්‍රශ්නයක් නම් ඉඩම් හිඟයයි. පළමුකොටම මා කියන්නට සතුටුයි මේ සියළුදෙනාම ඉඩම් අහිමි පුද්ගලයින් බව. ඔවුන් ජීවත් වන්නේ අනුන්ගේ ඉඩම්වල.

ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා—ඔබතුමාගේ රජය—පීඩිත ජනතාවගේ ශුභ සිද්ධිය අවංකවම ප්‍රාර්ථනා කරන්නේ නම්, ඉන්දියාවේ වරින්වර කරනු ලබන්නාක් මෙන් මෙම නොදියුණු ජන කොටස්වල ප්‍රශ්න හා ඓතිහාසික වශයෙන් ඔවුන්ට සිදුවී තිබෙන අයුක්තිය ගැන සලකා බලා ක්‍රියා කරන මෙන් ඉල්ලමි. ජනතාවගේ මූලික අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි ආරක්ෂා කොට තිබෙන බවත්, දියුණුවට සමාන අවස්ථාව සහතික කොට තිබෙන බවත්, නීතිය ඉදිරියෙහි සමානත්වය සලසා තිබෙන බවත් ඇත්තයි. එසේම පාර්ලිමේන්තු කොමසාරිස්වරයා ක්‍රියාකරන්නට පටන්ගත් විට මෙම මිනිසුන්ට තම දුක්ගැනවිලි ඔහුට ඉදිරිපත් කිරීමට හැකිවන බවත් ඇත්තයි. නමුත් මෙම ප්‍රශ්නය සලකා බලන විට මෙම ජනයාට අතීතයේදී සිදුව තිබෙන දේ සැලකිල්ලට ගැනීමත් අවශ්‍යයි. මෙම අසරණ ජනතාවට බලපාන මෙම ප්‍රශ්න කෙතෙක් දුරට ස්වාධීනව තේරුම් ගත හැකිද ? මෙම මිනිසුන් සමාජයීය, සංස්කෘතික හා ආර්ථික වශයෙන් දියුණු වූ තත්ත්වයක් එනතුරු ඔවුන් සිටින්නේ ළදරුවන්ගේ තත්ත්වයේයි. ළදරුවන්ට හැදුනු වැඩුනු මිනිසුන් හා තරඟ කරන්නට පුළුවන් කමක් නැහැ. මුහුකුරාගිය වැඩිහිටියන් බවට පත්වනතුරු ළදරුවන් ආරක්ෂා කළයුතුව තිබෙනවා. ආර්ථික අතින් දුබල තත්ත්වයේ සිටින අය සම්බන්ධයෙනුත් එලෙසම කරන්නට ඕනෑ. නොදියුණු තත්ත්වයේ සිටින යම් ජන කොටසක් වේ නම් ඔවුන් දියුණු වී ආර්ථික අතින් වැඩිහිටි තත්ත්වයට පත්වනතුරු ඔවුන් සොයාබලා ගැනීමත්, ආරක්ෂාකිරීමත් කළ යුතුයි.

මා ඔබතුමන්ට ඉල්ලීම් හූහක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නැහැ. මා කථා කරන්නේ මේ රටේ ආදී කාලයේ සිට මේ දක්වාම නියෝජනයක් ලබා නොමැති ජනතාවක් ගැනයි. ගරු අග්‍රාමාත්‍යතුමනි, මෙම මිනිසුන් පත්ව සිටින තත්ත්වය ඔබතුමන්ට තේරුම් ගැනීමට හැකිවන අයුරු මගේ පක්ෂය විසින් මට ලැබෙන්නට සලස්වන ලද මෙම පළමු අවස්ථාව ප්‍රයෝජනයට ගෙන මෙම කාරුණු ඔබතුමා හමුවේ තැබීමට මා සතුටුයි. මා මෙතැන ඉඳගෙන කථා කරන්නේ දේශපාලනය නොවෙයි. දේශපාලන තර්ක ඉදිරිපත් කිරීමට කලින් මිනිසා ජීවත් විය යුතුයි. අප මහන්සි ගන්නේ දිළිඳුකම තුරන් කරන්නයි. අප මහන්සි ගන්නේ, සෞභාග්‍යය ගොඩ නගන්නයි. අප මහන්සි ගන්නේ නූගත්කම හා නොදැනුම තුරන් කරන්නයි. අප මහන්සි ගන්නේ අධ්‍යාපනය දියුණු කරන්නයි. මේ අනුව බලන විට උතුරේ සිටින සියළුම පීඩිත ජනතාවන් වෙනුවෙන් මා කරන මෙම ඉල්ලීම සලකා බැලීම යුක්ති සහගත බව ඔබතුමන්ට වැටහෙනවා ඇති.

මෙම යෝජනා ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම ගැන බොහෝ දෙනෙකුට මගේ ස්තුතිය හිමිවෙනවා. එය ක්‍රියාත්මක කිරීමේදී අභ්‍යන්තර වශයෙන් මෙන්ම බාහිර වශයෙනුත්, අපට පැමිණි බාධක ගැන දිස්ත්‍රික් ඉංජිනේරු රාමනාදන් මහතාත්, පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විජේදස මහතාත් හොඳාකාර දන්නවා. මෙම මුළු යෝජනා ක්‍රමයම කඩාකප්පල් කොට දැමීමට හිතාමතාම දරන ලද ප්‍රයත්නත්, එසේ නොමැතිව දරන ලද ප්‍රයත්නත් රැසක් තිබුණා. යෝජනා ක්‍රම යන්තම් සැකිල්ලක්ව, සැලැස්මක්ව තිබුණු කාලේ එය කුමක්ද කියා මිනිසුන්ට තේරුම් ගන්නට බැරිවුනා. ආත්මෝපාකාර අත්තම් ක්‍රමයට වැඩ කරන්නට කී විට අපට ලබන්නට පුළුවන් වූ දියුණුව කණගාටුදයකයි. එම නිසා මා පළමුවතාවට ගරු අග්‍රාමාත්‍යතුමනි, ඔබතුමා හමුවී මෙහි මිනිසුන්ගේ තත්වය ගැන දැනුම් දුන්නා. එවේලෙහි ඔබතුමා ඒ ගැන දිගින් දිගට ඇසීමක් නොමැතිව, කිසිදු මැලිකමක්, පැකිලීමක් නොමැතිව සිනාමුසු මුහුණකින් යුක්තව වහාම විජේදස මහතාට කථා කොට මෙම යෝජනාක්‍රමය කෙළින්ම රජයෙන් තැනීමේ ක්‍රමයට ඇතුළත් කරන සේ නියෝග කළා. ගොඩනැගිලි තැනෙන්නට පටන් ගත්තේ ඊට පසුව පමණයි. මිනිසුන් තුළ විශ්වාසයක් ඇති වන්නට පටන් ගත්තා. නිලධාරීන්ට පුළුවන් වුනා මහජනයාගේ සහයෝගය ලබා ගන්නට. අන්තිමේදී, මෙසේ ඔබතුමන් ඉතා උණුසුම්ව පිළි ගැනීමට අවස්ථාවද යෙදෙන අයුරු යෝජනා ක්‍රමය කලට වේලාවට නිමකර ගන්නටත් අපට පුළුවන් වුනා.

ගරු අග්‍රාමාත්‍යතුමනි, මා කැමතියි පෞද්ගලිකව මගේ හෘදයංගම ස්තුතිය ඔබතුමන්ට පළ කරන්නට. එසේම මහජනතාව වෙනුවෙන් ඔබතුමාට මා මේ අවස්ථාවේ ස්තුති කරනවා මෙම නිවාස යෝජනා ක්‍රමය ගොඩ නගාදීමෙන් ඔබ අපට කරන ලද සේවය වෙනුවෙන් මා ඔබට නොමසුරුව ස්තුති නොකරතොත් මා මුළු මිනිස් සංහතියටම මහා ද්‍රෝහියකු වනවා. කුමන මට්ටමකින් හෝ ද්‍රෝහියකු වන්නට මා කැමති නැහැ. මුළු ජීවිත කාලයම අධ්‍යාපන සේවයට කැපකළ පුද්ගලයකු ලෙසට, විශේෂයෙන්ම කතෝලික පසුබිමක් තිබෙන එවන් පුද්ගලයකු ලෙසට, එසේ ඔබතුමාට ස්තුති කිරීම මගේ යුතුකමෙකැයි මා කල්පනා කරනවා. මා හින්දු භක්තික යකු වුවත්, මා අධ්‍යාපනය ලැබූ කතෝලික පරිසරයට මා බෙහෙවින් ණයගැතියි. මගේ පෞරුෂත්වයේ වර්ධනයට මෙවන කවරකුටත් වඩා උපකාර වූයේ එයයි. කතෝලික පාසැලක අධ්‍යාපනය ලැබීමෙන් ජීවිතයට ප්‍රයෝජනවත් වන බොහෝම පාඩම් මා හට ඉගෙන ගන්නට ලැබී තිබෙනවා. ඔබතුමා අධ්‍යාපනය ලබා තිබෙන්නේත් කතෝලික විද්‍යාලයක් වන කොළඹ ශාන්ත ජෝසප් විද්‍යාලයේ. ඒ අතින් බලනවිට අප දෙදෙනාටම තිබෙන්නේ සමාන අධ්‍යාපනික පසුබිමක්.

මා නැවතත් මේ අවස්ථාව ප්‍රයෝජනයට ගැනීමට සතුටුයි, ඔබතුමාටත්, ඔබතුමාගේ කරුණාවන්ත බිරිඳටත් ස්තුති කරන්නට. මෙම අවස්ථාවට සහභාගිවීමෙන් අපට ගෞරවයක් අත්කොටදී ඇති ගරු අමාත්‍යවරුන්ට හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ටත්, මා ස්තුති කරනවා. අපගේ ආදරණීය යාපනේ දිස්ත්‍රික් අමාත්‍ය විජේකෝන් මහතාටත්, අපගේ හිටපු දිස්ත්‍රික් අමාත්‍ය මා මිත්‍ර මන්සූර් මහතාටත්, මගේ විශේෂ ස්තුතිය හිමිවෙනවා. මෙරට ඉතිහාසයෙහි නොමැකෙන සළකුණක් වන රාජග්‍රාමම ආදර්ශ ගම්මානය ගොඩ නැඟීමට ඔවුන්ගෙන් ඉටුවී තිබෙන මහඟු වැඩ කොටස ගැන සියළුම නිලධාරින්ට මා ස්තුතිවන්ත වෙනවා. යෝජනා ක්‍රමයට සම්බන්ධ ඉතිරි වැඩ කටයුතුත් වර්ෂය තුළදී සම්පූර්ණ කිරීමට මේ හා සමානම උද්‍යෝගයකින් ක්‍රියාකරනු ඇතැයි මා බලාපොරොත්තු වෙනවා.




# යාපනයේ තල් නිෂ්පාදන සමුපකාර සමිති සංවිධානයේ සාමාජික ගස් මදින්නන් සඳහා වූ හදිසි අනතුරු හා විශ්‍රාමික අර්ථසාධක ක්‍රමය ඇරඹීමේ උත්සවයේදී අග්‍රාමාත්‍ය ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමා විසින් කරන ලද කථාව

1981 පෙබරවාරි 1

මෙම අවස්ථාවට සහභාගිවීමට ඔබ විසින් කරන ලද ආරාධනාව මා පිළිගත්තේ ඉතාම සන්තෝෂයෙන් බව මා පළමුවෙන්ම ප්‍රකාශ කරන්නට සතුටුයි. මා සමුපකාර ව්‍යාපාරය ඉතාම අගය කරන්නෙක් ; එමෙන්ම එයට හැකි සෑම ආධාරයක්ම දෙන්නෙක්. යාපනේ නොයෙක් තල් නිෂ්පාදන සමුපකාර සංගම් එකතුව් සමුපකාර සමිති සම්මෙලනයක් පිහිටුවා ගෙන තිබෙන බව අසා මා ඉතාම ප්‍රිතිවුනා. ඔබගේ සාමාජිකයින් සඳහා හදිසි අනතුරු ප්‍රතිලාභ ක්‍රමයක් අරඹා තිබෙන බව දැන ගන්නට ලැබුණු විට මා ඒ වාගේම ප්‍රිතිවුනා.

මේ රටේ සමුපකාර ව්‍යාපාරය ඇරඹුනේ පසුගිය ලෝක සංග්‍රාමය කාලයේ. දිවංගත ඩී. එස්. සේනානායක මහතා හා ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක මහතා මෙරට සමුපකාර ව්‍යාපාරය අරඹමින් පැවැත්වූ කථා මා එකල පාසල් සිසුවෙකු ලෙස අසාගෙන සිටියා මට මතකයි. සමුපකාර ව්‍යාපාරය අප ජනතාවගේ දියුණුවත් සමග පරිනත විනැයි කිව හැකියි. එය වූකලී ජනතාව සඳහා, ජනතාව විසින් ගෙන යන ව්‍යාපාරයක්. මා කලින් කී පරිදි එය පසුගිය යුද්ධ කාලයේ ඇරඹී අනුක්‍රමයෙන් වර්ධනය වුනා. දිවංගත පිලිප් ගුණවර්ධන මහතා මෙරට සමුපකාර ව්‍යාපාරයට විවිධ සේවා සමුපකාර ක්‍රමය එක් කළ විට වඩාත් විශාල ක්ෂේත්‍රයකට සමුපකාර ක්‍රමය විහිදී ගියා. කිසියම් සංවර්ධන කටයුත්තක මිනිසුන් විශාල සංඛ්‍යාවක් නිරතව සිටිනම්, විශේෂයෙන්ම, තනි තනිව විශාල මූල ධනයක් යෙදවීමට ඔවුනට නොහැකි තත්ත්වයක් තිබේ නම් සමුපකාර ප්‍රයත්නයට බැසීම ඉතාම උචිතයි. අවාසනාවකට මෙන් පසු ගිය රජය කාලයේ ජනතාවගේ සමුපකාර ව්‍යාපාරයේ පිරිහීමක් ඇතිවුනා. සමුපකාර ව්‍යාපාරය මහජනතාවගෙන් පැහැරගෙන රජයේ ඒකාධිකාරයක් කරනු ලැබුවා. අප දැන් එම ප්‍රතිපත්තිය අතික් පැත්ත හරවාගෙන යනවා. මහජනයා සහභාගි වනවාට අපි කැමතියි.



ආර්. ප්‍රේමදාස මැතිතුමන්
பிரதமரும்
அமைச்சரும்
1981 ஜனவரி 30

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

## යාපනයේ තල් නිෂ්පාදන සමුපකාර සමිති සංවිධානයේ සාමාජික ගස් මදින්නන් සඳහා වූ හදිසි අනතුරු හා විශ්‍රාමික අර්ථසාධක ක්‍රමය ඇරඹීමේ උත්සවයේදී ආහාර හා සමුපකාර අමාත්‍ය ගරු එස්. බී. හේරත් මැතිතුමා විසින් කරන ලද කථාව

1981 පෙබරවාරි 1

අද මෙතැන මේ සා විශාල ජනකායක් මැදට පැමිණීමට හැකිවීම ගැන මා ඉතා සන්තෝෂ වෙනවා. මට ඊයේ දැන ගන්නට ලැබුනා මෙහේ සිටින කාන්තාවන්ට දැන ගැනීමට වුවමනාවී තිබිනැයි කියා අග්‍රාමාත්‍යතුමාගේ මැතිණියත් අද මෙහි පැමිණෙනවාද යන්න. මගෙන් මේ ගැන ඇසූ අයට මා කිව්වා 'ඔව්' කියා. ප්‍රේමදාස මැතිණිය මෙම ඉල්ලීම ඉටු කිරීමට කැමැති වෙලා අද මෙහි පැමිණ සිටිනවා මේ ලස්සන කාන්තාවන් සියළුදෙනාම මුණගැසී යන්නට.

සමුපකාර අලෙවි සංගම මෙම ගස් මැදීමේ කර්මාන්තයට මෙන්ම මේ රටත් සංවර්ධනය කිරීමට එක්වී සිටීම ගැන මා සතුටුවෙනවා. 1979 වර්ෂයේදී මා ඔබ හැම හමුවූ අවස්ථාවෙහි ඔබ කීවා, ඔබට සංගමයක් පිහිටුවීමට වුවමනා බවත්, එසේම යම් යම් ප්‍රශ්නවලට විසඳුම් ලබා ගැනීමට ඔබට අවශ්‍යව තිබෙන බවත්. ආධාර ක්‍රමයක් ඇති කරන්නට වුවමනා බවත් ඔබ කීවා. එම අදහස ඔබ ක්‍රියාත්මක කොට තිබෙනු දැකීම මා හට සතුටක්. ඒ යටතේ නිකුත් කැරෙන පළමුවැනි චෙක්පත දැන් අග්‍රාමාත්‍ය තුමා අතින් නිකුත් කිරීමට සූදානම්ව තිබෙනවා. ඔබගේ ප්‍රයත්නයන්හි ප්‍රතිඵල දකින්නට මට මෙහි පැමිණීමට හැකිවීම ගැන මා බොහොම ප්‍රීති වෙනවා.

මෙම ආධාර ක්‍රමය දැන් පිහිටුවීමේ ප්‍රතිඵලය ලෙසට, කිසියම් ගස් මදින්නෙක් කිසියම් අවාසනාවන්ත හදිසි අනතුරකට මූණපැවොත් ඔහුගේ පවුලට රු. 10,000ක ආධාර මුදලක් ගෙවනු ලබනවා. මේ හේතුකොට ගෙන ගස් මදින කම්කරුවන්ට හා ඔවුන්ගේ පවුල්වලට ඇතිවන්නේ මහත් සෙතක්. ඔබගේ දුකසැප බලන ඉතා කාර්යක්ෂම සංවිධානයක් ඔබ සතුව තිබෙන බව මා සිතනවා. ඒ සමුපකාර ක්‍රමයයි. සමුපකාර ක්‍රමයට බැඳෙණ ඒ යටතේ කැරෙන කටයුතුවලට සහභාගිවන සංඛ්‍යාව එන්ට එන්ටම වැඩි වෙනවා.

ඔබ බරපතල අයබදුවලට යටවී සිටි 1978 දී, ඔබ පිරිවැටුම් බදු ක්‍රමය ඉල්ලා සිටියා. මේ රජයත් එහි අමාත්‍යවරයාත් තමයි ඔබට සහනය සැලසුවේ. ඔබ වැඩි ආදායමක් උපයන්නට පටන් ගත්තේ 1978 සිටයි. පිරිවැටුම් බදු වශයෙන් 1978 දී රුපියල් ලක්ෂ 38.3 ක් ද 1979 දී රුපියල් ලක්ෂ 47.2 ක්ද, 1980 දී රුපියල් ලක්ෂ 56 ක්ද, ඔබ විසින් ගෙවනු ලැබුවා. ඔබ සාමූහිකව දායක වෙලා තිබෙනවා රුපියල් ලක්ෂ 359ක් පමණ. මහන්සිවී වැඩ කරනවා නම් ඔබ හැම කෙනෙකුටම මසකට රු. 2,500ක් පමණම උපයාගන්නට පුළුවන්. සාමාන්‍යයෙන් ඔබට මසකට රු. 500ක් උපයන්න පුළුවන්. ඔබ අලස කමින් සිටිමින් මහන්සිවී වැඩ කිරිමට එතරම් උනන්දුවක් නොදැක්වුවත් ඔබට රු. 300ක් රු. 400ක් අතර ගණනක් උපයන්න පුළුවන්. ගස් මදින්නෝ 13,000ක් සිටිනවා. එයින් 7,500ක් දෙනාම ඔය සමිතියේ සාමාජිකයන් කියා මා විශ්වාස කරනවා. ඔබ යටතේ සේවයේ යොදවා සිටිනවා 750 දෙනෙක් පමණ. ගස් මදින හැම කම්කරු පවුලක්ම සංගමයට ගෙවන්නේ රු. 3ක පමණ සුළු වාරිකයක්. සංගමය ගෙවනවා රු. 1ක වාරිකයක්. එසේ එක්කාසුවන මුදල වර්ෂයකට රුපියල් ලක්ෂ තුනක් පමණ වෙනවා. එම මුදලින් තමයි, වන්දි මුදල් ගෙවන්නේ. මේ අනුව ඔබට ඉතා හොඳ අනාගතයක් තිබෙනවා.

මෙම ව්‍යාපාරය භාරව සිටින සහකාර සමුපකාර කොමසාරිස්වරයාටත්, ඔබගේ අනාගතය හොඳ කිරිමට ඔබ හා අත්වැල් බැඳ ක්‍රියාකරන සමුපකාර පරීක්ෂකවරුන් 19 දෙනාටත් මා ස්තුති කරන්නට ඕනෑ. මෙම සංගමය පිහිටුවීම ගැන මා සතුටුවන අතර ඔබ සමුපකාර ක්‍රමයට හැම ආධාරයක්ම දෙන්නට මා පොරොන්දු වෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමාත්, ඔබට හැම ආධාරයක්ම දෙන බවට මට සැකයක් නැහැ.

මට තවත් හුඟක් දේවල් කීමට තිබෙනවා. නමුත් යාපනේ ජනතාව හමුවීමට දිග ගමනෙක යෙදෙන්නට ගරු අග්‍රාමාත්‍යතුමාට තිබෙන බැවින් දිග කථාවක් පැවැත්වීමට මා බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙයින් මා මෙයින් නවතිනවා. බොහොම ස්තුතියි !



## යාපනයේ එළිමහන් රංගපීඨයේ පැවැත්වූ මහජන රැළිය අමතා අග්‍රාමාත්‍ය ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමන් විසින් කරන ලද කථාව

1981 පෙබරවාරි 1

මම ප්‍රථමයෙන්ම මේ යාපනය දිස්ත්‍රික්කයේ මුළු මහත් ජනතාවටම මගේ සහ මා සමග පැමිණි මැති ඇමතිවරුන්ගේ කෘතඥතාවය පිරිනමන්නට ඕනෑ, මේ දින කිහිපය තුළ තමුන්නාන්සේලා අප කෙරෙහි දක්වූ සැළකිල්ලත් තමුන්නාන්සේලා අප පිළිගත් ආකාරයත්, අපට දුන්නාවූ සහයෝගයත් සම්බන්ධයෙන්.

මෙහි ආ දවසේම මම කිව්වා, මා මෙහාට ආවෙ කථා කරන්නට නොවෙයි, අහන්නටයි, දකින්නටයි කියා. මේ දවස් කිහිපය තුළ අපේ රජය මේ දිස්ත්‍රික්කයේ කරන්නාවූ සංවර්ධන වැඩ මම දැක්කා. ඒ වාගේම මේ දිස්ත්‍රික්කයේ ජනතාවගේ හැඟීම් මට දැනගන්නට ලැබුණා. මේ අවුරුදු තුන ඇතුළතදී එක්සත් ජාතික පක්ෂයේ රජය මේ දිස්ත්‍රික්කයේ ආරම්භකර තිබෙන සංවර්ධන වැඩ ගැන ඇත්තවශයෙන්ම තමුන්නාන්සේලාට සතුටු වෙන්නට පුළුවනි.

තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු ඒ බව දන්නවා. තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරු පාර්ලිමේන්තුවේ දී ඒ ගැන කියලාත් තිබෙනවා. ඉතිහාසයේ කවරදකවත් මේ තරම් වැඩ රාශියක් මොනම ආණ්ඩුවකින්වත් යාපනයේ දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, මුළු ලංකාවේම ආරම්භ කරලා නැති බව අපේ ආණ්ඩුවට විරුද්ධ අය පවා අද පිළිගන්නවා.

තමුන්නාන්සේලාට මොහොමඩ් ඇමතිතුමා කිව්වා 1970 දී, දිවංගත ජී. ජී. පොන්නම්බලම් මැතිතුමා ප්‍රකාශ කළ අනාවැකියක්. එතුමා කළ ප්‍රකාශය මට අද වාගේ මතකයි. 1970 දී මම පළාත් පාලන ඇමති හැටියට මේ ප්‍රදේශයේ සංචාරයක යෙදුණු වෙලාවෙ අවසාන දවසේ ජී. ජී. පොන්නම් බලම් මැතිතුමා භෝජන සංග්‍රහයක් පිරිනමලා ප්‍රකාශ කළේ, මීට පස්සේ මම මෙහාට එන්නේ අග්‍රාමාත්‍යවරයා හැටියට කියලයි. මම නම් හිතුවෙ නැහැ, ඒ අනාවැකිය ඒ විදියටම ඉෂ්ටවෙයි කියා. මම එද හිතුවෙ මට ඉතාමත්ම ආදරය කළ, මා එතුමාගේ දරුවෙක් හැටියට හිතන ගුණයක් ජී. ජී. පොන්නම්බලම් මැතිතුමා තුළ තිබුණු නිසා එවැනි ප්‍රකාශයක් කළා කියායි.

ඒ වාගේම මට ආදරය කළ, මා ගැන සැළකිල්ලක් දක්වූ තවත් තමුන්නාන්සේලාගේ නායකයින් දෙපොළක් මට මේ වෙලාවේ සිහිපත් වෙනවා. දිවංගත එස්. ජේ. වී. චෙල්වනායගම් මහතාත්, දිවංගත එම්. තිරුචෙල්වම් මහතාත් ඒ දෙපොළයි. මේ නායකයින් තුන්දෙනා සමග එකට වැඩ කිරීමේ අවස්ථාව මට ලැබුණා. 1965 ත් 1970 ත් අතර ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ රජයේ, එක්සත් ජාතික පක්ෂ රජයේ, අපට පුළුවන් වුණා එකට වැඩ කරන්න.

එස්. ජේ. වී. චෙල්වනායගම් මහතාත්, එම්. තිරුචෙල්වම් මහතාත්, ජී. ජී. පොන්නම්බලම් මහතාත් මට මොන තරම් අවවාද අනුශාසනා දුන්නාද, මොන තරම් ආදරයෙන් සැළකුවාද කිව්වොත් මට ඒවා කවදාවත් අමතක නොවන බව තමුන්නාන්සේලාට ප්‍රකාශ කරන්නට කැමතියි. එනිසා මම මෙහාට පැමිණි මේ අවස්ථාවේ මට චෙල්වනායගම් මැතිතුමාගේ සමාධියටත් තිරුචෙල්වම් මැතිතුමාගේ ප්‍රතිරූපයටත් මගේ ගෞරවය පිරිනමන්නට ඉඩක් ලැබීම ගැන මම සතුටු වෙනවා. ඒ වගේම හෙට මම බලාපොරොත්තු වෙනව ජී. ජී. පොන්නම්බලම් මැතිතුමාගේ ප්‍රතිරූපයටත් මාගේ ගෞරවය පිරිනමන්න. අපි මේ නායකයින් සමග එකට වැඩ කළා. ඔවුනුත් අපත් අතර නොයෙක් කරුණු ගැන වෙනස් කල්පනාවල් තිබුණා. නමුත් මා කියන්නට කැමතියි ඒ නායකයින් තුළත්, අප තුළත් තිබුණු එකම එක පරමාර්ථය නම්, මේ ශ්‍රී ලංකා වාසී ජනතාව මීට වඩා වාසනාවන්ත තත්ත්වයකට අපි නගා සිටුවන්නට ඕනෑය කියන පරමාර්ථය බව. ඒ පරමාර්ථයේදි අපි හැමදෙනාම එකට එකතු වුණා.

ඒ නායකයෝ පැහැදිලි කර දුන්නා නොයෙක් අවස්ථා වලදී ද්‍රවිඩ භාෂාව කථා කරන ජනතාවට සිදුවෙලා තිබෙන අසාධාරණකම්. මට මතකයි 1970 දී අපි පැරදිලා 1970 සිට 1977 වෙනකම් විරුද්ධ පක්ෂයේ සිටි කාලය. ඒ කාලයේදි චෙල්වනායගම් මැතිතුමාත් සමග අපට එකට වැඩ කරන්නට අවස්ථාව ලැබුණා විරුද්ධ පක්ෂයේ. ඒ කාලයේදි තමයි අපේ වර්තමාන ජනාධිපති, ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා විරුද්ධ පක්ෂයේ නායකයා හැටියටත්, මම විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායක හැටියටත්—අපි ස්වල්ප දෙනෙක් පමණයි මන්ත්‍රීවරු—සිටියෙ.

අපි ඒ කාලයේදීම අධිෂ්ඨානයක් ඇතිකර ගත්තා, අපට යම් දවසක මේ රටේ වගකීම ලැබුණොත් අපි හැකිනාක් උත්සාහයෙන් වැඩ කර තමුන්නාන් සේලාට ද්‍රවිඩ භාෂාව කථා කරන ජන කොටස්වලට පමණක් නොවෙයි, මේ රටේ හැම ජන කොටසකටම යම් අසාධාරණයක් සිදුවී තිබෙනවා නම්, ඒවා සමථයකට පත් කිරිමට,

සහෝදර සහෝදරියනි, අද තමුන්නාන්සේලා අතරට එනවා ගිය ආණ්ඩුව කරවපු නායකයො. ගිය ආණ්ඩුවේ ඉඳගෙන නොයෙකුත් අසාධාරණ කම්, අකටයුතුකම්, මේ රටේ ජනතාවට සිද්ධ කළ, සිරිමා බණ්ඩාරනායක

මහත්මිය වැනි නායක නායිකාවන් තමුන්නාන්සේලා අතරට ඇවිත් අතීතය අමතක කරන්න අද උත්සාහ කරනවා. ඒගොල්ලන්ට තමුන්නාන්සේලා මතක් වෙන්නේ බලයේ ඉන්න කොට නොවෙයි, පැරදුණාමයි. මම කියන්ට කැමතියි අපි බලයේ හිටියත් බලයේ නොහිටියත්, අපි හැම විටම අසාධාරණයට විරුද්ධව නැගී සිටි බව.

තමුන්නාන්සේලාට මම මතක් කර දෙන්න කැමතියි 1966 ජනවාරි මාසයේ 8 වැනිදා ගැන. වෙල්ලවනායගම් මහතාත්, පොන්නම්බලම් මහතාත්, තිරුචෙල්වම් මහතාත් අපට මතක් කර දුන්නා භාෂාව සම්බන්ධයෙන් ප්‍රධාන පනත් දෙකක් තිබෙන බව. එකක් සිංහල භාෂාව පමණක් මුළු ලංකාවේම රාජ්‍ය භාෂාව විය යුතුය යන පනත. අනික දෙමළ භාෂාවට සාධාරණ තැන දීමේ පනත. ද්‍රවිඩ භාෂාවට සාධාරණ තැන දීමේ පනත යටතේ තවම රෙගුලාසි පනවලා නැති බවත් එතුමන්ලා කිව්වා. ඒ අවස්ථාවේදී එදා තිබුණ ඩඩ්ලි සේනානායක මැතිතුමාගේ රජය ඒ පනත ක්‍රියාත්මක කරවීමට රෙගුලාසි ඉදිරිපත් කළා. ඒ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ 1966 ජනවාරි 8 වැනිදායි.

අද තමුන්නාන්සේලා අතරට ඇවිත් සාධාරණකම ගැන කථාකරන සිරිමා බණ්ඩාරනායක හා ඇයගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එදා කළේ මොකක්ද ? එදා ඒ පනත ඉදිරිපත් කළේ අපේ වර්තමාන ජනාධිපතිතුමා, ශ්‍රීමත් ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා. එය ස්ථිර කරමින් කථා කළේ මා බව මා තමුන්නාන්සේලාට මතක් කරන්නට කැමතියි. ඒ අවස්ථාවේ දී තමුන්නාන්සේලා දන්නවා විශාල විරෝධයක් ඉදිරිපත් කරලා, මහා පෙළ පාලියක් පවත්වලා, හදිසි නීතිය දාන තත්ත්වයට රටේ ජනතාව කුපිත කෙරෙව්වෙ ඔය අද තමුන්නාන්සේලා අතරට ඇවිත්, අතීතය අමතක කරන්නට ලෑස්තිවෙන නායක නායිකාවන් බව.

අපේ ආණ්ඩුව පිහිටෙව්වාට පස්සෙ අපි අළුත් ආණ්ඩු ක්‍රම පනතක් හැදුවා. ඒ අවස්ථාවෙදී මේ තොණ්ඩමන් මහතා, විරුද්ධ පක්ෂයේ හිටියත්, ඒ ආණ්ඩු ක්‍රම පනත හදන විශේෂ කාරක සභාවට පත්වෙලා හිටිය. බණ්ඩාරනායක මහත්මිය ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජිතයෝත් හිටිය. තමුන්නාන්සේලා දන්නා පරිදි ආණ්ඩු ක්‍රම පනත මගින්ම අසාධාරණකම් රාශියක් නැති කරන්ට අපට හැකිවුනේ ඒ අවස්ථාවේම.

සිංහල භාෂාවටත්, ද්‍රවිඩ භාෂාවටත්, ජාතික භාෂා තත්ත්වය ලබා දුන්නෙ ඒ ආණ්ඩු ක්‍රම පනතෙන්. ඒ වාගේම අර මොහොමඩ් ඇමති තුමා කිව්වා වාගේ කලින් පැවති පලමුවැනි, දෙවැනි, තුන්වැනි, හතරවැනි ආදිය වශයෙන් පුරවැසියන් වර්ග කිරීම නැති කළෙත් ඒ ආණ්ඩු ක්‍රම පනතෙන්. එපමණක් නොවෙයි, භාෂාව අනුව වේවා, ජාතිය අනුව වේවා, ආගම, කුලය, පංතිය

අනුව වේවා, මේ රටේ පුරවැසියකුට යම් අසාධාරණයක්, අයුක්තියක් සිදු වුනොත් යාධාරණය ඉටු කර ගැනීමට, ඕනෑම පුරවැසියකුට උසාවියකට යාෆම් අයිතිය ලබා දුන්නේත් ඒ පනතෙන් බව මා තමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි.

ඒ වාගේම ජන අනුපාතය අනුව–(Proportional Representation) කියන ඒ ප්‍රතිපත්තිය අනුව—ජන සංඛ්‍යාව අනුව නියෝජිතයන් ලබා ගැනීමේ වැඩ පිළිවෙළ ප්‍රථමවරට ආණ්ඩුක්‍රම පනතට ඇතුළු කළෙත් අපේ රජය බව මා තමුන්නාන්සේලාට මතක් කරන්නට කැමතියි. මහා ජාතියය සුළු ජාතියය කියා තිබුණු වර්ග මේ අලුත් ඡන්ද ක්‍රමය නිසා සම්පූර්ණයෙන්ම නැති වෙලා ජන අනුපාතය අනුව සාධාරණ තත්වයක් ඇති වන බව තමුන්නා න්සේලා දන්නවා. එවැනි සාධාරණයක් ඉටු කර තිබෙන ආණ්ඩුක්‍රම පනතට විරුද්ධ වුණා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. තමුන්නාන්සේලා දන්නවා අපේ රටේ නියම දියුණුවක් ඇති කරන්නට පුළුවන් වෙන්නේ අපේ ගම් දනවු දියුණු කළොත් පමණක් බව. අපේ රටේ ජනතාවට පාලන තන්ත්‍රයට සම්බන්ධ වෙන්නට පුළුවන් වුණොත් පමණයි ඒ ජනතාවගේ නියම අයිතිය ආරක්ෂා වෙන්නේ. එවැනි සහභාගිත්වයක් ඇති කර ගන්නට නම් අපේ ජනතාවට වගකීමක් භාර දෙන්නට ඕනෑ, තම තමන්ගේ ප්‍රදේශවල වැඩ කටයුතුවලට සම්බන්ධ වෙන්නට.

ඒ සඳහා මුළු ලංකාවේ හැම දිස්ත්‍රික්කයකම ජනතාවගේ ඡන්දයෙන් සංවර්ධන සභා ක්‍රමයක් පිහිටුවන්නට අපි පනතක් සම්මත කර තිබෙනවා. තමුන්නාසේලාගේ මන්ත්‍රිවරුන්—දෙමළ එක්සත් විමුක්ති පෙරමුණත්—එකහෙළාම ඒ වැඩ පිළිවෙළ පිළිගත්තා. ඒ වැඩ පිළිවෙළ එක දිස්ත්‍රික්කයකට දෙකකට නොවෙයි මුළු දිස්ත්‍රික්ක විසි හතරටමයි. තමුන්-සිරිමා බණ්ඩාරනායක මහත්මියත් එයාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් මොක ක්ද කළේ? ලංකාවේ අනික් හැම ප්‍රදේශයකටම ගිහින් කියන්නට පටන් ගත්තා මේ සංවර්ධන සභා මාර්ගයෙන් එක්සත් ජාතික පක්ෂය හදන්නේ ලංකාවේ කැල්ලක් වෙන් කර දෙමළ ජනතාවට භාර දෙන්නය කියා. ජාති භේදය අවුස්සල මේ රට ගිනි තියන්න උත්සාහ කළා. අපි එයින් පස්සට ගියේ නැහැ. අපි ගිහින් ජනතාවට කරුණු තෝරා දී ඒ සංවර්ධන සභා පනත පාර්ලිමේන්තුවෙන් සම්මත කර ගත්තා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දේශපාලන වශයෙන් කරපු ද්‍රෝහිකම් කීපයක් මා ඔය තමුන්නාසේලාට මතක් කළේ. තමුන්නාන්සේලා දන්නවා ඒ ගොල්ලො මේ රට පාලනය කළ කාලයේ නියම සාමයක් නියම සංවරයක් නොතිබුණු බව. ඒ කාලෙ මොන තරම් බයෙන්ද මොනතරම් වකිතයෙන්ද මිනිසුන් ජීවත් වුණේ? සාධාරණ ලෙස නීතිය ක්‍රියාත්මක කෙරෙව්වද? පිටරටවලට යන්නට දුන්නෙ ඒ ගොල්ලන්ගෙ නෑදෑ හිත මිත්‍රයින්ට පමණයි. රටේ සෙසු අයට ඊට අවකාශයක් දුන්නේ නැහැ. යම් කෙනෙකුට පිටරටකට යන්න

සිද්ධ වුණොත් අගමැතිට යාඥා කරන්නට සිද්ධ වී තිබුණා, විරුද්ධ පක්ෂයේ නායක අමිර්තලිංගම් මහත්මයාට ඒ කාලෙ ඉන්දියාවටවත් යන්න බලපත්‍රයක් දුන්නෙ නැහැ. පිටරටකට ගිහින් රක්ෂාවක් ලබා ගන්නට පිටරටකට ගිහින් ඉගෙනගන්නට කිසිම කෙනෙකුට අවසරයක් දුන්නේ නැහැ. ඒ ගොල්ලන්ගෙ නෑදෑ මිත්‍රයන්ට පමණයි ඒ අවසරය දුන්නේ. පුළුවන් තරම් ආර්ථිකය—ආර්ථික බලය—ඒ ගොල්ලන්ගෙ අතට ගත්තා. පර්මිට් එකක් කෝටා එකක් ලයිසන් එකක් නැතිව මොනම දෙයක්වත් මෙ රටෙ කරන්නට බැරි තත්වයක් ඇති කළා නේද කියා මා තමුන්නාන්සේලා ගෙන් අහන්නට කැමතියි.

දැන් තමුන්නාන්සේලාට කල්පනා කරන්නට පුළුවනි මේ පසුගිය අවුරුදු තුන ඇතුළත ඇති වී තිබෙන නිදහස් තත්වය ගැන. අද ඕනෑම කෙනෙකුට ඕනෑම රටකට යන්නට පුළුවනි. ඕනෑම රටක රක්ෂාවක් කරන්නට පුළුවනි. ඕනෑම රටකට ගිහින් ඉගෙනගන්නට පුළුවනි. යම් කෙනෙකුට වුවමනා නම් ව්‍යාපාරයක් පටන් ගන්නට යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට අද නිදහස් ආර්ථික ක්‍රමය අනුව ඒ හැම කෙනෙකුටම ඒ සඳහා අවකාශය ලැබී තිබෙනවා. මන්ත්‍රීවරු ඇමතිවරු අගමැතිවරු පස්සෙ යන්නට ඕනැ නැහැ. තමන්ගේ උත්සාහය උනන්දුව තිබෙනවා නම් ඕනෑම එකක් කරන්නට අද නිදහස තිබෙනවා. කාර් ගැන කථා කරන්ට උවමනාවක් නැහැ. ඒ කාලයේ බයිසිකල් එකක්වත් පහසු වෙන් ලබා ගන්ට පුළුවන් තත්වයක් තිබුණාද කියා මා තමුන්නාන්සේලා ගෙන් අහන්නට කැමතියි. ඒවාගේම යම් යම් සංවර්ධන වැඩ ආරම්භ කරන විට ඒවා රටම වැළඳ ගන්නා අන්දමට ඒ ඒ ප්‍රදේශවල අවශ්‍යතාවය අනුව කළාද එහෙම නැත්නම් තමන්ගේ හිතවත්කම් අනුව කළාද කියා තමුන්නාන්සේලාට කල්පනා කරන්නට පුළුවනි. එසේ නම් අද පුළුවන් තමුන්නාන්සේ සේලාට සංසන්දනය කර බලන්නට ඒ ගොල්ලන්ගෙ පාලන කාලයත් අපේ මෙ අවුරුදු තුනක පාලන කාලයත්. ඒ ගොල්ලො මොන තරම් බලයෙන් මත් වුණාද කියා තමුන්නාන්සේලාට විස්තර කරන්නට ඕනැද? ඒ නිසා ඒ ගොල්ලො කොයි තරම් ජනතාවගෙන් ඈත් වී සිටියාද කිව්වොත් සාමාන්‍ය උදවියට කිට්ටු වෙන්නටවත් පුළුවන්කමක් තිබුණාද කියා මා තමුන්නාන්සේලාගෙන් අහන්නට කැමතියි.

අද මොකක්ද තිබෙන වෙනස? ජනාධිපතිතුමාගේ සිට අපේ මැති ඇමතිවරු සියලු දෙනාම අද ඔවුන්ගේ වැඩි කාලය ගත කරන්නේ පොදු ජනතාව අතරයි. අපි කල්පනා කරන්නේ නැහැ, "මෙ පළාත අපේ පළාතක්, අර පළාත අපට අයිති නැති පළාතක්, මෙ පළාතෙ ඉන්නෙ සිංහල උදවිය, අර පළාතෙ ඉන්නෙ ද්‍රවිඩ උදවිය, ඊළඟ පළාතෙ ඉන්නෙ මුස්ලිම් උදවිය" ආදී වශයෙන්. මොන භාෂාවක් කථා කළත් මොන ආගමක් ඇදහුවත් මොන ජාතියකට අයිති වුණත් මුළු රටම අපේ රට හැටියට සළකා මේ ඔක්කම ශ්‍රී ලංකා වාසීන්ය කියා සලකා නේද

මෙ රජය ක්‍රියා කරන්නේ? ඒ පාලන කාලය තුළදී නීතිය ක්‍රියාත්මක වුණොත් ඒ අයට එක විධියකට. අනිත් අයට වෙන විධියකට. දැන් තමුන්නාන්සේලාට පුළුවනි මේ පාලන දෙකේ වෙනස හොඳ හැටි තේරුම් ගන්නට. 1977 න් පසු මේ රටේ ඇති වී තිබෙන සමගිය සාමය සංවරය ඉදිරියට ගෙන යනවාද එහෙම නැත්නම් අපි ආපසු පස්සට යනවාද කියා අද තමුන්නාන්සේලාට තීරණය කරන්නට පුළුවනි. තමුන්නාන්සේලා දන්නවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ පාලන කාලය යටතේදී ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ ගෝල්ෆේස් පිටියේදී සත්‍යාග්‍රහයක් කරන්ට ගිය බව. ඒ අවස්ථාවේ මොන විධියේ සංග්‍රහ ලැබුණාද කියා මා තමුන්නාන්සේලාට මතක් කරන්නට වුවමනාවක් නැහැ.

මේ ළඟදී කලවාපේ අතුරු මැතිවරණයක් තිබුණ. විරුද්ධ පක්ෂයේ නායක ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ අමිර්තලිංගම් මහත්මයාටත් එම. සිවසිත්තම්පරම් මහත්මයාටත් කලවානට ගිහින්— සියයට සියයක්ම සිංහල ප්‍රදේශයකට ගිහින්—ඒ පළාතේ කථා කර ඡන්දය දෙන හැටි කියා දී බොහොම සාමකාමීව ආපසු පැමිණෙන්නට තරම් වාතාවරණයක් අද ඇති වී තිබෙනවා. මා අසනවා සිරිමා බන්ඩාරණායකගේ පාලන කාලය තුළ එවැනි ගමනක් යන්නට එතුමන්ලාට අවකාශයක් දෙයිද කියා. ඒ ගොල්ලන්ගෙ පාලන කාලයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරු— ෆෙඩරල් පක්ෂයෙ මන්ත්‍රීවරු—නිවාස අඩස්සියේ තැබූ බව තමුන්නාන්සේලා දන්නවා. සම්පූර්ණ ඒකාධිපති පාලනයක් තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ රටේ ගෙන ගියේ. එවැනි දරුණු තත්වයක් අද තිබෙනවාද?

අද කෙනෙකුට ඕනෑම දේශපාලන මතයක් අදහන්නට පුළුවනි. ඕනෑම දේශපාලන සංවිධානයක් ඇති කර ගන්නට පුළුවනි. රටේ මූලික සාමයට සංවරයට අවහිරයක් නොවන විධියට, හිංසාවෙන් තොරව, සාධාරණ ලෙස අවිහිංසාවාදීව ඕනෑම වැඩ පිළිවෙළක් ගෙන යන්නට අද අවකාශය තිබෙනවා. ඒ නිසා සහෝදර සහෝදරියනි, මම මේ තත්වය තමුන්නාන්සේලා ඉදිරියේ තැබුවේ සමහර උදවිය අතීතය අමතක කරවන්නට උත්සාහ කරන නිසයි. ඒවාගේම සමහර උදවියට ඒ කටුක අතීතය අමතක වී තිබෙන බව පෙනෙන නිසයි. නමුත් මේ රටේ පොදු ජනතාවට ඒවා අමතක වී නැති බව මම දන්නවා.

මට මේ දින තුන හතරේදී පැහැදිලි වුණා මොන තරම් හිතවත් භාවයක් අප කෙරෙහි තමුන්නාන්සේලා තුළ තිබෙනවාද කියා. ගිය ගිය හැම ප්‍රදේශයකම ජනතාව සිනහමුසු මුහුණින් ඉතා හිතවත්ව අප පිළිගත් බව මා ස්තූතිපූර්වකව සඳහන් කරන්නට කැමතියි. සමහර උදවිය කියනවා '' ද්‍රවිඩ ජනතාව ගැන තමුන්නාන්සේලා මොකුත් බලන්න එපා, මොකුත් සොයන්න එපා '' කියල. නමුත් ඒ උදවියට මම කියනවා අපි අපේ නෑදෑයින් මිත්‍රයින් බලා හඳ ගැනීම නොකඩවාම කරගෙන යන බව. අපි ලංකාව පුරාම මේ විධියට තමයි වැඩ කරගෙන යන්නේ. අපි එක පළාතක්

වත් අත්හරින්නේ නැහැ. එක ජන කොටසක්වත් අත්හරින්නේ නැහැ. අපට මෙ තත්ත්වය — මෙ වරම — දුන් ජනතාව අපි කවදාවත් අමතක කරන්නේ නැහැ. අප සේවයෙහි යෙදෙන විට මෙ අපට ඡන්දය දුන් උදවියද මෙ අපට ඡන්දය නොදුන් උදවියද කියල අපි කල්පනා කරන්නෙ නැහැ. අපේ සේවය මනුෂ්‍යත්වය අනුව බව මා මතක් කරන්නට කැමතියි. ඒ නිසා සහෝදර සහෝදරියනි, අපි අද එකට අත්වැල් බැඳගෙන එක්සිත්ව මෙ යන ගමන ඉදිරියටම යමු.

භාෂාව අවශ්‍ය වෙන්නේ අපේ ඕනෑ එපාකම ඉෂ්ට කර ගන්නට. භාෂාවය කියන්නේ මිනිසුන් බෙදන වෙන් කරන අවියකට නොවෙයි. භාෂාවය කියන්නේ මිනිසුන් එක් කරන එක්සත් කරන මාධ්‍යයකටයි. ආගම ධර්මයත් එහෙමයි. ඒක මිනිසුන් බෙදා වෙන් කරන වැඩ පිළිවෙළක් නොවෙයි. මිනිසුන් එක්සත් කරන වැඩ පිළිවෙළක්. අන්න ඒ විධියට කල්පනා කර අපි සියලු දෙනාම වැඩ කළොත් මෙ ශ්‍රී ලංකාව සෞභාග්‍ය සම්පන්න රටක් බවට පත් කර ගන්නට පුළුවනි. ලංකාව පුරාම ජිවත්වන ජනතාව කෙරෙහි අපේ ලොකු විශ්වාසයක් තිබෙනවා. ඒ ජනතාවට අවශ්‍ය වාරිමාර්ග, ඒ ජනතාවට අවශ්‍ය පාරවල්, ඒ ජනතාවට අවශ්‍ය ජලය, ඒ ජනතාවට අවශ්‍ය විදුලි බලය ලබා දුන්නොත් ඒ ජනතාව මහන්සි වී වැඩ කර මෙ රට දියුණු කරන බව අපට ඒකාන්තයෙන්ම විශ්වාසයි.

අපි දන්නවා තමුන්නාන්සේලා මෙ රටේ ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමට මොන තරම් වෙහෙස මහන්සියෙන් වැඩ කරනවාද කියා. තමුන්නාන්සේලා ඒවාගේම දන්නවා අපේ රටේ සිටින පාරිභෝගිකයන් හැම දෙනාටම අවශ්‍ය දේවල් අවශ්‍ය ආහාර ද්‍රව්‍ය සම්පූර්ණයෙන්ම මෙ රටේම නිෂ්පාදනය කරන්නට අප තවම සමත් වී නැති බව. ආහාර ද්‍රව්‍ය අතින් ගිහයක් ඇති නොවීම පිණිසයි අපි පිටරටින් සමහර ආහාර ද්‍රව්‍ය ගෙන්වන්නේ. නමුත් අපේ නිෂ්පාදනවලට නියම මිලක් නොලැබෙන අන්දමට ඒ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන්නට අපේ බලාපොරොත්තුවක් නැහැ. නිෂ්පාදනය අනුව පිටරට වලින් ගෙන්වන දේවල් අඩු කිරීම අපේ රජයේ ප්‍රතිපත්තියයි. අපි වැඩ පිළිවෙලක් සකස් කරගෙන යනවා තමුන්නාන්සේලාගේ නිෂ්පාදන වලට නියම මිලක් ලබා දෙන්නට.

සහෝදර සහෝදරියනි, මෙ අවස්ථාවේදී තමුන්නාන්සේලා හැම දෙනාටම අපේ ගෞරවය පිරිනමමින් මෙම සංචාරය සාර්ථක කරන්නට මහන්සි වී උදව් උපකාර කළ තමුන්නාන්සේලා බොහොම හිතවත් භාවයෙන් අප කෙරෙහි දක් වූ සැළකිල්ල ගැන යළිත් අපේ ගෞරවය පිරිනමමින් මගේ සංචාරය නිසා අලුත් වැඩ පිළිවෙලවල් රාශියක් ආරම්භ වන බව පමණක් නොවෙයි තිබෙන අඩුපාඩුකම් සම්පූර්ණ කරන්නටත් අවස්ථාවක් සැළසෙන බව තමුන්නාන්සේලාට මතක් කරමින් ලබන්නා වූ කාලය, තමුන්නාන්සේලාට සෞභාග්‍ය සම්පන්න එකක් වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව මෙයින් සමාප්ත කරනවා.

# යාපනය දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති

මෙම රජය බලයට පැමිණීමෙන් පසු පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය විසින් යාපනය දිස්ත්‍රික්කයේ, නිවාස යෝජනා ක්‍රම, ජල සම්පාදන යෝජනා ක්‍රම හා වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම් යෝජනා ක්‍රම ගණනාවක්ම අරඹන ලදී. 1977 ජූලි මාසයෙන් මෙපිට අරඹා නිමවන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දැක්වේ:

(අ) **නිවාස යෝජනා ක්‍රම :**

| | | |
|---|---|---|
| 1. | නාවක්කුලි නිවාස යෝජනා ක්‍රමය, I වන හා II වන අදියරවල් | නිවාස ඒකක 298 |
| 2. | ගුරුනගර් නිවාස යෝජනා ක්‍රමය, I වන හා II වන අදියරවල් | නිවාස ඒකක 280 |
| 3. | ඡන්ද කොට්ඨාශ පදනමින් අරඹන ලද යෝජනා ක්‍රම | නිවාස ඒකක 385 |
| 4. | පොම්මාවෙලි අත්තම නිවාස යෝජනා ක්‍රමය | නිවාස ඒකක 32 |
| 5. | තෝපාකඩු අත්තම නිවාස යෝජනා ක්‍රමය | නිවාස ඒකක 45 |
| 6. | රාජග්‍රාමම් ආදර්ශ ගම්මානය | නිවාස ඒකක 85 |

(ආ) **ජල සම්පාදන යෝජනා ක්‍රම :**

වඩුක්කොඩ්ඩායි ජල සම්පාදන යෝජනා ක්‍රමය

වේලනායි ජල සම්පාදන යෝජනා ක්‍රමය

වාතරවත්තෙයි ජල සම්පාදන යෝජනා ක්‍රමය

කම්පොල ජල සම්පාදන යෝජනා ක්‍රමය

අරලි දකුණ ජල සම්පාදන යෝජනා ක්‍රමය

අරලි උතුර ජල සම්පාදන යෝජනා ක්‍රමය

කම්පොල භූතල ජලවහන යෝජනා ක්‍රමය

(ඇ) **වෙනත් යෝජනා ක්‍රම :**

ධීවර වරාය, මිලිඩ්ඩි

වඩුකාර්මික යෝජනා ක්‍රමය, අච්චුවේලි

කන්නපුරම් පැල්පත්වාසීන් අන් ස්ථානවල පදිංචි කරවීමේ යෝජනා ක්‍රමය

තැපැල් කාර්යාලය හා තැපැල් ස්ථානාධිපති නිල නිවාසය තැනීම, චූල්ලිපුරම්

යාපනේ රෝහලේ කසල ශෝධන ක්‍රමය—II වන හා III වන අදියරවල්

ආයුර්වේද රෝහල, යාපනය

සහකාර වෛද්‍ය වෘත්තික නිල නිවාසය, වේලනායි

සිද්ධ විද්‍යාලය, යාපනය

පාලන කුළුන, යාපනය ගුවන් තොටුපල

පුනර්යෝජන මධ්‍යස්ථානය, කිලිනොච්චි

ස්වභාවික විද්‍යා අංශ ගොඩනැගිල්ල, යාපනය

කාර්යභාර නිලධාරි නිල නිවාසය, පේදුරුතුඩුව

අවිවාහක භටයින්ගේ බැරැක්ක—28, පේදුරුතුඩුව

උප දිසාපති කාර්යාලය, පළාලි

කලා අංශ ගොඩනැගිල්ල, යාපනය මණ්ඩපය

අවිවාහකයින්ගේ බැරැක්ක, කරෙයිනගර්

විවාහකයින්ගේ බැරැක්ක, කරෙයිනගර්

වෛද්‍ය නිලධාරි නිල නිවාස, අනලයිතිව් නගරය

දන්ත චිකිත්සාගාරය, පුන්කොඩතිව්

තානායම, කයිට්ස්

කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානය, තිරිනෙල්වේලි

කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයේ ස්ථාල, තිරිනෙල්වේලි

කීරමලෙයි ළිං ප්‍රතිසංස්කරණය

මහේස්ත්‍රාත්වරුන් සඳහා වූ පස්වන ශ්‍රේණි නිල නිවාස හතරක්

රජයේ නිලධාරීන් සඳහා වූ 3ඒ ශ්‍රේණියේ නිල නිවාස 6ක්

අධිකරණ අමාත්‍යාංශයට 5 වන ශ්‍රේණි නිල නිවාස 3ක්

රාජ්‍ය නිලධාරීන් සඳහා නිල නිවාස 6ක්

ස්වයංක්‍රිය විදුලි සංදේශ හුවමාරු ස්ථානය, කිලිනොච්චි

පලාලිහි තාපි ගොඩනැගිලි

2. යාපනය දිස්ත්‍රික්කයේ පහත සඳහා යෝජනා ක්‍රමවල වැඩ කටයුතු දැන් කරගෙන යනු ලැබේ.

(1) **නිවාස යෝජනා ක්‍රම :**

| | |
|---|---|
| තාරකුලම් | නිවාස ඒකක 39 |
| කන්නපුරම් | නිවාස ඒකක 75 |
| රාජ්‍ය නිලධාරි නිල නිවාස | නිවාස ඒකක 99 |
| ඡන්ද කොට්ඨාශ පදනමින් ඉදිකැරෙන නිවාස | නිවාස ඒකක 330 |

නිවාස ඒකක 441 කින් යුක්ත අත්තම් නිවාස යෝජනා ක්‍රම 11ක් ක්‍රියාත්මක කිරීම දැන් නොයෙක් අවධිවල පවතී. තවත් අත්තම් නිවාස යෝජනා ක්‍රම 11ක් සැලසුම් කිරීමේ අවධියේ පවතී.

(2) **ජල සම්පාදන යෝජනා ක්‍රම :**

(i) යාපනේ ජල සැපයුම වැඩිකිරීම

(ii) කිලිනොච්චි ජල සම්පාදන යෝජනා ක්‍රමය

(iii) චුන්නාකම් ජල සම්පාදන යෝජනා ක්‍රමය

(iv) වැල්වෙට්ටිතුරෙයි ජල සම්පාදන යෝජනා ක්‍රමය

(v) කලඩ්ඩි ජල සම්පාදන යෝජනා ක්‍රමය

ඇමෙරිකා එක්සත් ජනපද ආධාර ලැබෙන ජල යෝජනා ක්‍රම 3ක් 1981 අගෝස්තු මාසයේදී ආරම්භ කිරීම සඳහා තෝරාගෙන තිබේ. එම යෝජනා ක්‍රම තුන මෙසේය :

(i) යාපනේ අර්ධ ද්වීපයේ ජල සම්පත් සංවර්ධනය හා කළමණාකරණය සඳහා ප්‍රධාන සැලැස්මක් සැකසීම පිළිබඳ අධ්‍යයනයක් කිරීම

(ii) පේදුරුතුඩුවේ ජල සම්පාදන යෝජනා ක්‍රමය

(iii) චාවාකච්චේරි ජල සම්පාදන යෝජනා ක්‍රමය

(3) **වෙනත් යෝජනා ක්‍රම :**

පොලිස් ස්ථානය, යාපනය

මහේස්ත්‍රාත් උසාවිය, කිලිනොච්චිය

කසළ ශෝධන ක්‍රමය හා විෂ බීජ නාශක යන්ත්‍රාගාරය, මහ රෝහල පේදුරුතුඩුව

මහේස්ත්‍රාත් බංගලාව, පේදුරුතුඩුව

විදුලි සංදේශ දෙපාර්තමේන්තුවේ ඕ.සී.ඩී.ඩී.එස්. ව්‍යාපෘතිය

90 දෙනෙකු සඳහා වූ නේවාසිකාගාරයක්—යාපනේ අවිවාහක නිලධාරි නිවාස

දෙමහල් කට්ටු නිවාස, තාරපුරම්

අඩුවියදම් නිවාස, ගුරුනගර්

චුල්ලිපුරම් වෙළඳ හල

භූතල ජලාපවහනය, තිරුනෙල්වෙලි

කසල විෂබීජ නාශක යන්ත්‍රාගාරය, මූලික රෝහල, පේදුරුතුඩුව

මහාධිකරණය සහ දිසා අධිකරණය, යාපනය

3. පහත සඳහන් කටයුතු සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවලට රු. දශ ලක්ෂ 4.8ක මුදලක් වෙන් කොට දී තිබේ.—

මුඩුක්කු ඉවත් කිරීම, ක්‍රීඩා භූමි, සුසාන භූමි, වෙළඳහල් ළිං සහ ජල සම්පාදන යෝජනා ක්‍රම, මහා මාර්ග, බෝක්කු, පාලම් සහ ගොඩනැගිලි

4. පොදු පහසුකම් මණ්ඩලය මගින් පොම්මවෙලි නිවාස යෝජනා ක්‍රමයට ජල මුද්‍රිත වැසිකිලි පොදු පහසුකම් සලසා දී තිබේ.

5. 1977 ජූලි මාසයෙන් මෙපිට ඉහත සඳහන් යෝජනා ක්‍රම සඳහා මෙම අමාත්‍යාංශය විසින් කරන ලද වියදම රු. දශ ලක්ෂ 100කට අධිකය.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

පිටකවරය : සෝමසිරි හේරත්

වාර්තාකලේ : ජේ. ගුණදස
ජේ. ජේ. ප්‍රනාන්දු

පරිවර්තන : එම්. කේ. ධර්මදස
එම්. කේ. රාහුලන්

ඡායාරූප : එස්. චිත්‍රානන්ද
ගුණසිරි සිල්වා

ප්‍රකාශනය : පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

මුද්‍රණය : රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව